# බලශක්තිය තුළින් ජාතිය බලගැන්වීම

CEYLON PETROLEUM STORAGE TERMINALS LIMITED



## ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

# වාර්ෂික වාර්තාව - 2024

# වාර්ෂික වාර්තාව
# 2024

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම





# අන්තර්ගතය

| | |
|---|---|
| **ආයතනික විශ්ලේෂණය** | |
| ආයතනික තොරතුරු | 7 |
| දැක්ම සහ මෙහෙවර | 8 |
| අප ගැන | 9 - 10 |
| කාර්ය සාධන විශේෂතා | 11 |
| වසර දෙස බැල්මක් | 12 - 13 |
| සම්මාන සහ ඇගයුම් | 14 |
| **අපගේ නායකත්වය** | |
| සභාපතිතුමාගේ පණිවිඩය | 16 - 17 |
| කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය | 18 - 19 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 20 - 24 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 26 - 29 |
| **කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය** | |
| මෙහෙයුම් පරිසරය | 32 - 36 |
| මූල්‍ය ප්‍රාග්ධනය | 37 - 39 |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | 40 - 44 |
| මානව ප්‍රාග්ධනය | 45 - 50 |
| **පාලනය සහ අනුකූලතාව** | |
| ආයතනික පාලනය | 52 - 62 |
| අවදානම් කළමනාකරණය | 63 - 70 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 71 - 73 |
| විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව | 74 - 76 |
| **මූල්‍ය ප්‍රකාශන** | |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 78 - 85 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 86 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 87 |
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 88 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 89 |
| මූල්‍ය ප්‍රකාශනවලට සටහන් | 90 - 112 |
| සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය | 113 - 114 |
| පස් අවුරුදු මූල්‍ය සාරාංශය | 115 |

# ආයතනික තොරතුරු

**ආයතනයේ නම**
ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

**නෛතික ස්වභාවය:**
1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය සමඟ කියවිය යුතු 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) වන ඡේදය යටතේ සංස්ථාපිත සහ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත.

**ලියාපදිංචි කාර්යාලය:**
නිමාව, කොලොන්නාව, වැල්ලම්පිටිය, ශ්‍රී ලංකාව.

**දුරකථන:** +94 11 2694482 | +94 11 2691643 | +94 11 2532122 | +94 11 2572307
**ෆැක්ස්:** +94 11 2547827
**විද්‍යුත් තැපෑල:** secretariat@cpstl.lk
**වෙබ් අඩවිය:** www.cpstl.lk

**බදු ගෙවීම් හඳුනාගැනීමේ අංකය:** 134011157

**මූල්‍ය වර්ෂය:** ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

---

**සභාපති**
ඩී.ජේ.ඒ.එස්. ද එස්. රාජකරුණා මහතා

**කළමනාකාර අධ්‍යක්ෂ**
ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ මහතා

**අධ්‍යක්ෂවරු**
ඩබ්.එස්. හේමන්ත කුමාර මහතා
ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා
දීපක් දාස් මහතා
අවිනාශ් සිංහාල් මහතා
සුනිල් කාන්ත මහාරණ මහතා
එච්.ටී.පී. චන්දන මහතා

**මව් සමාගම**
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

**ලේකම්වරු**
ඩිලොයිට් කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම
නො. 100, බ්‍රේබෲක් පෙදෙස,
කොළඹ 02.

**විගණකවරු**
රජයේ විගණකාධිපති

**බැංකුකරුවන්**
මහජන බැංකුව, ලංකා බැංකුව

## දැක්ම

ලෝකයේ වඩාත් කාර්යක්ෂම ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත ක්‍රියාකරු බවට පත්වීම.

## මෙහෙවර

CPSTL ආයතනය ඛනිජතෙල් නිෂ්පාදන සඳහා ආරක්ෂාව, විශ්වාසනීයත්වය සහ කාර්යක්ෂමතාව කෙරෙහි අවධානය යොමු කරමින් සුවිශේෂී ගබඩා විසඳුම් ලබා දීමට කැපවී සිටියි. අපි සියලුම ඇල්මැති පාර්ශවයන්ට මූල්‍ය ස්ථාවරත්වය සහතික කරමින් ජාත්‍යන්තර තත්ත්වයේ තොරතුරු පද්ධති සපයන අතර සෞඛ්‍යය, පාරිසරික සහ ප්‍රවේසම් ප්‍රමිතීන් දැඩි ලෙස පිළිපදිමු. අති නවීන තාක්ෂණයන් අඛණ්ඩව අනුගමනය කරමින්, අපගේ සියලු මෙහෙයුම් වලදී නවෝත්පාදනය, නායකත්වය සහ කාර්යක්ෂමතාවය අපි පවත්වා ගන්නෙමු. අපගේ සාර්ථකත්වය මෙහෙයවනු ලබන්නේ සේවයට කැපවූ ඉහළ පුහුණුවක් සහිත, වෘත්තීමය හා අවංක ශ්‍රම බලකායක් මගිනි.

# අප ගැන

## ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL)

CPSTL අප ඉන්ධන ප්‍රවාහන සැපයුම්කරුවෙකු පමණක් නොව ශ්‍රී ලංකා ආර්ථිකය ඉදිරිය කරා රැගෙන යන සාර්ථක සහ සම්බන්ධීකරණ කාර්යයන් පවත්වාගෙන යන නිහඬ බලවේගයකි. අපි දෛනිකව දිවයින පුරා කාර්යක්ෂමව, ආරක්ෂිතව ඛනිජතෙල් නිෂ්පාදන බෙදාහරින අතර, බලශක්තිය ගෘහස්ත, ගමනාගමන පද්ධති, කර්මාන්ත, ගුවන් තොටුපළ සහ විදුලිබලාගාර වෙත නිසිකලට නිසිපරිදි සපයන බවට සහතික වෙමු.

ප්‍රධාන ඉන්ධන බෙදාහැරීමේ ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස දේශීය සහ ඇල්මැති බලශක්ති පාර්ශවයන් වෙනුවෙන් ඉන්ධන ලබා ගැනීම, ගබඩා කිරීම, කළමනාකරණය සහ බෙදා හැරීමේ සම්පූර්ණ වගකීම අප භාරගෙන ඇත. අපගේ උසස් මට්ටමේ යටිතල පහසුකම් සහ ගැඹුරු අත්දැකීම් සමඟ එක්වී, ශ්‍රී ලංකා බලශක්ති පද්ධතියේ විශ්වාසනීය හවුල්කරුවෙක් බවට අප පත්වී ඇත.

දශක ගණනාවක උරුමය, කුසලතාපූර්ණ ශ්‍රම බලකාය සහ නවෝත්පාදනයන් සඳහා වූ කැපවීම CPSTL ආයතනය ජනතාව, ස්ථාන සහ ප්‍රගතිය සම්බන්ධ කරන අතර එය ඉන්ධන බෙදාහැරීම පමණක් නොව, දියුණුවේ බලය, ගොඩනැඟීම සහ පරිවර්තනයයි.

## අප කුමක් කරන්නේද?

- **ප්‍රධාන පර්යන්ත 02කි** - කොලොන්නාව සහ මුතුරාජවෙල - විවිධ වූ ඉන්ධන වර්ග කළමනාකරණය
- **තොග ගබඩා 11** - දිවයින පුරා ආවරණය වන අතර ප්‍රාදේශීය තොග ගබඩා කිරීමේ හැකියාව
- **බහු නිෂ්පාදන කළමනාකරණය** - පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ ගුවන්යානා තෙල් ඇතුළු ඉන්ධන වර්ග 16ක් ගබඩා කිරීම සහ කළමනාකරණය
- **ගුවන්යානා ඉන්ධන සැපයීම** - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අවශ්‍ය ගුවන්යානා ඉන්ධන කාර්යක්ෂමව සැපයීම
- **විදුලිබලාගාර සඳහා ඉන්ධන සැපයීම** - විශේෂිත නල පද්ධති මඟින් තාප විදුලිබලාගාර වෙත අඩු සාන්ද්‍ර දැවිතෙල් සැපයීම
- **තොග සහ සිල්ලර බෙදාහැරීම** - සියලුම අංශ ආවරණය කරමින්, ඉන්ධන පිරවුම්හල් 1000කට අධික සංඛ්‍යාවකට, ප්‍රධාන කර්මාන්තයන්ට සහ මහා පරිමාණ පාරිභෝගිකයන්ට සේවය සැපයීම

CPC සහ LIOC යන සමාගම් සහ ජාත්‍යන්තර ඉන්ධන සමාගම් සමඟ සහයෝගීතාවයෙන් ක්‍රියා කරමින් CPSTL ආයතනය ශ්‍රී ලංකාවේ බලශක්ති සැපයුම් දාමයේ මූලික කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරයි.

## අපගේ මෙහෙයුම් පරාසය

### ප්‍රධාන පර්යන්ත

- කොලොන්නාව නිමාව (නාගරික පර්යන්තය, බහු නිෂ්පාදන)
- මුතුරාජවෙල පර්යන්තය (වෙරළ ආශ්‍රිත අධි ධාරිතා සැපයුම්)

### තොග ගබඩා

අනුරාධපුර, මඩකලපුව, බදුල්ල, කොටගල, ගාල්ල, මාතර, කුරුණෑගල, පේරාදෙණිය, හපුතලේ, සරසවි උයන, කන්කසන්තුරෙයි.

මෙම ජාලය අපට ජාතික අවශ්‍යතා වෙත කාලෝචිත සහ සෘජු ප්‍රතිචාර දැක්වීමටත්, සියළු පළාත් සඳහා කාර්යක්ෂමව සැපයුම් ලබා දීමටත් අවකාශ සලසයි.

## අපගේ විශ්වාසය

### ප්‍රමුඛව ආරක්ෂාව සහ තිරසාරත්වය

අප උසස්ම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කරන අතර මහජනතාවගේ ආරක්ෂාව, දේපළ ආරක්ෂාව සහ පාරිසරික සුරක්ෂිතතාවය තහවුරු කරයි.

### ශ්‍රම බලකාය බලගැන්වීම

අපගේ ශක්තිය බෙදාහැරීම්, මෙහෙයුම්, ඉංජිනේරු සහ කළමනාකරණ ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි දක්ෂතාවය ඇති කැපවූ වෘත්තිකයන් 2100+කට ආසන්න කණ්ඩායමකින් සමන්විත වන අතර එය නිරතුරු අප සාර්ථකත්වය කරා මෙහෙයවන බලවේගය වේ.

### පරිසර හිතකාමී පරිසරයකට කැපවීම

පරිසර හානි අවම කරමින් සහ පරිසර සුරක්ෂිතතාවය වර්ධනය කරමින් පිරිසිදු සහ ස්ථායී අනාගතයක් ගොඩනැගීම සඳහා අපි කැපවී සිටිමු. ඒ උදෙසා වගකීම් සහගත ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම, නවීන තාක්ෂණය වෙත ආයෝජනය සහ ප්‍රජා යහපැවැත්ම දියුණු කිරීමට අඛණ්ඩව ක්‍රියා කරමු.

# අපගේ ජාලය



පර්යන්තය
තොග ගබඩාව
කන්කසන්තුරෙයි
අනුරාධපුර
මඩකලපුව
කුරුණෑගල
මුතුරාජවෙල
කොලොන්නාව
සරසවි උයන
පේරාදෙණිය
කොටගල
බදුල්ල
හපුතලේ
ගාල්ල
මාතර

# කාර්ය සාධන විශේෂතා

| | | | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතා: මූල්‍ය වර්ධනය** | | | | | | | |
| | ආදායම | රු. මි | 18,899 | 10,150 | 9,433 | 14,276 | 13,568 | 15,340 |
| | මෙහෙයුම් ලාභය | රු. මි | 4,664 | (621) | (989) | 1,377 | 1,906 | 1,966 |
| | බදු පෙර ලාභය/(අලාභය) | රු. මි | 4,998 | (314) | (704) | 1,578 | 2,215 | 2,289 |
| | බදු පසු ලාභය/(අලාභය) | රු. මි | 3,381 | 37 | (1,059) | 1,169 | 2,001 | 1,305 |
| | හිමිකම් මත ප්‍රතිලාභ | % | 7% | 0.1% | -4% | 4% | 7% | 5% |
| | **මූල්‍ය ස්ථාවරත්වය** | | | | | | | |
| | මුළු වත්කම් | රු. මි | 61,285 | 32,228 | 33,481 | 33,999 | 32,588 | 31,522 |
| | මුළු වගකීම් | රු. මි | 14,436 | 5,747 | 6,252 | 5,999 | 5,369 | 5,773 |
| | කොටස් හිමියන්ගේ අරමුදල් | රු. මි | 46,849 | 26,481 | 27,229 | 28,000 | 27,218 | 25,749 |
| | මුදල් සහ මුදල් සමාන දෑ | රු. මි | 4,329 | 1,113 | 2,006 | 2,257 | 3,442 | 3,999 |
| | **කොටස් හිමියන්ගේ තොරතුරු** | | | | | | | |
| | කොටසක ඉපයීම | රු. | 4.51 | 0.05 | (1.41) | 1.56 | 2.67 | 1.74 |
| | කොටසකට ලාභාංශය (ගෙවූ) | රු. | - | 0.48 | - | - | 0.48 | 0.30 |
| | කොටසක ශුද්ධ වත්කම | රු. | 63 | 35 | 36 | 37 | 36 | 34 |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතා: මෙහෙයුම් විශිෂ්ඨත්වය** | | | | | | | |
| | **දේපල, පිරියත සහ උපකරණ** | | | | | | | |
| | පර්යන්ත සහ තොග ගබඩා | ගණන | 13 | 13 | 13 | 13 | 13 | 13 |
| | ප්‍රාග්ධන වියදම් | රු. මි | 1,298 | 157 | 925 | 1,358 | 1,085 | 981 |
| මානව ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතා: සේවකයින් තුළ ආයෝජනය** | | | | | | | |
| | මුළු සේවක සංඛ්‍යාව | ගණන | 2,225 | 2,299 | 2,474 | 2,629 | 2,766 | 2,856 |
| | කාන්තා නියෝජනය | ගණන | 297 | 288 | 308 | 343 | 321 | 326 |
| | සේවක ගෙවීම් | රු. මි | 6,348 | 6,361 | 6,745 | 6,908 | 5,918 | 6,636 |
| | සේවක ඉවත්වීම් අනුපාතය | % | 7% | 7% | 6% | 6% | 4% | 5% |
| | පුහුණුවීම් සඳහා ආයෝජන | රු. මි | 6 | 4 | 2 | 3 | 4 | 17 |
| | මුළු පුහුණුවීම් පැය | පැය | 5,680 | 4,863 | 5,006 | 3,806 | 6,245 | 9,706 |
| | සාමාන්‍ය පුහුණුවීම් පැය/සේවක | පැය | 8 | 5 | 8 | 4 | 6 | 5 |
| | සේවකයෙකුට ආදායම | රු. මි | 8.49 | 4.41 | 3.81 | 5.43 | 4.91 | 5.37 |
| | සේවකයෙකුට ශුද්ධ ලාභය (අලාභය) | රු. මි | 1.52 | 0.02 | (0.43) | 0.44 | 0.72 | 0.46 |
| | අනියම් සේවකයින් (ආසන්න වශයෙන්) | ගණන | 56 | 53 | 70 | 75 | 61 | 71 |
| සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය | ආයතනික සමාජ වගකීම් සඳහා ආයෝජනය | රු. මි | 4 | 1.7 | 0.3 | 6.5 | 1.7 | 3.8 |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව (ආසන්න වශයෙන්) | ගණන | 8,950 | 1,034 | 775 | 8,600 | 4,000 | 8,800 |
| | රජයට දායක වීම | රු. මි | 2,761 | 1,408 | 1,796 | 1,608 | 1,683 | 2,441 |
| ස්වභාවික ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතා: තිරසාර බව** | | | | | | | |
| | බලශක්ති පරිභෝජනය | කි. වොට් | 4,683,218 | 4,504,889 | 4,717,569 | 5,342,888 | 5,602,794 | 6,360,903 |
| | ජල පරිභෝජනය | කි. ලීටර් | 177,054 | 182,354 | 204,872 | 280,239 | 270,023 | 299,011 |
| | තෙල් මණ්ඩි ඉවත් කිරීම | කි. ලීටර් | - | - | 99.6 | 32.4 | 244.2 | 118.8 |

# වසර දෙස බැල්මක්

| | | |
|---|---|---|
| විකුණුම් පරිමාව **කි.ලී. 4,404,557** | ආදායම **රු. බිලියන 18.9** | වත්කම් පදනම **රු. බිලියන 61** |
| බදු පසු ලාභය **රු. බිලියන 3.4** | | |

ආදයම සහ දළ ලාභ ආන්තිකය (රු. මි)




විකුණුම් පරිමාව (කි.ලී. මිලියන)




බදු පෙර හා බදු පසු ලාභය
(රු. මිලියන)




හිමිකම් මත ප්‍රතිලාභ %




මෙහෙයුම් කාර්ය සාධනය
60%
40%
20%
0%
-20%
2019
2020
2021
2022
2023
2024
මෙහෙයුම් ලාභ ආන්තිකය%
දළ ලාභ ආන්තිකය%


මුළු වත්කම් වර්ධනය (රු. මිලියන)
70,000
60,000
50,000
40,000
30,000
20,000
10,000
-
2019
2020
2021
2022
2023
2024
ජංගම නොවන වත්කම්
ජංගම වත්කම්


ජංගම/ ක්ෂණික වත්කම් අනුපාතය (වාර)
10.00
5.00
0.00
2019
2020
2021
2022
2023
2024
ජංගම වත්කම් අනුපාතය
ක්ෂණික වත්කම් අනුපාතය


කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)
70
60
50
40
30
20
10
0
2019
2020
2021
2022
2023
2024


වත්කම් පිරිවැටුම් අනුපාතය
50%
45%
40%
35%
30%
25%
20%
15%
10%
5%
0%
2020
2021
2022
2023
2024


තෝලන අනුපාතය (වාර)
0.35
0.30
0.25
0.20
0.15
0.10
0.05
-
0.20
0.21
0.23
0.22
0.31
2020
2021
2022
2023
2024

# සම්මාන සහ ඇගයුම්






## 2024 BMPC සම්මාන උළෙලේදී CPSTL දිදුළයි.

ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකාරවරුන්ගේ ආයතනය (CPM Sri Lanka) මගින් සංවිධානය කරන ලද Best Management Practices Company Awards 2024 සම්මාන උළෙලේ දී CPSTL ආයතනය ජයග්‍රහණ ලබාගත් බව අපි මහත් ආඩම්බරයෙන් හා සතුටින් ප්‍රකාශ කර සිටිමු. අපගේ විශිෂ්ටත්වය හා නවෝත්පාදනයට ඇති දැඩි කැපවීම, මෙම අගනා සම්මාන ත්‍රිත්වය සමග තවදුරටත් දිදුලයි.

**කාණ්ඩ ජයග්‍රාහකයා** - නැව්ගත කිරීම සහ බෙදාහැරීම
පාරිභෝගික සේවා බෙදාහැරීමේ සහ ප්‍රවාහන කළමනාකරණයේ අපගේ කාර්යක්ෂමතාවය සහ නවෝත්පාදන හැකියාව පිළිගනිමින්

**කුසලතා සම්මානය** - බලශක්ති සහ විදුලි බලය
රටේ බලශක්ති අවශ්‍යතා ඉටු කිරීමට අප විසින් ක්‍රියාත්මක කරන දියුණුව කරා මෙහෙයවන තිරසාර විසඳුම් පිළිගනිමින්

**පිළිගැනීමේ සහතිකය** - රජයේ සහ අර්ධ රාජ්‍ය ආයතන
රාජ්‍ය අංශය සඳහා අප විසින් සකස් කරන විශේෂිත විසඳුම් සහ නව හවුල්කාරිත්වයන් ගොඩනගා ගැනීම පිළිගනිමින්



# අපගේ නායකත්වය



# සභාපතිතුමාගේ පණිවිඩය

> "බලශක්ති ක්ෂේත්‍රයේ තිරසාරත්වයේ සැබෑ වෙනසක් සහතික කෙරෙන දත්ත මත පදනම් වූ පද්ධතියක්"



2024 වසර සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) වාර්ෂික වාර්තාව, ඉමහත් වගකීමෙන් යුතුව ඉදිරිපත් කරමි. 2024 වසර සලකා බැලූ විට, අභියෝගාත්මක සහ අවස්ථා බහුල යුගයක් වූ නමුත්, ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ඉන්ධන බෙදාහරින්නා ලෙස රටේ බලශක්ති අවශ්‍යතාවයන් සුරක්ෂිත කිරීමට අපගේ කැපකිරීම් මත අපට හැකියාව ලැබුණි.

ගෝලීය ආර්ථික උච්චාවචනයන්, භෞමික දේශපාලන අභියෝග සහ වෙනස්වන බලශක්ති අවශ්‍යතා මධ්‍යයේ වුවද, CPSTL ආයතනය දිවයින පුරා ඉතාම සුරක්ෂිතව සහ කාර්යක්ෂමව ඛනිජ තෙල් නිෂ්පාදන බෙදාහැරීමේ සහ ගබඩා කිරීමේ තම මූලික කාර්ය කැපවී ඉටු කර ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ ජාතික ඉන්ධන සැපයුම් දාමය තවදුරටත් ශක්තිමත් වී ඇත.

2024 වසරේදී ආයතනයේ යටිතල පහසුකම් නවීකරණය සඳහා අප වැඩි වශයෙන් ආයෝජන සිදු කර ඇත. ඉහළම ආරක්ෂණ හා පාරිසරික සම්මතයන්ට අනුකූලව අපගේ ඉන්ධන නල පද්ධතියේ තත්ත්වය ඉහළ නැංවීම, ගබඩා පහසුකම් සහ ස්වයංක්‍රීය ක්‍රියාවලීන් සඳහා තීරණාත්මක වැඩිදියුණු කිරීම් අඛණ්ඩව අපි සිදු කළෙමු. මෙම ආයෝජන, මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා පමණක් නොව, අනාගතයට සූදානම්වන බලශක්ති සැපයුම් ආයතනයක් බවට CPSTL ආයතනය පරිවර්තනය කිරීමේ දිගුකාලීන දැක්මට අනුව ද සිදුකර ඇත.

අපගේ මූලික සාර්ථකත්වයන් අතුරින් එකක් වූයේ ඩිජිටල් පරිවර්තනය හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරගැනීමය. තොග කළමනාකරණය වැඩිදියුණු කිරීම, විනිවිදභාවය ඉහළ නැංවීම සහ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සඳහා සහාය වීමට අපි දත්ත පාදක පද්ධති හඳුන්වා දී ඇත. එම උත්සාහයන් ඉහළ යන බලශක්ති ඉල්ලුම අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය යතාවත් කිරීම හා වර්ධනය කිරීම සඳහා ඉතා වැදගත් වේ.

තවද, ආර්ථිකයේ සියලුම අංශවලට ස්ථාවර සහ විශ්වාසනීය ලෙස ඉන්ධන බෙදාහැරීමටත්, ජාතික බලශක්ති සුරක්ෂිතතාවය ශක්තිමත් කිරීමටත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) ආදී ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ අප අඛණ්ඩව සමීප සබඳතා පවත්වාගෙන ඇත.

මෙම විශිෂ්ටත්වය ලඟා කර ගැනිම සඳහා කැපවූ අපගේ කළමනාකාරීත්වය, සේවකයින් සහ වෘත්තිය සංගම්වල අතිමහත් කැපවීම වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තූතිය ඔවුන් වෙත ප්‍රකාශ කර සිටිමි. අභියෝගාත්මක වසරක දී අපගේ ඉලක්ක සාර්ථකව සපුරාගැනීමට ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව සහ වෘත්තීයමභාවය ඉතා වැදගත් විය.

2025 වර්ෂය සහ ඉන් ඉදිරියට මුහුණ දීමේදී, අප CPSTL ආයතනයෙහි යටිතල පහසුකම් ශක්තිමත් කිරීමට, අපගේ නිපුණතා තීව්‍ර කිරීමට සහ පරිවර්තනය වෙමින් සිටින ජාතියක් ලෙස අපගේ සේවාවන් නව්‍යකරණය කිරීමට ද අවධානය යොමුකර ඇත. අපගේ ඉන්ධන බෙදාහැරීමේ දාමය සුරක්ෂිත, කාර්යක්ෂම සහ අනාගතයට සූදානම් බවට අපි එක්ව සහතික වෙමු.

(අත්සන් කරන ලදී)

**ඩී.ජේ.ඒ.එස්. ද එස්. රාජකරුණා**
සභාපති

# කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය

"කාර්යක්ෂමතාවය, ගුණාත්මකභාවය හා විශ්වාසනීයත්වය සහතික කෙරෙන තිරසාර අනාගතයක්"



ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි (CPSTL) කාර්යක්ෂම, ගුණාත්මක සහ විශ්වාසදායී සේවාවන් පිළිබඳ අතිමහත් කැපවීම විදහා දක්වන 2024 වාර්ෂික වාර්තාව සාඩම්බරයෙන් ඔබ සමග බෙදාගනිමි.

වර්ෂය පුරාම, අඛණ්ඩව ඉන්ධන ගබඩා කිරීම සහ බෙදා හැරීමේ සේවා සහතික කරමින් ඉහළම මට්ටමේ මෙහෙයුම් විශිෂ්ටත්වයක් පවත්වා ගනිමින් CPSTL ආයතනය සිය අපේක්ෂාවන් ඉක්මවා ගොස් ඇත.

කාර්යක්ෂමතාවය කෙරෙහි අපගේ අවධානය යොමු කිරීම මගින් ක්‍රියාවලින් විධිමත් කිරීමට, සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීමට, සහ ගතවන කාලය ඉතිරි කර ගැනීමටද අපට හැකිවී ඇත. ඊට සමගාමීව, දැඩි ප්‍රමිතීන්, අඛණ්ඩ පුහුණුව සහ ගෝලීය හොඳම පරිචයන් අනුගමනය කිරීම තුලින් ගුණාත්මකභාවය සඳහා අපගේ කැපවීම ශක්තිමත් කර ඇති අතර, අප සපයන සෑම සේවාවක්ම ජාතිය විසින් අප කෙරෙහි තබා ඇති විශ්වාසය සපුරාලන බව සහතික කරයි.

2024 වසරේ ප්‍රධාන කැපී පෙනෙන සිදුවීමක් වූයේ නව තාක්ෂණයට අනුගතවීමය. මෙහෙයුම්වල ඩිජිටල් ස්වයංක්‍රීයකරණයේ සිට උසස් අධීක්ෂණ සහ පුරෝකථන නඩත්තු පද්ධති දක්වා මෙම තාක්ෂණික වැඩිදියුණු කිරීම් මගින් අපගේ කාර්යසාධනය පමණක් නොව, විශ්වාසදායක, තත්කාලීන විසඳුම් ලබාදීමේ හැකියාව ද වැඩි දියුණු කර ඇත. හොඳම කළමනාකරණ පරිචයන් සමග නව තාක්ෂණික මෙවලම් ඒකාබද්ධ කිරීමෙන් අපි මෙහෙයුම් අවහිරතා අවම කර, තීරණ ගැනීම වැඩිදියුණු කර, බහු කුසලතා සහිත ශ්‍රම බලකාය ශක්තිමත් කර ඇත්තෙමු.

විනිවිදභාවය, වගවීම සහ නවෝත්පාදන සංස්කෘතියක් පෝෂණය කිරීමෙන් සාම්ප්‍රදායික භාවිතයන්ගෙන් ඔබ්බට යාම සඳහා අපි සැලකිය යුතු පියවර ගෙන ඇත්තෙමු. නායකත්ව කණ්ඩායමක් ලෙස, අපි අක්‍රමිකතා අවම කිරීමට සහ අපහැදිලි තත්ත්වයන් පැහැදිලි කිරීමට කඩිසරව කටයුතු කර ඇති අතර, CPSTL ආයතනය වඩාත් පැහැදිලි බවකින් සහ විශ්වාසදායීව ක්‍රියාත්මක වන බව සහතික කරමු. මෙම ක්‍රියාශීලී ප්‍රවේශය පාර්ශවකරුවන්ගේ විශ්වාසය ඉහළ නංවා ඇති අතර, වඩාත් වැදගත් ලෙස, බලශක්ති ක්ෂේත්‍රයේ ධනාත්මක වෙනසක් ඇති කිරීමේ ප්‍රමුඛයෙකු ලෙස CPSTL ආයතනය ස්ථානගත කර ඇත.

අනාගතය දෙස බලන විට, CPSTL ආයතනය විසින් සියලුම පාර්ශවකරුවන් වෙත රටේ ඉන්ධන අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් හා ඉන්ධන සුරක්ෂිතභාවය තහවුරු කරමින් වටිනාකම්ද ඇතුලත් කරන ලද සේවාවන් ලබා දීමේ ස්ථිර පදනම මේවන විට සකසා ඇත. අපි අපගේ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, මිනිසුන් හා තාක්ෂණය වෙනුවෙන් ආයෝජන සිදු කිරීම සහ CPSTL ආයතනයෙහි ගෞරවනීය ශ්‍රම බලකාය සඳහා වඩාත් සතුටුදායක සේවා ස්ථානයක් සකස්කරදීමට සේවා සැපයීම් සඳහා නව මිණුම් සලකුණු සකස් කිරීම අඛණ්ඩව සිදුකරන්නෙමු.

අපගේ සේවක පිරිසට, පාර්ශවකරුවන්ට සහ හවුල්කරුවන්ට ඔවුන්ගේ මිල කළ නොහැකි සහයෝගය සහ විශ්වාසය වෙනුවෙන් මම මාගේ අවංක කෘතඥතාවය පළකර සිටිමි. අප සියලු දෙනා එක්ව CPSTL ආයතනය සියලුම අභියෝග සහ බලාපොරොත්තු අභිබවා යමින් කාර්යක්ෂමතාවය, ගුණාත්මකභාවය හා විශ්වාසනීයත්වය තහවුරු කරමින් තිරසාර අනාගතයක් කරා රැගෙන යමු.

(අත්සන් කරන ලදී)

**ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ**
කළමනාකාර අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය



## ඩී.ජේ.ඒ.එස්. ද එස්.රාජකරුණා මහතා
සභාපති

ජනක රාජකරුණා මහතා තෙල් හා ගෑස් කර්මාන්තයේ, ප්‍රධාන වශයෙන් පර්යන්ත මෙහෙයුම් සහ කළමනාකරණය පිළිබඳ පුළුල් විශේෂඥ දැනුමක් ඇති කීර්තිමත් නායකයෙකි. ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි (CPSTL) දශක දෙකකට අධික කැපවූ සේවාවක් සමගින්, මෙහෙයුම් විශිෂ්ටත්වය කරා මෙහෙයවීමට සහ ආයතනයේ සාර්ථකත්වය හැඩගැස්වීමට ඔහු දායක වී ඇත.

CPSTL හි සේවා කාලය තුළ රාජකරුණා මහතා මුතුරාජවෙල පර්යන්තයේ පර්යන්ත කළමනාකාර සහ නියෝජ්‍ය මෙහෙයුම් කළමනාකාර ඇතුළු ප්‍රධාන නායකත්ව තනතුරු හොබවා ඇත. මෙම භූමිකාවන්හිදී, ඔහු ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ යටිතල පහසුකම්වල ආරක්ෂාව සහ කාර්යක්ෂම කළමනාකරණය සහතික කළ අතර, රටේ බලශක්ති සුරක්ෂිතතාව සඳහා ද සැලකිය යුතු දායකත්වයක් ලබාදී ඇත.

කාර්යශූර සහ නව දැනුම ඉතා ඉක්මණින් උකහා ගැනීමට උනන්දුවක් දක්වන රාජකාරුණා මහතා ඔහුගේ තාක්ෂණික හා කළමනාකරණ විශේෂඥතාවය අඛණ්ඩව වැඩි දියුණුකර ගනිමින් නැගී එන කර්මාන්ත ප්‍රවණතා සමග සම්පව කටයුතු කරයි. ඔහුගේ සුවිශේෂී තීරණ ගැනීමේ හැකියාව සහ පීඩනය යටතේ සන්සුන්භාවය ඔහුට සංකීර්ණ අභියෝග ජයගැනීමට හා ඵලදායී ප්‍රතිඵල ලබාගැනීමට හැකියාව ලබාදී ඇත. සහයෝගී නායකත්ව විලාසයකට කීර්තිමත් ඔහු, කණ්ඩායම් වැඩ සංස්කෘතියක් හා අන්‍යෝන්‍ය ගෞරවය පෝෂණය කිරීම තුලින්, වෘත්තීය සාර්ථකත්වය හා කණ්ඩායම් සංවර්ධනය යන දෙකම ලබාගැනීමට ප්‍රමුඛත්වයක් ලබාදෙයි.

රාජකරුණා මහතාගේ ශක්තිමත් අධ්‍යයන පසුබිමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කාර්මාන්ත රසායනය පිළිබඳ විද්‍යාපති උපාධිය ද, කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ශුද්ධ ගණිතය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය ද ඇතුලත් වේ. ඔහුගේ විශිෂ්ට අධ්‍යාපනික පදනම හා පුළුල් ප්‍රායෝගික අත්දැකීම් ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ නවෝත්පාදන කෙරෙහි අවධානය යොමු කරමින් සංකීර්ණ මෙහෙයුම් අධීක්ෂණය කිරීමට, ඔහුට බලය ලබාදී ඇත.

LNG අගය දාම කළමනාකරණය, තොග ද්‍රව තඩාග මෙහෙයුම් සහ භාරකාර මාරු කිරීමේ පරිචයන් ඇතුළුව තෙල් හා ගෑස් අංශයේ තීරණාත්මක ක්ෂේත්‍රවල විශේෂිත පුහුණුවක් තුලින් ඔහු තම ප්‍රවීණත්වය තවදුරටත් ඔප් නංවා ඇත. ඔහු ජපානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ මැලේසියාව යන රටවල උසස් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇති අතර, එහිදී ගෝලීය හොඳම පරිචයන් පිළිබඳ ඔහුගේ අවබෝධය වර්ධනය කරගෙන ඇති අතර එම දැනුම CPSTL ආයතනයෙහි මෙහෙයුම්වලට භාවිතා කර ඇත. මීට අමතරව, ඔහු අධීක්ෂණ කළමනාකරණය සහ කාර්මික පරිචයන් පිළිබඳ පුහුණුව ද සම්පූර්ණ කර ඇති අතර, ඔහුගේ නායකත්ව හැකියාවන් ද තවදුරටත් වැඩි දියුණු කරගෙන ඇත.

රාජකරුණා මහතා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ (CPC) තාක්ෂණික පිරිවිතර කමිටුවේ ප්‍රධාන සාමාජිකයෙකු ලෙස කටයුතු කළ අතර, එහිදී ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් කර්මාන්තයට මග පෙන්වන තාක්ෂණික ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබාදී ඇත.

වර්තමානයේ, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි සභාපති සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සභාපති ලෙස රාජකරුණා මහතා ශ්‍රී ලංකාවේ ජාතික ඛනිජතෙල් යටිතල පහසුකම් අධීක්ෂණය කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, නවෝත්පාදනයන් සංවර්ධනය කිරීම සහ බලශක්ති ක්ෂේත්‍රයේ තිරසාර භාවිතයන් මෙහෙයවීම කෙරෙහි ඔහුගේ දූරදර්ශී නායකත්වය අවධානය යොමු කර ඇත.

පිරිසිදු හා තිරසාර බලශක්තිය වෙනුවෙන් පෙනී සිටින රාජකරුණා මහතා චීනයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වූ පිරිසිදු බලශක්ති යෙදුම තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන සාර්ථකව නිම කර ඇත. ඔහුගේ ඉදිරි දැක්මේ අරමුණ වනුයේ සංවිධානයට සහ ජාතියට

ප්‍රතිලාභ සැලසෙන පරිදි තිරසාර පරිචයන් ඒකාබද්ධ කරමින් බලශක්ති ක්ෂේත්‍රය පරිවර්තනය කිරීමය.

අඛණ්ඩ වැඩිදියුණු කිරීම, පාරිසරික භාරකාරත්වය සහ දැනුම හුවමාරු කර ගැනීම සඳහා ගැඹුරු කැපවීමක් ඇති රාජකරුණා මහතා ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය තුළ ප්‍රධාන පුරුකක් ලෙස පෙනී සිටියි. ඔහුගේ නායකත්වය සහ කැපවීම අඛණ්ඩ ප්‍රගතිය සහ නව්‍යකරණයන් දිරිමත් කරන අතර, කලාපයේ බලශක්ති භූ දර්ශනයේ ප්‍රධාන නායකයෙකු ලෙස CPSTL සහ CPC ස්ථානගත කරයි.



## ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ මහතා
### කළමනාකාර අධ්‍යක්ෂ

ආචාර්ය මයුර නෙත්තිකුමාරගේ මහතා දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ දශක දෙකකට ආසන්න අත්දැකීමක් ඇති පළපුරුදු ව්‍යාපාර කළමනාකරණ වෘත්තිකයෙකි. පරිවර්තනීය නායකත්වය සඳහා ප්‍රසිද්ධියට පත් ඔහු බොහෝ සංවිධාන සාර්ථකව පුනර්ජීවනය කර ඇත. ආචාර්ය නෙත්තිකුමාරගේ මහතා පිළිගත් ජාත්‍යන්තර ව්‍යාපාරික උපායමාර්ගිකයෙකු, ආයතනික පරිවර්තන විශේෂඥයෙකු, ඩිජිටල්කරණ විශේෂඥයෙකු සහ කෘතිම බුද්ධිය සම්බන්ධ වෘත්තිකයෙකි.

වර්තමානයේ, ඔහු ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාග මෙහි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි. ඔහු ලිට්රෝ ගෑස් ලංකා සමාගම, ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම සහ ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂ ධූර ද හොබවයි. මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බලශක්ති අමාත්‍යාංශයේ අමාත්‍ය උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි.

ආචාර්ය නෙත්තිකුමාරගේ මහතාගේ ජාත්‍යන්තර වෘත්තීය දිවිය 2005 වර්ෂයේදී Coca-Cola SABCOහි කලාපීය නායකත්ව භූමිකාවක් සමගින් ආරම්භ වූ අතර, එහිදී ඔහු ව්‍යාපාර කටයුතු ආසියානු කලාපය පුරා ව්‍යාප්ත කිරීමෙහිලා ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ අතර, ඉන් පසුව එය අප්‍රිකාව පුරා ද ව්‍යාප්ත කළේය. FMCG අංශයේ ඔහුගේ සේවා කාලයෙන් පසු, ඔහු බලශක්ති අංශයට සංක්‍රමණය වූ අතර, මධ්‍ය සහ පහළ ධාරා ව්‍යාපාර දෙකෙහිම පුළුල් අත්දැකීම් ලබා ගත්තේය. ඔහු TotalEnergies, Petredec, Kleenheat සහ SLOGAL Energy වැනි ප්‍රමුඛ බහුජාතික බලශක්ති සන්නාමයන් සමග මෙන්ම Laugfs-Bangladesh වැනි කලාපීය සන්නාමයන් සමග ද, දේශීය කළමනාකරුගේ සිට ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා සහ බලශක්ති අලෙවිකරු දක්වා ද භූමිකාවන් ඉටුකර ඇත. ඔහුගේ විශේෂඥ දැනුමට පර්යන්ත සඳහා යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ගොඩනැගීම, තඩාග අංගන, නැව් නැංගුරම්/පැටවීමේ පහසුකම්, පිරවුම් හල්, සිලින්ඩර් බලාගාර, ඉන්ධන පිරවුම්හල් ජාල සහ බලශක්ති අංශයේ කාර්මික ස්ථාපනයන් සමගින් නාලිකා සංවර්ධනය ද ඇතුලත් වේ.

FMCG සහ බලශක්තියට අමතරව, ආචාර්ය නෙත්තිකුමාරගේ මහතා කෘත්‍රිම බුද්ධිය, යන්ත්‍ර හැදෑරීම, දත්ත පද්ධති, ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය, අභිරුචි සංවර්ධනය සහ පරිශීලක අත්දැකීම් නිර්මාණය කෙරෙහි අවධානය යොමු කරමින් තොරතුරු තාක්ෂණ අංශයට දායක වී ඇත.

ආචාර්ය නෙත්තිකුමාරගේ මහතා කළමනාකරණ හා ව්‍යාපාර දර්ශනශූරි (Ph.D.) උපාධිය, ව්‍යාපාර පරිපාලනපති (MBA) උපාධිය (කුසලතා සාමාර්ථයක්), යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය ද, දේශපාලන, මෘදුකාංග ඉංජිනේරු සහ පරිගණක පාදක ගිණුම්කරණය යන ඩිප්ලෝමා ද ලබාගෙන ඇත. ඔහු අ.පො.ස (උ/පෙළ) ගණිත විෂය ධාරාවෙන් ඉහළම ජාතික ශ්‍රේණිගත කිරීමක් ද ලබාඇති අතර, IESL, ECSL, SLIM සහ CPM ඇතුළු වෘත්තීය ආයතනවල සාමාජිකත්වයන් ද දරනු ලබයි.



## ඩබ්.එස්. හේමන්ත කුමාර මහතා
### විධායක අධ්‍යක්ෂ

2024 සැප්තැම්බර් මස 26 වෙනි දින ඩබ්.එස්.හේමන්ත කුමාර මහතා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි (CPSTL) අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර ඇත. 1985 සිට තෙල් හා ගෑස් කර්මාන්තයේ පුළුල් වෘත්තීයක් සමගින්, හේමන්ත මහතා පිරිපහදු මෙහෙයුම්, නැව් භාණ්ඩ / ගුදම් සැලසුම් කිරීම සහ පහළ මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ සැලකිය යුතු විශේෂඥ දැනුමක් ලබා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට පෙර, ඔහු CPSTL ආයතනයෙහි මෙහෙයුම් කළමනාකාර ලෙස සේවය කළ අතර, සම්පත් ප්‍රශස්ත කිරීම සහ නියාමන අනුකූලතාව සහතික කිරීම මගින් මෙහෙයුම් විශිෂ්ටත්වය ඉහළ නැංවීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින්, ආනයනයේ සිට බෙදාහැරීම දක්වා වූ ක්‍රියාවලියේ මෙහෙයුම් අධීක්ෂණය කිරීමේ ප්‍රධාන කාර්යභාරය ඉටු කළේය. ඔහුගේ CPSTL හි වෘත්තීය දිවියට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කළමනාකාර, නියෝජ්‍ය කළමනාකාර, සහකාර කළමනාකාර, ජ්‍යෙෂ්ඨ විධායක සහ මෙහෙයුම් කාර්මික වැනි ප්‍රධාන තනතුරු ඇතුළත් වූ අතර, ඔහු සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ ආධුනිකයෙකු ලෙස ද ආරම්භයේදී කටයුතු කර ඇත.

හේමන්ත මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ලබා ඇති අතර, ලංකා රසායන විද්‍යා ආයතනයෙන් (MI.Chem. C සහ LI.Chem. C) වෘත්තීය සුදුසුකම් ලබා ඇත. ඔහුට NAITA ආයතනය විසින් ආධුනික තාක්ෂණ ශිල්පී සහතිකයද පිරිනමා ඇත.

ඔහු SAP ERP ව්‍යාපෘතියේ ප්‍රධාන කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස සේවය කිරීම, ගැන්ට්‍රි පුළුල් කිරීම සහ පොම්ප කිරීමේ ධාරිතාව ඉහළ නැංවීම සහ කොලොන්නාව පර්යන්තයේ නිෂ්පාදන වෙනස්කම් අවම කිරීම ඇතුළුව ඔහුගේ සේවා කාලය තුල CPSTL ආයතනය වෙත සැලකිය යුතු දායකත්වයක් ලබාදී ඇත. මීට අමතරව, ඔහු බංකර් ඉන්ධන මෙහෙයුම් කළමනාකරණය, CPSTL ආයතනය සඳහා සම්පූර්ණ ස්වයංක්‍රීය තඩාග දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීම, ස්වයංක්‍රීය ටැංකි මැනීමේ පද්ධතියක් සහ Power BI භාවිතා කරමින් සම්පූර්ණ ස්වයංක්‍රීය සැලසුම් සහ වාර්තා උත්පාදන මෙවලමක් නිර්මාණය කරන ලදී.

ආයතනයේ මෙහෙයුම් හැකියාවන් වැඩිදියුණු කරමින් සහ රටේ විකාශනය වන බලශක්ති අවශ්‍යතා සපුරාලීම සඳහා හේමන්ත මහතාගේ කැපවීම සහ පුළුල් අත්දැකීම් CPSTL ආයතනය වෙත අගනා වත්කමකි.



## ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා
### අධ්‍යක්ෂ

ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයෙහි විශේෂ ශ්‍රේණි නිලධාරියෙකු වන අතර, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරයි. රාජ්‍ය අංශයේ නායකත්වයේ වසර විස්සකට වැඩි පළපුරුද්දක් ඇති ඔහු, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව යන ආයතනවල ප්‍රධාන තනතුරු හොබවා ඇත.

ඔහු ඕස්ට්‍රේලියාවේ Flinders විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබද ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබද ශාස්ත්‍රපති උපාධිය සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබාගෙන ඇත. එසේම, ඔහු කැලණිය විශ්ව විද්‍යාලයෙන් ගණිතය පිළිබඳ විද්‍යාවේදී (B.Sc.) (ගෞරව) උපාධිය ද ලබා ඇත.

වර්තමානයේදී බණ්ඩාර මහතා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව සහ තිරසාර බලශක්ති

අධිකාරිය යන ආයතනයන්හී අධ්‍යක්ෂ මණ්ඩලවල කටයුතු කරන අතර, CPSTL හි විගණන සහ කළමනාකරණ කමිටුවේ සභාපතිත්වය දරනු ලබයි. ඔහු තේ පර්යේෂණ ආයතනය, සමාජ ආරක්ෂණ මණ්ඩලය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ඇතුළු ජාතික ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලවල ද සේවය කර ඇත.



## දීපක් දාස් මහතා
### අධ්‍යක්ෂ

දීපක් දාස් මහතා NIT Silchar හි යාන්ත්‍රික ඉංජිනේරු උපාධිධාරියෙකු වන අතර ඛනිජතෙල් කළමනාකරණය පිළිබඳ සහතිකයක් දරයි. ඛනිජතෙල් ක්ෂේත්‍රයේ වසර 27කට වැඩි ප්‍රවීණතාවයක් ඇති දාස් මහතාට Global Fortune 500 සමාගමක් වන සීමාසහිත ඉන්දියන් ඔයිල් කෝපරේෂන් ලිමිටඩ් (IOCL) හි විවිධ භූමිකාවන් පිළිබඳ පුළුල් අත්දැකීම් තිබේ.

ඔහු ඉන්දියාවේ කේරළ ප්‍රාන්තය, තෙලන්ගානා, ආන්ද්‍ර ප්‍රදේශ්, රාජස්ථාන්, බටහිර බෙංගාලය සහ ඊසානදිග ප්‍රාන්තවල විශාල භූගෝලීය ප්‍රදේශ ආවරණය කරමින් විවිධ තනතුරුවල ප්‍රධාන භූමිකාවක් ඉටු කළේය.

සිල්ලර විකුණුම් සහ මෙහෙයුම් අංශයේ ඔහුගේ විවිධ ප්‍රධාන කළඹ හැරුණු විට, දාස් මහතා ඉන්දියාවේ බලශක්ති සිතියමට ලක්ෂවදීප් දූපත් ගෙන ඒම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. ඔහු කේරළ ප්‍රාන්තයේ සිල්ලර විකුණුම් ප්‍රධානියා ලෙස කටයුතු කළ කාලය තුළ දූපත් දෙකක ගබඩා පර්යන්ත ඇතුළුව ලක්ෂවදීප් හි කවරට්ටි, මිනිකෝයි, ඇන්ඩ්‍රොට් සහ කල්පේනි දූපත්වල ඛනිජතෙල් සිල්ලර අලෙවිසැල් පිහිටුවන ලදී.

ලංකා IOC පීඑල්සී හි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස ඔහුගේ ප්‍රධාන භූමිකාවට අමතරව, දාස් මහතා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි. ඔහු CPC සහ ලංකා IOC හි හවුල් ව්‍යාපාරයක් වන Trinco Petroleum Terminal (Pvt) Ltd හි කළමනාකාර අධ්‍යක්ෂවරයා ද වේ. එසේම, ඔහු ඉන්දියානු ප්‍රධාන විධායක නිලධාරී සංසදයේ සභාපති (රජයේ සම්බන්ධීකරණ) ලෙස සේවය කරන අතර ලංකා වාණිජ මණ්ඩලය, ජාතික වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා ඉන්දියානු සංගමය වැනි විවිධ මණ්ඩලවල ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. එසේම ඔහු විසින් දිවයින පුරා සිටින අසරණ පුද්ගලයින්ට උපකාර කිරීම සඳහා විවිධ සමාජ සත්කාර වැඩසටහන් සංවිධානය කරයි.



## අවිනාශ් සිංහාල් මහතා
### අධ්‍යක්ෂ

අවිනාශ් සිංහාල් මහතා දිල්ලි විශ්ව විද්‍යාලයේ, හින්දුවිද්‍යාලයේ වාණිජ උපාධිධාරියෙකු වන අතර, ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් ගණකාධිකාරීවරයෙකි.

අවිනාශ් සිංහාල් මහතා 2005 වර්ෂයේදී ඉන්දියානු තෙල් සංස්ථාවට සම්බන්ධ වී ඇති අතර, වසර 19කට වැඩි කාලයක් මූල්‍ය, භාණ්ඩාගාර සහ බදු ක්ෂේත්‍රයේ මනා හැකියාවක් සහ විවිධ අත්දැකීම් ඇති අයෙකි. ඔහු ඉන්දියානු තෙල් සංස්ථාවේ ආයතනික භාණ්ඩාගාරය, ආයෝජක සබඳතා, වක්‍ර බදුකරණය සහ ගිණුම්කරණය වැනි මූල්‍ය ක්ෂේත්‍රවල විවිධ කාර්යයන් හසුරුවා ඇත. ඔහුට විදේශ විනිමය අවදානම් කළමනාකරණය, කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ජාත්‍යන්තර වෙළඳපොළෙන් අරමුදල් රැස් කිරීම, ආයෝජක සබඳතා, ණය ශ්‍රේණිගත කිරීම් සහ සමාගම් තක්සේරු කිරීම් යන ක්ෂේත්‍රයන් පිළිබඳ පුළුල් අත්දැකීම් ඇත.

ඔහු වර්තමානයේ ලංකා ඉන්දියන් ඔයිල් සමාගමෙහි ජ්‍යේෂ්ඨ උප සභාපති (මූල්‍ය) ලෙස ද, මූල්‍ය කාර්යාංශයේ ප්‍රධානියා ලෙස ද කටයුතු කරයි.



## සුනිල් කාන්ත මහාරණ මහතා

අධ්‍යක්ෂ

සුනිල් කාන්ත මහාරණ මහතා ඉන්දියාවේ බුබනේස්වර් හි Xavier කළමනාකරණ ආයතනයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇති අතර, ඉන්දියාවේ විවිධ භූගෝලීය ප්‍රදේශවල ඛනිජතෙල් නිෂ්පාදන අලෙවිකරණය සහ මෙහෙයවීම පිළිබඳ වසර 17කට අධික මනා පළපුරුද්දක් ද ලබා ඇත.

ඔහු වර්තමානයේ ලංකා ඉන්දියන් ඔයිල් සමාගමෙහි උප සභාපති (මෙහෙයුම්, ආනයන සහ බංකර් විකුණුම්) ලෙස කටයුතු කරයි.

ඔහු ඉන්දියාවේ විවිධ තනතුරු සහ විවිධ භූගෝලීය ප්‍රදේශවල විකුණුම් වෘත්තිකයෙකු ලෙස වසර 15කට අධික කාලයක් සිල්ලර වෙළඳාම හසුරුවා ඇත. ජාල පුළුල්කරණය, සැපයුම් කළමනාකරණය සහ සිල්ලර යටිතල පහසුකම් නවීකරණය කිරීම සඳහා ඉන්දියාවේ ගෝවා හී ප්‍රාදේශීය සිල්ලර ප්‍රධානියා ලෙස කණ්ඩායමක් ද මෙහෙයවා ඇත.

ඉන්දියන් ඔයිල් හි අලෙවිකරණ ප්‍රධාන කාර්යාලයේ සේවා කාලය තුළ ඔහු සිල්ලර පරිවර්තන ව්‍යාපෘතියේ මූලික කණ්ඩායමේ සාමාජිකයෙකු වූ අතර, රට පුරා පිහිටි සිල්ලර අලෙවිසැල්වල පහසුකම් සහ සේවා මට්ටම් වෙනස් කිරීම සඳහා බොහෝ මුල පිරීම් මෙහෙයවන ලදී.

ඔහු මෙහෙයුම් කාර්යාංශයේ ද සේවය කර ඇති අතර එහිදී තඩාග, බංකර් සහ නල මාර්ග ඇතුළු පර්යන්ත මෙහෙයුම්වලට අදාල කටයුතු අධීක්ෂණය කර ඇත.



## එච්.ටී.පී. චන්දන මහතා

අධ්‍යක්ෂ

එච්.ටී.පී. චන්දන මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි (ACA). ඔහු සිය වෘත්තීය දිවිය CIC හෝල්ඩින්ග්ස් පීඑල්සී හි ආරම්භ කර ඇති අතර, එහිදී ඔහු ගණකාධිකාරී, තොරතුරු තාක්ෂණ කළමනාකාර, සමූහ ව්‍යාපාර විශ්ලේෂක, සහ ප්‍රසම්පාදන සාමාන්‍යාධිකාරී වැනි තනතුරු හරහා වසර 20කට අධික විවිධ අත්දැකීම් ලබාගෙන ඇත.

ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහුගේ ආයතනික පළපුරුද්දට අමතරව, චන්දන මහතා CP Associates හි වසර අටකට වැඩි කාලයක් හවුල්කරුවෙකු ලෙස කටයුතු කර ඇති අතර, මූල්‍ය හා ව්‍යාපාර උපදේශන ක්ෂේත්‍රයන්ට සිය ප්‍රවීණත්වය ලබා දී ඇත.

වර්තමානයේදී, ඔහු ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන අතර, එහි අධ්‍යක්ෂ මණ්ඩලයට උපායමාර්ගික දැක්මක් සහ පාලන පළපුරුද්දක් ගෙන එයි.



# ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**ඕ. පී. කග්ගොඩ ආරච්චි මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)



**ටී. වී. සරත්චන්ද්‍ර මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



**ඊ. ඒ. ආර්. ඩී. බණ්ඩාර මහතා**
වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) / කළමනාකාර (පුහුණු සහ ඵලදායීතා සංවර්ධන)



**එච්.එම්.යූ. බණ්ඩාර මහතා**
වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සහ උපකාරක සේවා) / ඉංජිනේරු කළමනාකාර



**ජේ. ඒ. යූ. ආර්. කේ. ජයලත් මහතා**
කළමනාකාර - මූල්‍ය



**එච්. එන්. බී. යූ. ජයවර්ධන මහතා**
කළමනාකාර - ආරක්ෂක

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**එස්. එන්. ගමගේ මිය**
කළමනාකාරිනී - ආයතනික කටයුතු



**ඩබ්. එම්. ටී. ඩබ්. ඒ. බණ්ඩාර මහතා**
කළමනාකාර - බෙදාහැරීම්



**වෛද්‍ය ආර්. සුසිරිවර්ධන මිය**
වෛද්‍ය නිලධාරිනී



**මේජර් ආර්. එම්. එන්. ජයතිලක**
WWV RWP RSP **(විශ්‍රාමික)**
කළමනාකාර - විමර්ශන



**ගෲප් කපිතාන් පී. එම්. සී. පී. ඩයස්**
කළමනාකාර - ගිනි හා ප්‍රවේසම්



**එන්. එම්. මුනාස් මහතා**
මානව සම්පත් කළමනාකාර

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**ඩබ්. පී. පී. ඒ. ඩබ්. ජයවර්ධන මිය**
ප්‍රධාන නීති නිලධාරිනී



**පී. එච්. එන්. එම්. චන්ද්‍රසිරි මහතා**
කළමනාකාර - රසායනාගාර



**එම්. ඩී. ඒ. අශෝක කුමාර මහතා**
කළමනාකාර - ගබඩා



**එන්. ඩෙෆ්නි තස්නීම් මහතා**
කළමනාකාර - ප්‍රසම්පාදන



**සමන්මලී ගජධීර මිය**
වැඩ බලන ප්‍රධාන තොරතුරු නිලධාරිනී



**සකුන්තලා ඒකනායක මිය**
වැඩ බලන කළමනාකාරිනී
- තොරතුරු පද්ධති

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**ඩී. ආර්. ජේ. බෝපෙආරච්චි මහතා**
වැඩ බලන කළමනාකාර
(අක්වෙරළ මෙහෙයුම්)



**එම්.පී.ඒ. ලක්මාල් මහතා**
වැඩ බලන මෙහෙයුම් කළමනාකාර
(තොග චලන හා තොග නිෂ්පාදන)



**සළුන් ජිනදාස මහතා**
වැඩ බලන පර්යන්ත කළමනාකාර
(මුතුරාජවෙල)



**ඒ. ආර්. සේරසිංහ මහතා**
නියෝජ්‍ය කළමනාකාර - අභ්‍යන්තර විගණන



# කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

# මෙහෙයුම් සාරාංශය - 2024

## ජාතික බලශක්ති යටිතල පහසුකම් සැපයීමේහි ලා උපායමාර්ගික කාර්යභාරය

- ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඛනිජ තෙල් ගබඩාකරණය සහ බෙදාහැරීමේ ක්‍රියාකරු
- ඛනිජ තෙල් ගබඩා කිරීම සහ බෙදා හැරීම සඳහා පොදු පරිශීලක පහසුකම
- ආරක්ෂිත, අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීම

## ඇල්මක් දක්වන පාර්ශව කේන්ද්‍ර කරගත් මෙහෙයුම් ආකෘතියක්

| ඇල්මැති පාර්ශවය | බලාපොරොත්තු වන දේ | ප්‍රතිචාරය |
|---|---|---|
| රජය | බලශක්ති ආරක්ෂාව | උපායමාර්ගික සංචිත |
| CPC/LIOC | කාර්යක්ෂම ලෙස හැසිරවීම | නවීන පර්යන්ත |
| සේවකයින් | වර්ධනය සහ ආරක්ෂාව | HSE, පුහුණුව |
| පාරිභෝගිකයින් | විශ්වාසදායක සැපයුම් | ISO පද්ධති, ලුහුබැඳීම |
| විවිධ ප්‍රජාවන් | විනිවිදභාවය | කෙටි විස්තර, සම්බන්ධ වීම |

## ආර්ථික පසුබිම සහ අංශ ගතිකත්වය

- පශ්චාත් - අර්බුද බලශක්ති ස්ථායිකරණයේ කාර්යභාරය
- දිපව්‍යාප්තව ඉන්ධන සැපයීමේ අඛණ්ඩතාවය පවත්වා ගැනීම
- කාර්මික සහ ප්‍රවාහන අංශයේ සහාය
- අනාගතයට සූදානම් - ජෛව ඉන්ධන, LNG සැලසුම් කිරීම

## බාහිර මෙහෙයුම් පරිසරය

- ගෝලීය බොරතෙල් මිල ඇ.ඩො 82.5/ බැරලයකට
- ප්‍රතිපත්ති වෙනස්කම් ජාතික බලශක්ති මිලකරණ ප්‍රතිසංස්කරණ
- පුනර්ජනනීය බලශක්ති % ජාතික බලශක්ති ජාලයෙන් 50% කට වඩා
- උපායමාර්ගික පාර්ශවකරුවන් – CPC, LIOC, සිනොපෙක්, ආර්එම් පාර්ක්ස්, යුනයිටඩ් පෙට්‍රෝලියම්

## මෙහෙයුම් සහ යටිතල පහසුකම්

- 2024 මූල්‍ය වර්ෂයේ ආදායම - රු. බි 18.9
- ව්‍යාපාරික අංශ - ගබඩා කිරීම සහ බෙදා හැරීම
- ගබඩා කිරීම
  - කොලොන්නාව - මෙට්‍රික් ටොන් 265,529
  - මුතුරාජවෙල - මෙට්‍රික් ටොන් 208,738
  - තොග ගබඩා - මෙට්‍රික් ටොන් 24,881
- බෙදා හැරීම - නල මාර්ග, දුම්රිය, ටැංකි රථ
- අක්වෙරළ - SPBM-1, SPBM-2, ඩොල්ෆින් ජැටිය(DTB)

## 2024 වර්ෂයේ පරිමාව සහ බෙදාහැරීම

බෙදා හරින ලද පරිමාව - කිලෝ.ලීටර් මිලියන 4.4

- ඔටෝ ඩීසල් - කිලෝ.ලීටර් මිලියන 1.5 (34.99%)
- පෙට්‍රල් - කිලෝ-ලීටර් මිලියන 1.5 (34.07%)
- ගුවන්යානා ඉන්ධන - කිලෝ ලීටර් මිලියන 0.56 (12.66%)
- අනෙකුත් - කිලෝ-ලීටර් මිලියන 0.80 (18.28%)






# මෙහෙයුම් පරිසරය

## උපායමාර්ගික පසුබිම සහ බාහිර පරිසරය

### මෙහෙයුම් පරිසරය විශ්ලේෂණය

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සැපයීමෙහි ලා ඉතා වැදගත් ව්‍යුහයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙහිදී, අපගේ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජාතික බලශක්ති අවශ්‍යතා සුරක්ෂිත කරමින්, සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටුකරමින්, සහ තිරසාර පරිචයන් අනුගමනය කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඛනිජ තෙල් පහසුකම් සපයන්නා ලෙස කටයුතු කරයි.

### බාහිර මෙහෙයුම් පරිසරය

බාහිර මෙහෙයුම් පරිසරයේ ව්‍යුහාත්මක තත්වයන් සඳහා ප්‍රධාන වශයෙන් බලපාන කරුණු

- ගෝලීය බලශක්ති මිල උච්චාවචනයන් සහ භූ දේශපාලනික වෙනස්කම්
- ජාතික ආර්ථික හා ප්‍රතිපත්තිමය වෙනස්කම් (ඉන්ධන මිලකරණ ප්‍රතිසංස්කරණ)
- පාරිසරික බැඳීම් සහ බලශක්ති පරිවර්තනය (පුනර්ජනනීය බලශක්තිය 2024දී බලශක්ති උත්පාදනයෙන් 50% කට වඩා ළඟා වන අතර එය 2030 දී බලශක්ති උත්පාදනයෙන් 70% දක්වා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ).

පොදු පරිශීලක ඛනිජතෙල් පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියාකරන CPSTL, ගබඩා කර ඇති ඛනිජතෙල් නිෂ්පාදන වල හිමිකාරත්වය නොදරන අතර, අපගේ ප්‍රධාන ගනුදෙනුකරුවන් සඳහා ආරක්ෂිතව හා කාර්යක්ෂමව ඉන්ධන ගබඩා කිරීම හා බෙදාහැරීම පමණක් සහතික කරයි.

### CPSTL හි ගනුදෙනුකරුවන්,

- ඛනිජතෙල් නීතිගත සංස්ථාව (CPC)
- ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (LIOC)
- සිනොපෙක් එනර්ජි ලංකා (පුද්) සමාගම (Sinopec Energy Lanka (Pvt) Ltd)
- ආර් එම් පාර්ක්ස් (පුද්) සමාගම (RM Parks (Pvt) Ltd)
- යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා (පුද්) සමාගම (United Petroleum Lanka (Pvt) Ltd)

### ආර්ථික හා බලශක්ති අංශයේ වර්ධනයන්

- ගෝලීය බොරතෙල් මිලෙහි උච්චාවචනය (බ්‍රෙන්ට් සාමාන්‍යය ඇ.ඩො 82.5/බැරලය)
- දේශීය මිල නියම කිරීමේ ප්‍රතිසංස්කරණ සහ සංශෝධන මගින් මෙහෙයුම් පිරිවැයට සහ ලාභ ආන්තිකයට බලපෑම් එල්ල කිරීම
- CPSTL, දීපව්‍යාප්තව අඛණ්ඩ ඉන්ධන සැපයුමක් ලබා දීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි තොග ගබඩා 11ක් පවත්වාගෙන යාම, නල මාර්ග, මහා මාර්ග, දුම්රිය මාර්ග භාවිතා කිරීම සිදුකරයි.

පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි රජයේ ප්‍රතිපත්තිමය නැඹුරුව හේතුකොටගෙන, LNG ජෛව ඉන්ධන සහ අනෙකුත් විකල්ප ඉන්ධන වෙත විවිධාංගීකරණය වීමත් සමඟ, CPSTL මෙම ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

### ගබඩාකරණ මෙහෙයුම්

CPSTL හි ගබඩාකරණ මෙහෙයුම් පහසුකම් පහත පරිදි වේ.

- කොලොන්නාව පර්යන්තය - ධාරිතාව මෙට්‍රික් ටොන් 265,529කි.
- මුතුරාජවෙල පර්යන්තය - ධාරිතාව මෙට්‍රික් ටොන් 208,738කි.
- තොග ගබඩා 11 - මුළු ධාරිතාව මෙට්‍රික් ටොන් 24,881කි.

කොලොන්නාව පර්යන්තය ප්‍රධාන උපායමාර්ගික තොග ගබඩා පර්යන්තයක් වන අතර වැඩි ඉන්ධන ධාරිතාවයක් පවත්වාගෙන යාමට ප්‍රමුඛතාවය ලබා දී ඇත්තේ ඔක්ටේන් 92 පෙට්‍රල් (මෙට්‍රික් ටොන් 51,769), ගුවන් යානා ඉන්ධන (මෙට්‍රික් ටොන් 38,988), දැවි තෙල් (මෙට්‍රික් ටොන් 48,120), ලංකා ඔටෝ ඩීසල් (මෙට්‍රික් ටොන් 50,971), ඔක්ටේන් 95 පෙට්‍රල් (මෙට්‍රික් ටොන් 18,249), භූමිතෙල් (මෙට්‍රික් ටොන් 10,488) නැප්තා (මෙට්‍රික් ටොන් 27,776) සහ සුපිරි ඩීසල් (මෙට්‍රික් ටොන් 17,232) වශයෙනි. තවද, කාර්මික භූමිතෙල් ( මෙට්‍රික් ටොන් 1,593) සහ SPB (මෙට්‍රික් ටොන් 343) වැනි අඩු ධාරිතාවකින් යුත් නිෂ්පාදන, විශේෂිත වෙළඳපල අවශ්‍යතා සපුරාලයි.

මුතුරාජවෙල පර්යන්තය, ප්‍රධාන වශයෙන් ප්‍රමුඛත්වය ලබා දෙන්නේ, ඔටෝ ඩීසල් (මෙට්‍රික් ටොන් 113,633) සහ ඔක්ටේන් 92 පෙට්‍රල් (මෙට්‍රික් ටොන් 95,105) සඳහාය.

තොග ගබඩාවල ධාරිතාව මෙට්‍රික් ටොන් 24,881 ක් වන අතර ඒ පිළිබඳ සවිස්තරාත්මකව පහතින් දක්වා ඇත.

| ඉන්ධන වර්ගය | ඔටෝ ඩීසල් මෙ. ටොන් | ඔක්ටේන් 92 පෙට්‍රල් මෙ. ටොන් | භූමිතෙල් මෙ. ටොන් | එකතුව මෙ. ටොන් |
|---|---|---|---|---|
| අනුරාධපුර | 1,059 | 312 | 129 | 1,500 |
| බදුල්ල | 1,149 | 155 | 52 | 1,355 |
| මඩකලපුව | 696 | 383 | - | 1,079 |
| ගාල්ල | 1,826 | 600 | 254 | 2,680 |
| හපුතලේ | 162 | 120 | 24 | 306 |
| කන්කසන්තුරෙයි | 10,920 | 337 | 602 | 11,859 |
| කොටගල | 1,104 | 239 | 174 | 1,517 |
| කුරුණෑගල | 1,250 | 870 | - | 2,120 |
| මාතර | 315 | 200 | 50 | 565 |
| පේරාදෙණිය | 1,306 | 471 | - | 1,778 |
| IRD වවුනියා | 79 | - | 44 | 123 |
| එකතුව | 19,867 | 3,686 | 1,328 | 24,881 |

අප විසින් පිරිවැය අවම කිරීම, අක්‍රීය කාලය අවම කිරීම තුලින් ආදායම ප්‍රශස්ත කිරීම සහ මෙහෙයුම් ඉතා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා මෙහෙයුම් කළමනාකරණයට අදාලව කර්මාන්තයේ පවතින හොඳම පරිචයන් අනුගමනය කරන්නෙමු.

## ගබඩා ධාරිතාව විශ්ලේෂණය




## බෙදාහැරීමේ මෙහෙයුම්

ජාතික ඉන්ධන ඉල්ලුම සපුරාලීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව සැපයීම සහතික කරමින්, ශ්‍රී ලංකාව පුරා ඉන්ධන බෙදා හැරීමේදී CPSTL වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙහිදී අපි අපගේ පහත ගනුදෙනුකරුවන්ගේ ඉන්ධන බෙදාහැරීම් අවශ්‍යතා සපුරාලන්නෙමු.

- ඛනිජතෙල් නීතිගත සංස්ථාව
- ලංකා ඉන්දියන් ඔයිල් සමාගම
- සිනොපෙක් එනර්ජි ලංකා (පුද්) සමාගම
- ආර් එම් පාර්ක්ස් (පුද්) සමාගම
- යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා (පුද්) සමාගම

ජාතික ඉන්ධන අවශ්‍යතාවය සපුරාලීම සඳහා අපි ප්‍රධාන උපායමාර්ගික පර්යන්ත ද්විත්වය වන කොලොන්නාව පර්යන්තය සහ මුතුරාජවෙල පර්යන්තය සහ දීප ව්‍යාප්තව පවතින තොග ගබඩා 11ක් භාවිතා කරන අතර, ඵලදායී බෙදාහැරීමක් සඳහා දුම්රිය මාර්ග, නල මාර්ග සහ ටැංකි රථ භාවිතා කරමු.

**2024 මූල්‍ය වර්ෂයේදී බෙදා හරින ලද මුළු ඉන්ධන පරිමාව,**

- **එකතුව: කි.ලී. 4,404,557**
  - ඛනිජතෙල් නීතිගත සංස්ථාව - කි.ලී.3,385,410 (77%)
  - ලංකා ඉන්දියන් ඔයිල් සමාගම - කි.ලී.318,332 (7%)
  - සිනොපෙක් එනර්ජි ලංකා (පුද්) සමාගම - කි.ලී.439,462 (10%)
  - ආර් එම් පාර්ක්ස් (පුද්) සමාගම - කි.ලී.218,572 (5%)
  - යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා (පුද්) සමාගම - කි.ලී.42,781 (1%)

**ආර්ථික හා බලශක්ති අංශයේ සංවර්ධනයන්**

වැදගත් කරුණු

- ඔටෝ ඩීසල් - මුළු බෙදාහැරීම් වලින් 34.99% ක කොටසකි.
- ඔක්ටේන් 92 පෙට්‍රල් - මුළු බෙදාහැරීම් වලින් 34.07% ක කොටසකි.
- ගුවන්යානා ඉන්ධන - මුළු බෙදාහැරීම් වලින් 12.66% ක් විය.
- දැවි තෙල් - මුළු බෙදාහැරීම් වලින් 9.24% ක් විය.

ඉතිරි ඛනිජතෙල් නිෂ්පාදන නිශ්චිත කාර්මික සහ විශේෂිත වෙළඳපොළ අවශ්‍යතා සපුරාලන අතර, ශ්‍රී ලංකාව තුළ පවතින ඉන්ධන ඉල්ලුමට ඔරොත්තු දෙන ඛනිජතෙල් සැපයුම් දාමයක් ක්‍රියාත්මක කිරීම සඳහා CPSTL නිරතුරුව කැපවී සිටිමු.

ඉන්ධන සැපයුම් යටිතල පහසුකම් සැපයීම සහ ඉන්ධන ඉල්ලුම අඛණ්ඩව සපුරාලීම සඳහා දීපව්‍යාප්තව මාතර, පේරාදෙණිය, හපුතලේ, කන්කසන්තුරෙයි, කොටගල, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, මඩකලපුව සහ ගාල්ල යන ස්ථාන වල පිහිටුවා ඇති තොග ගබඩා සහ කොලොන්නාව සහ මුතුරාජවෙල පිහිටුවා ඇති උපායමාර්ගික පර්යන්තවලින් ශ්‍රී ලංකාවේ පවතින ඉන්ධන ඉල්ලුම කාර්යක්ෂමව සපුරාලීම සහතික වී ඇත.

මේවා අතරින්, මුතුරාජවෙල පර්යන්තය සහ කොලොන්නාව පර්යන්තය ප්‍රධාන ගබඩා මධ්‍යස්ථාන ලෙස කැපී පෙනෙන අතර එම පර්යන්ත ද්විත්වයේ ඒකාබද්ධ ගබඩා ධාරිතාව ලීටර් මිලියන 500 ඉක්මවයි. මුතුරාජවෙල පර්යන්තය, ප්‍රධාන වශයෙන් ලංකා ඔටෝ ඩීසල් සහ ඔක්ටේන් 92 පෙට්‍රල් ගබඩා කරන අතර කොලොන්නාව පර්යන්තය, කාර්මික භූමිතෙල්, සුපර් ඩීසල්, බහු ශ්‍රේණිවල පෙට්‍රල් (ඔක්ටේන් 92 සහ 95), ජෙට් ඉන්ධන (ජෙට් A1) ඇතුළු විවිධ නිෂ්පාදන පරාසයක් හසුරුවයි. මෙම පර්යන්ත ද්විත්වය CPSTL හි සැපයුම් දාමයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ, සමාගම ලීටර් බිලියන 4.4 ඉක්මවන මුළු විකුණුම් පරිමාවක් කළමනාකරණය කළ අතර ජාතික බලශක්ති ක්ෂේත්‍රයේ එහි තීරණාත්මක කාර්යභාරය පිළිබිඹු කරයි. ප්‍රධාන නිෂ්පාදන අලෙවියට ආසන්න වශයෙන් ඔටෝ ඩීසල් ලීටර් බිලියන 1.5 ක්, ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටර් බිලියන 1.54 ක් සහ ගුවන්යානා ඉන්ධන ලීටර් මිලියන 550 කට අධික ප්‍රමාණයක් ඇතුළත් වේ.

## උපායමාර්ගික වැදගත්කම, භූ දේශපාලනික සහ සාර්ව ආර්ථික පසුබිම

"ලෝකයේ වඩාත්ම කාර්යක්ෂම ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත ක්‍රියාකරු වීම", යන අපගේ දැක්මට අනුකූලව, CPSTL හි මෙහෙයුම් ජාතික බලශක්ති ඉල්ලීම්, භූ දේශපාලනික ගතිකත්වය සහ තිරසාරභාවය පිළිබඳ අරමුණු කේන්ද්‍ර කොටගෙන හැඩගැසී ඇත.

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගබඩා කිරීමෙහි ලා ප්‍රමුඛතම පාර්ශවය ලෙස, CPSTL ජාතික බලශක්ති කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරයි. මේ යටතේ, ජාතික විදුලි බල අවශ්‍යතාවය සඳහා 30%ක් (CPC, LIOC සැපයුම හරහා) සහ ජාතික ඉන්ධන අවශ්‍යතාවය 1,100කට අධික ඉන්ධන පිරවුම්හල් ජාලයක් ඔස්සේ සහ තීරණාත්මක යටිතල පහසුකම් (බණ්ඩාරනායක ගුවන්තොටුපළ, හමුදා කඳවුරු) හරහා සෘජුවම බලගන්වයි.

ගෝලීය ඉන්ධන මිල උච්චාවචනයන් (සාමාන්‍යය බ්‍රෙන්ට් බොරතෙල් බැරලයකට ඩොලර් 82.5) සහ විදේශ විනිමය හිඟය යන තීරණාත්මක අභියෝග හමුවේ උවද, CPSTL, වාර්තාකරණ කාලපරිච්චේදය තුල කිලෝ ලීටර් මිලියන 4.4ක් ඉන්ධන බෙදාහැරීම් සිදුකල අතර එය වාර්ෂිකව වාහන මිලියන 6ක් සඳහා ඉන්ධන සැපයීමට ප්‍රමාණවත් වේ.

මීට අමතරව, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර උපායමාර්ගික හවුල්කාරිත්වය හරහා, කලාපීය බලශක්ති ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ත්‍රිකුණාමලය තෙල් ටැංකි අංගනය පුළුල් කිරීම සඳහා සහයෝගීව කටයුතු ආරම්භ කරන ලදී.

| නිෂ්පාදිතය | සී.පී.සී කිලෝ ලීටර් | එල් අයි ඕ සී කිලෝ ලීටර් | සිනොපෙක් කිලෝ ලීටර් | ආර් එම් පාර්ක්ස් කිලෝ ලීටර් | යුනයිටඩ් පෙට්‍රෝලියම් කිලෝ ලීටර් | එකතුව කිලෝ ලීටර් | මුළු එකතුව මත% |
|---|---|---|---|---|---|---|---|
| පෙට්‍රල් | 964,344 | 172,359 | 224,060 | 115,216 | 24,578 | 1,500,557 | 34.07% |
| ඔටෝ ඩීසල් | 1,074,752 | 142,085 | 208,436 | 98,677 | 17,371 | 1,541,321 | 34.99% |
| සුපර් ඩීසල් | 28,005 | 3,888 | 6,966 | 4,679 | 832 | 44,370 | 1.01% |
| භූමිතෙල් | 149,503 | - | - | - | - | 149,503 | 3.39% |
| කාර්මික භූමිතෙල් | 5,262 | - | - | - | - | 5,262 | 0.12% |
| දැවි තෙල් 1.5% | 406,915 | - | - | - | - | 406,915 | 9.24% |
| නැප්තා | 197,241 | - | - | - | - | 197,241 | 4.48% |
| SPB | 1,584 | - | - | - | - | 1,584 | 0.04% |
| ගුවන්යානා ඉන්ධන | 557,804 | - | - | - | - | 557,804 | 12.66% |
| එකතුව | 3,385,410 | 318,332 | 439,462 | 218,572 | 42,781 | 4,404,557 | 100% |
| මුළු එකතුව මත % | 77% | 7% | 10% | 5% | 1% | 100% | |

## CPSTL හි ඇල්මැති පාර්ශව කේන්ද්‍ර කරගත් මෙහෙයුම් ආකෘතියක් කෙටියෙන්

CPSTL, රාජ්‍ය අංශය සතු පෞද්ගලික සමාගමක් වීමත් සමගම, එය රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය යන ද්විත්වයේම මැදිහත්වීම මත ක්‍රියාත්මක වේ. අපගේ සමාගම කෙරෙහි ඇල්මැති ප්‍රධාන පාර්ශව ලෙස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, අපගේ කොටස්කරුවන් (CPC, ලංකා IOC), ගනුදෙනුකරුවන්, පෞද්ගලික ටැංකි රථ ප්‍රවාහන ක්‍රියාකරුවන්, සැපයුම්කරුවන් සහ පොදු ජනතාව ඇතුළු අපගේ ශ්‍රී ලංකා රජය අපගේ මෙහෙයුම් වලදී විශ්වාසනීයත්වය, ආරක්ෂාව සහ සදාචාරාත්මක හැසිරීම අපේක්ෂා කරයි.

| ඇල්මැති පාර්ශවය | ඔවුන් බලාපොරොත්තු වන දේ | CPSTL එය ලබා දෙන ආකාරය | එකතු වූ අගය |
|---|---|---|---|
| රජය | බලශක්ති ආරක්ෂාව, අනුකූලතාව | උපායමාර්ගික සංචිත, ප්‍රතිපත්ති පෙළගැස්ම | ජාතික බලශක්ති ස්ථාවරත්වය |
| CPC සහ ආනයනකරුවන් | ඉන්ධන කාර්යක්ෂමව හැසිරවීම | නවීන පර්යන්ත, 24/7 මෙහෙයුම් | සුමට සැපයුම් දාමය |
| සේවකයින් | ආරක්ෂාව, වර්ධනය, පිළිගැනීම | පුහුණුව, සෞඛ්‍යය, ආරක්ෂාව සහ පරිසරය අවධානය, කුසලතා මත පදනම් වූ ඇගයීම් | ඉහළ චිත්ත ධෛර්යයක්, වැඩබිමේ අනතුරු ශූන්‍ය මරණ අනුපාතයක් |
| පාරිභෝගිකයින් (B2B) | විශ්වාසනීය, උසස් තත්ත්වයේ ඉන්ධන සැපයුමක් | ඩිජිටල් නිරීක්ෂණ, තත්ත්ව පාලනය | දැඩි  විශ්වාසය, පදනම වර්ධනය වීම |
| සැපයුම්කරුවන් | සාධාරණ කොන්දේසි, විනිවිදභාවය | විද්‍යුත් ප්‍රසම්පාදනය, කඩිනම් ගෙවීම් | දිගුකාලීන හවුල්කාරිත්වයන් |
| විවිධ ප්‍රජාවන් | පාරිසරික රැකවරණය, සමාජය ඇතුලුව | ආයතනික සමාජ වගකීම් මුලපිරීම්, හරිත පිළිවෙත් | මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට අදාළ බලපත්‍ර |
| විගණකවරුන් සහ මූල්‍යකරුවන් | සත්‍යවාදී බව, පාලනය, වාර්තාකිරීම | ශක්තිමත් පාලනය, මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලතාව | විශ්වාසනීයත්වය සහ පාලනය |
| මහජනයා සහ මාධ්‍ය | පැහැදිලි සන්නිවේදනය, වගවීම | නිල සාකච්ඡා, ඩිජිටල් මාධ්‍ය ඔස්සේ ප්‍රජාව දැනුවත් කිරීම | විනිවිදභාවය සහ වගවීම |

## තාක්ෂණික පෙළගැස්ම සහ ඩිජිටල්කරණය

මෙහෙයුම් කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ සේවා විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) තාක්ෂණික දියුණු කිරීම් සහ ඩිජිටල් පරිවර්තන මුලපිරීම් සඳහා අඛණ්ඩව කටයුතු කරයි.

- ස්මාර්ට් ඉන්වෙන්ටරි - ස්වයංක්‍රීය ඩිජිටල් ලුහුබැඳීම, නිරවද්‍ය තොග මට්ටම් සහ සුමට සැපයුම් ප්‍රවාහ සහතික කරයි.
- ටැංකි රථ ප්‍රශස්තිකරණය - GPS තාක්ෂණයන් ඉන්ධන බෙදාහැරීම් විධිමත් කරයි, කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව වැඩි කරයි.
- සම්බන්ධිත පද්ධති - මධ්‍යගත තොරතුරු තාක්ෂණ පද්ධතියක් සහ තත්‍ය කාලීන වාර්තාකරණය.
- දත්ත මත පදනම් වූ තීක්ෂණ බුද්ධිය - ඉල්ලුම පුරෝකථනය කිරීමට සහ උපරිම කාර්ය සාධනය පවත්වා ගැනීමට උපකාරී වේ.
- ඩිජිටල්කරණය - අවම ලියකියවිලි සමඟ තත්‍ය කාලීන දත්ත ප්‍රවේශය සක්‍රීය කිරීම සඳහා වැටුප් ඩිජිටල්කරණය.

## නියාමන සහ අනුකූලතා රාමුව

CPSTLහි මෙහෙයුම් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ජාතික පරිසර අධිකාරිය (NEA) සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය ඇතුළුව ශක්තිමත් නියාමන රාමුවක් මගින් පාලනය වේ.

| පාර්ශවය | ප්‍රධාන නියාමනය සහ පනත | අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර |
|---|---|---|
| බලශක්ති සහ අංශ පාලනය | ▪ විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය<br>▪ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL)<br>▪ 1961 අංක 28 දරණ CPC පනත | ප්‍රතිපත්ති, අංශ නියාමනය, බලපත්‍ර |
| පරිසර සහ තිරසාරභාවය | ▪ මධ්‍යම පරිසර අධිකාරිය<br>▪ ජාතික පාරිසරික පනත<br>▪ පරිසර අමාත්‍යාංශය | විමෝචන, අපද්‍රව්‍ය, බලපෑම් තක්සේරු කිරීම්, විගණන |
| සෞඛ්‍යය සහ ආරක්ෂාව අනුකූලතාව | ▪ කර්මාන්තශාලා ආඥා පනත<br>▪ ජාතික ගිනි රෙගුලාසි | සේවා ස්ථාන ආරක්ෂාව, ගිනි ආරක්ෂාව, අවදානම් පාලනය |
| වෙළඳාම සහ රේගුව | ▪ ශ්‍රී ලංකා රේගුව<br>▪ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | ආනයන, තීරුබදු, නිදහස් කිරීම් |
| මූල්‍ය අනුකූලතාව | ▪ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව<br>▪ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය/මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත<br>▪ ජාතික විගණන පනත | බදු, විගණනය, මූල්‍ය විනිවිදභාවය |
| කම්කරු සහ මානව සම්පත් රෙගුලාසි | ▪ කම්කරු අමාත්‍යාංශය<br>▪ කම්කරු නීති සහ කාර්මික ආරවුල් පනත | සේවක අයිතිවාසිකම්, ප්‍රතිලාභ, අනුකූලතාව |
| ප්‍රසම්පාදන සහ පාලනය | ▪ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | විනිවිද පෙනෙන මූලාශ්‍ර, මහජන වගවීම |
| ගුණාත්මකභා-වය සහ ප්‍රමිත | ▪ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>▪ ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය | නිෂ්පාදන ගුණාත්මකභාවය, ප්‍රමිතිකරණය |
| ජාත්‍යන්තර බැඳීම් | ▪ ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) | සමුද්‍ර ඉන්ධන අනුකූලතාව, ඉන්ධන සැපයුම් ප්‍රමිතීන් |

## පාරිසරික, සෞඛ්‍යය, ආරක්ෂාව සහ තිරසාරභාවය (EHSS)

පාරිසරික සහ ආරක්ෂක රෙගුලාසි වල අඛණ්ඩ දැඩි වීම හේතුකොටගෙන, ජාතික විමෝචන ප්‍රමිතීන්, අන්තරායකර ද්‍රව්‍ය හැසිරවීමේ නීති සහ වෘත්තීය සෞඛ්‍යය රාමු ආදී ශෛතික සහ අනුකූලතා රාමු සපුරාලීම සඳහා CPSTL එහි මෙහෙයුම් ක්‍රියාපටිපාටි කල්තියා වැඩිදියුණු කර ඇත. 2024 වසර තුළ, අපි ඒ හා සම්බන්ධ ගැටළු වලට ප්‍රතිචාර සූදානම සහ ගිනි ආරක්ෂණ සූදානමෙහි සැලකිය යුතු දියුණුවක් අත්කර ගත්තෙමු.

| ආධාරක කරුණු | උපායමාර්ගික අවධානය | ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාමාර්ග | බලපෑම |
|---|---|---|---|
| පරිසරය | පාරිසරික පියසටහන (FOOT PRINT) අවම කිරීම | විමෝචන නිරීක්ෂණය, ජල සංරක්ෂණය, අපද්‍රව්‍ය වෙන් කිරීම | අනුකූලතාව වැඩි කිරීම, කාබන් විමෝචනය අඩු කිරීම |
| සෞඛ්‍යය | සේවක යහපැවැත්ම සහතික කිරීම | වාර්ෂික වෛද්‍ය පරීක්ෂණ, දැනුවත් කිරීමේ ව්‍යාපාර | සේවක නොපැමිණීම අඩු කිරීම, සෞඛ්‍යය සම්පන්න ශ්‍රම බලකායක් |
| ආරක්ෂාව | හානි වලින් තොර සංස්කෘතිය | ආරක්ෂිත අභ්‍යාස, PPE අනුකූලතාව, සිදුවීම් වාර්තා කිරීමේ පද්ධති | අනතුරු සිදුවීමේ අනුපාතය අවම කිරීම සහ අනතුරු වලින් මරණ සිදුවීමේ අනුපාතය ශූන්‍ය කිරීම |
| තිරසාරභාවය | දිගුකාලීන සම්පත් කාර්යක්ෂමතාව | සූර්ය බලශක්ති ව්‍යාපෘති, ඉන්ධන භාවිතයේ නාස්තිය අඩු කිරීම | පිරිවැය කාර්යක්ෂමතාව, පරිසර හිතකාමී වෙළඳ නාම අනන්‍යතාවය |
| නියාමන අනුකූලතාව | ජාතික සහ ගෝලීය EHSS ප්‍රමිතීන් | අනුකූලතා විගණන | හඳුනාගැනීම සහ අවදානම් අවම කිරීම |
| පාර්ශවක-රුවන්ගේ සහභාගීත්වය | විනිවිද භාවයෙන් යුතු, EHSS පිළිබද සන්නිවේදනය | තිරසාරභාවය පිළිබඳ වාර්තා, ප්‍රජා උපදේශන | ඉහළ විශ්වාසය, ශක්තිමත් කොටස්කරුවන්ගේ සබඳතා |

## අනාගත දැක්ම සහ ඒ සඳහා වූ උපායමාර්ගික ප්‍රතිචාරය

අනාගතය දෙස බලන විට, CPSTL බලශක්ති සුරක්ෂිතභාවය, තිරසාර යටිතල පහසුකම් ආයෝජන සහ මෙහෙයුම් විශිෂ්ටත්වය කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීමට අපේක්ෂා කරන අතර ඉදිරි වසර සඳහා පහත උපායමාර්ගික අරමුණු සඳහා නැඹුරුවක් දක්වා ඇත.

- ප්‍රාග්ධන වැඩිදියුණු කිරීම් හරහා ගබඩා සහ බෙදාහැරීමේ හැකියාව වැඩි දියුණු කිරීම
- සැපයුම් දාමයේ සියළුම අංශ හරහා ඩිජිටල් ඒකාබද්ධ කිරීම වේගවත් කිරීම
- පරිසර, සෞඛ්‍යය, ආරක්ෂාව සහ තිරසාරත්වය (EHSS) පිළිබඳ කාර්ය සාධන අධීක්ෂණය සහ තිරසාර වාර්තාකරණය තවදුරටත් ගැඹුරු කිරීම
- ජාතික බලශක්ති විවිධාංගීකරණ උපායමාර්ග සඳහා සහාය වීම

තවද, අපගේ ප්‍රායෝගික අවදානම් කළමනාකරණය, ආයතනික පාලන ක්‍රමවේදය තවදුරටත් ශක්තිමත් කිරීම සහ පාර්ශවකරුවන්ගේ වටිනාකම සඳහා ඇති කැපවීම තුළින් වඩාත් ක්‍රමානුකූල මෙහෙයුම් පරිසරයක් හරහා ගමන් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

# මූල්‍ය ප්‍රාග්ධනය

## මූල්‍ය සමාලෝචනය

දිගුකාලීන මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ කොටස්කරුවන්ගේ විශ්වාසය සහතික කරමින් ඛනිජ තෙල් ක්ෂේත්‍රයට විශේෂිත සේවාවන් සැපයීමේ අපගේ හැකියාවේ ස්ථාවරත්වය මූල්‍ය ප්‍රාග්ධනයයි. 2024 වර්ෂයේ දී අපගේ කොටස් හිමියන් දෙදෙනාගේ අපේක්ෂාවන් සහ කර්මාන්තයේ ප්‍රාග්ධන තීව්‍ර ස්වභාවය සමඟ සමපාත වූ විචක්ෂණශීලී සහ විනිවිද පෙනෙන මූල්‍ය කළමනාකරණ ප්‍රවේශයක් අපි පවත්වාගෙන ගියෙමු.

අපගේ මූල්‍ය උපායමාර්ගය ද්‍රවශීලතාවය පවත්වා ගැනීම, කාරක ප්‍රාග්ධනය ප්‍රශස්ත කිරීම සහ උපකරණ, ආරක්ෂාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා තීරණාත්මක ආයෝජන සඳහා සහාය වීම කෙරෙහි මූලික අවධානය යොමු කරන ලදි. මෙම වාර්තාව මගින් අපගේ කාර්ය සාධනය, ප්‍රාග්ධන ව්‍යුහය සහ අඛණ්ඩ සේවා කොන්ත්‍රාත්තු, ශ්‍රම බලකායේ සූදානම සහ අනාගත වර්ධන අවස්ථා සඳහා සහාය වීම සඳහා අරමුදල් යොදවා ඇති ආකාරය ගෙනහැර දක්වයි.

## මූල්‍ය කාර්ය සාධනය

### ආදායම

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා සමාගම රු. බිලියන 18.9ක ආදායමක් වාර්තා කළ අතර එය පෙර වසරේ රු. බිලියන 10.1ට සාපේක්ෂව 86%ක වැඩිවීමකි. වර්ෂය තුළ ප්‍රතිදාන ආදායම මුළු ආදායමෙන් 77%ක් වූ අතර ප්‍රවාහන ආදායම 23%කින් දායක විය. බහුතර කොටස තියෝජනය කරමින් ප්‍රතිදාන ආදායම අඛණ්ඩව පැවතියද, ආදායම් වර්ධනයට ඉහළම දායකත්වය ලැබුණේ ප්‍රවාහන ආදායමෙනි. ප්‍රවාහන ගාස්තු වැඩිවීම සහ ඉන්වොයිසි ක්‍රමයේ පටිපාටිමය වෙනස මෙයට හේතු විය. සමස්ථ විකුණුම් පරිමාව පෙර වසර හා 11% කින් වැඩි වූ අතර එය ආදායම් ඉහළ යාමේ ප්‍රවණතාවයට තවදුරටත් සහාය විය.




### ලාභදායීතාවය

ආදායම වැඩිවීමට අනුකූලව, 2023 වසරේදී රු. බිලියන 3.3ක් ලෙස පැවති දළ ලාභය 2024 වර්ෂයේදී රු. බිලියන 9.3ක් දක්වා වර්ධනය විය. ඒ අනුව 2023 දී 33%ක් වූ දළ ලාභ ආන්තිකය 2024 දී 49%ක් ලෙස වාර්තා විය.




2024දී සමාගම රු. බිලියන 4.6ක මෙහෙයුම් ලාභයක් වාර්තා කළ අතර එය 25%ක මෙහෙයුම් ලාභ ආන්තිකයකි. එය 2023 වසරේ වාර්තා වූ 6%ක මෙහෙයුම් අලාභ ආන්තිකයට වඩා සැලකිය යුතු දියුණුවකි.







සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, බදු පෙර ලාභය රු. බිලියන 4.9ක් ලෙස වාර්තා වූ අතර එය 2023 වර්ෂයේදී රු. බිලියන 0.3ක අලාභයකි. ආදායමේ වැඩිවීම

මෙම වර්ෂය සඳහා ලාභයට හේතු විය.

පෙර වසරට සාපේක්ෂව වර්ෂය තුළ පරිපාලන වියදම් 12% කින් ඉහළ ගොස් ඇත. සමාගමේ අනෙකුත් ආදායම් අතරට රසායනාගාර ආදායම, සේවක ණය සඳහා පොලී ආදායම, ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු ආදිය ඇතුළත් වේ.

මූල්‍ය ආදායම ස්ථාවර තැන්පතු වැනි ආයෝජන වලින් ලැබෙන ආදායමෙන් සමන්විත වේ. වසර තුළ ආයෝජන වැඩිවීම ප්‍රධාන වශයෙන් ආයෝජන ආදායමේ වැඩිවීමට හේතු වූ අතර එය 9% ක වැඩිවීමකි. (පසුගිය වසරවල ඉහළම කාර්ය සාධනය නියෝජනය කරමින්) සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා බදු පසු ලාභය රුපියල් බිලියන 3.3ක් වූ අතර 2023 දී එය රුපියල් බිලියන 0.3 කි.

සමාගමේ අනෙකුත් විස්තීර්ණ ආදායම (OCI) ප්‍රධාන වශයෙන් ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන ලාභය සහ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වලින් සමන්විත විය.

## මූල්‍ය තත්ත්වය

### මුළු වත්කම්




සමාගමේ වත්කම්වලින් 66% ක් දේපළ, පිරියත සහ උපකරණවල ආයෝජනය කර ඇති අතර, එය අපගේ ප්‍රාග්ධන මූලික වූ මෙහෙයුම් ස්වභාවය පිළිබිඹු කරයි. තවද පද්ධතියේ තිරසාර සේවා සැපයීම සහ ආදායම් උත්පාදනය සහතික කරමින් යටිතල පහසුකම් සහ මෙහෙයුම් ධාරිතාව සඳහා අපගේ දිගුකාලීන කැපවීම පෙන්නුම් කරයි. වත්කම් වලින් සැලකිය යුතු කොටසක් වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා වෙන් කර ඇති යහපත් මුදල් ප්‍රවාහයක් පවත්වාගෙන යාම සහ කාරක ප්‍රාග්ධන පීඩනය අවම කිරීම වෙනුවෙන් සමාගම විසින් අඛණ්ඩව ණය අවදානම සහ ලැබිය යුතු පිරිවැටුම නිරීක්ෂණය කරයි.

මුදල් හිමිකම මුළු වත්කම් වලින් 7%ක් නියෝජනය කරන අතර, එමගින් කෙටි කාලීන බැඳීම් සහ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා සමාගම ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගෙනයන බව පෙන්නුම් කරයි.




සමාගමේ වත්කම් පදනම භෞතික යටිතල පහසුකම්වල ශක්තිමත් පදනමක් පෙන්නුම් කරන අතර ම ද්‍රවශීලතාවය සහ ලැබිය යුතු දේ කළමනාකරණය සඳහා විනයගරුක ප්‍රවේශයක් පිළිබිඹු කරයි. අපගේ මූල්‍ය ප්‍රාග්ධන වෙන් කිරීම, වර්ධනය, කාර්යක්ෂමතාව සහ වටිනාකම් සංරක්ෂණය යන අපගේ දිගුකාලීන උපාය මාර්ගයට අනුකූලව පවතී. වෙනස් වෙමින් පවතින වෙළෙඳපොළ පරිසරයක් තුළ මෙහෙයුම් ශක්තිමත්භාවය සහ මූල්‍ය නම්‍යශීලීභාවය යන දෙකම සහතික කිරීම සඳහා අපගේ වත්කම් මිශ්‍රණය ප්‍රශස්ත කිරීමට අපි කැපවී සිටිමු.

2024 වසර අවසානයේ ශේෂ පත්‍රයෙහි ජංගම වත්කම්, මුළු වත්කම් වලින් 69%ක් ලෙස දක්වා ඇත. වසර තුළ සිදුවූ ප්‍රධාන සංවර්ධනයක් වන ඉඩම් සහ ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර වත්කම් වල ධාරණ අගය රු. බිලියන 24ක් ලෙස සැලකිය යුතු අගයකින් වැඩිවිය.

2023 දී රු. බිලියන 32.4 ක් වූ මුළු වත්කම් පදනම 2024 දී 90%කින් වර්ධනය වී රු. බිලියන 61 ක් බවට පත්විය. මෙම සැලකිය යුතු වර්ධනය නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ බලපෑම සහ වැඩිදියුණු කරන ලද මෙහෙයුම් කාර්ය සාධනය යන දෙකම පිළිබිඹු කරයි. එමෙන්ම ඉහළ ආදායම් උත්පාදනය සහ දිගුකාලීන ලැබිය යුතු මුදල් සාර්ථකව එකතු කිරීම හේතුවෙන් මුදල් හා මුදල් සමාන දෑ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

### කාරක ප්‍රාග්ධනය

2019 සිට 2024 දක්වා වසර 6ක කාලය තුළ සමාගම විසින් ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වයක් පවත්වා ගෙන ගොස් ඇති අතර, එය විචක්ෂණශීලී කාරක ප්‍රාග්ධන කළමනාකරණය සහ වත්මන් වගකීම් සඳහා විනයගරුක ප්‍රවේශයක් පිළිබිඹු කරයි.

ද්‍රවශීලතාවයේ ප්‍රධාන දර්ශකයක් වන ජංගම වත්කම් අනුපාතය, මෙම කාලය පුරා 5.0 ට වඩා අඛණ්ඩව පැවති අතර, එමඟින් සමාගමට තම කෙටිකාලීන බැඳීම් සුවපහසු ලෙස සපුරාලීමට ඇති හැකියාව පෙන්නුම් කරයි. 2023 දී 6.62 ට සාපේක්ෂව 2024 දී වත්මන් අනුපාතය 5.53ක් විය. පෙර වසරට වඩා තරමක් අඩු වුවද, මෙම අනුපාතය යහපත් ද්‍රවශීලතාවක් පෙන්නුම් කරයි.

ක්ෂණික වත්කම් අනුපාතය ද ශක්තිමත් ව පැවති අතර, 2023 දී පැවති 6.23 ට සාපේක්ෂව 2024දී එය 5.28ක් ලෙස වාර්තා කළේය. මෙම පහත වැටීමට හේතු වී ඇත්තේ ජංගම වගකීම් වල වැඩිවීමක් වන අතර එය 2023 දී පැවති රු. මිලියන 2,262 සිට 2024 දී රු. මිලියන 3,473 දක්වා ඉහළ ගියේය. එමඟින් ජංගම වත්කම් වල වර්ධනය හිලව් කර මෙහෙයුම් අවශ්‍යතා සඳහා සහාය වීමට කෙටිකාලීන සම්පත් ක්‍රියාකාරීව යෙදවීමක් පෙන්නුම් කරයි.




## වත්කම් පිරිවැටුම් අනුපාතය

වත්කම් පිරිවැටුම් අනුපාතය මගින් සමාගම තම වත්කම් විකුණුම් උත්පාදනය කිරීම සඳහා භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව මනිනු ලබන අතර 2023 දී 31%ක් වූ වත්කම් පිරිවැටුම් අනුපාතය 2024 දී 40%ක් ලෙස දැක්වූයේ යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමිනි. මෙම වර්ධනයට හේතු වී ඇත්තේ 2024 වර්ෂයේ දී ආදායම රු. මිලියන 18,898 ක් (පෙර වසරට වඩා 86%ක වර්ධනයක්) දක්වා සැලකිය යුතු ලෙස වැඩිවීමයි. වැඩිදියුණු කරන ලද මෙහෙයුම් කාර්ය සාධනය ද ඊට හේතු විය. 2023 වන විට පැවැති රු. මිලියන 32,228 ක් වූ මුළු වත්කම් රු. මිලියන 61,285ක් දක්වා පුළුල් වූයේ ප්‍රධාන වශයෙන් වසර තුළ සිදු කරන ද ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීම හේතුවෙනි.




## හිමිකම් සහ වගකීම්

2024 වසර අවසානය වන විට කොටස්කරුවන්ගේ අරමුදල් වන රු.බිලියන 46 ක් එනම්, සමාගමේ වත්කම් වලින් 76% ක් මගින් හොඳින් ප්‍රාග්ධනීකරණය වී ඇත. සමාගම 2016 දී සියළුම ණය ගැනීම් ගෙවා දැමූ අතර මෙම වසරේ නව ණය ගැනීම් කිසිවක් ලබා ගෙන නොමැත. CPSTL හි මුළු වගකීම 2023 දී රු. බිලියන 5.0ක් වූ අතර එය 2024 දී රු. බිලියන 14ක් දක්වා වර්ධනය වී ඇත.

ප්‍රාග්ධන ව්‍යුහය ගතානුගතිකව පවතින අතර, මූල්‍ය නම්‍යශීලීතාවය සහ ඔරොත්තුදීමේ හැකියාව පවත්වා ගනිමින් අනාගත ආයෝජන මුලපිරීම් සඳහා අරමුදල් සැපයීමට සමාගම මූලධනය යොදවයි.




## හිමිකම් මත ප්‍රතිලාභය

සමාලෝචිත වර්ෂය සඳහා සමාගම 7%ක කොටස් මත ප්‍රතිලාභයක් වාර්තා කර ඇති අතර එය පෙර වසරේ 0.1%කි. 2024 දී සීඝ්‍ර යථා තත්ත්වයට පත්වීම, සමාගමේ නව්‍යකරණ මූල්‍ය ශක්තිය සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ධනාත්මක දර්ශකයකි.




## තෝලනය සහ ප්‍රාග්ධන ව්‍යුහය

සමස්ථයක් වශයෙන්, සමාගමේ තෝලන අනුපාතය 2023 වන තෙක් අඩු සහ ස්ථාවරව පැවැති අතර එය ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පෙන්නුම් කරයි. සමාගමේ තෝලන අනුපාතය වසර ආරම්භයේ දී 22%ක් ලෙස පැවැති අතර 2024 වසර අවසානයේ 31%ක් දක්වා ඉහළ ගොස් ඇත.







## කොටස් හිමියන්ගේ වටිනාකම් නිර්මාණය

| | 2024 | 2023 |
|---|---|---|
| කොටසක ඉපැයීම් (රු.) | 4.51 | 0.05 |
| කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.) | 62 | 35 |

2023 සහ 2024 අතර කොටසක ඉපැයීම සහ කොටසක ශුද්ධ වත්කම් වටිනාකම යන දෙකෙහිම සැලකිය යුතු වර්ධනය, සමාගමේ මූල්‍ය තත්ත්වයේ සහ කොටස් හිමියන්ගේ වටිනාකමෙහි ශක්තිමත් දියුණුවක් පෙන්නුම් කරයි. මෙය සාර්ථක උපායමාර්ගික මුලපිරීම් සහ වැඩිදියුණු කළ ලාභදායීතාවය ඉස්මතු කරයි. එමඟින් සමාගම තිරසාර අනාගත වර්ධනයක් සඳහා ස්ථානගත කරයි.

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## කොලොන්නාව පර්යන්තයේ සිට කොළඹ වරායේ සේරම් ගේට්ටුව දක්වා පවතින 10" විෂ්කම්භය සහිත නල මාර්ගය 18" විෂ්කම්භය සහිත නව නල මාර්ගයක් ලෙස ප්‍රතිස්ථාපනය කිරීම

CPSTL විසින්, කොළඹ වරායේ සේරම් ගේට්ටුව දක්වා දිවෙන, වසර ගණනාවක් පැරණි 10" විෂ්කම්භයෙන් යුත් නල මාර්ගය 18" විෂ්කම්භයෙන් යුත් නව නලයකින් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම ඉන්ධන ප්‍රවාහන යටිතල පහසුකම් පද්ධතිය නවීකරණය කිරීම් මගින් දිවයින පුරා නිසිපරිදි බාධාවක් නොමැතිව අඛණ්ඩව ඉන්ධන සැපයීමට සමාගමට ඇති හැකියාව සහතික කරයි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් භූමියක් හරහා දිවෙන කොළඹ වරාය හා කොලොන්නාව පර්යන්තය සම්බන්ධ කරන භූගත නල පහක් තිබේ. එහෙත්, සුදු තෙල් ප්‍රවාහනය සඳහා භාවිතා කරන්නේ නවීකරණය කර තිබූ 12" නල පද්ධතිය සහ අවුරුදු 75ක පරණ 10" නල පද්ධතිය යන ද්විත්වය පමණි. මෙම නලවල ධාරිතා සීමාව සහ තත්ත්වයේ නුසුදුසුභාවය හේතුවෙන්, වෙළඳ සමාගම් වලට වැඩි ප්‍රමාද ගාස්තු, බාගත කිරීම් සඳහා දීර්ඝ කාලයක් ගතවීම් සහ කාන්දු වීමෙන් සිදුවන අලාභ වලට මුහුණ දීමට සිදුවී ඇත.

ආරක්ෂිත හා විශ්වාසදායක පද්ධතියක් ඇති කිරීමේ අත්‍යවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, බලශක්ති අමාත්‍යාංශය සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සමඟ සාකච්ඡා කිරීමෙන් පසු CPSTL විසින් මුල් අවධියේදී සැලසුම් කර තිබූ 12" විෂ්කම්භය සහිත නලය වෙනුවට 18" විෂ්කම්භය සහිත නලයක් ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම තීරණය ආයතනයේ මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. එසේම නව 18" විෂ්කම්භය සහිත නලය පිහිටුවන නිශ්චිත මාර්ගය සොයාගැනීම සඳහා සවිස්තර මාර්ග සමීක්ෂණයක්ද සිදු කර ඇත.

නව නලය ස්ථාපනය කිරීමෙන් පසුව ඉන්ධන බාගත කිරීමේ ප්‍රමාද අඩුකරගත හැකි අතර අලාභය අවම කරමින් ජාතික බලශක්තිමය ආරක්ෂාව වැඩි දියුණු වනු ඇත. මෙම ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සහ තවත් කොටස්කාර ආයතන කිහිපයක් එනම්, මාර්ග සංවර්ධන අධිකාරිය, ලංකා විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, කොළඹ මහා නගර සභාව ද සමඟ සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කෙරේ. දැනට, නව නලය සඳහා අවශ්‍ය යෙදවුම් මිලදී ගැනීම සහ ගොඩනැගීමේ මිලදී ගැනීම් සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතින අතර ව්‍යාපෘතිය 2027 වන විට නිමකිරීමට සැලසුම් කර ඇත.




කොලොන්නාව පර්යන්තයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පරිශ්‍රය දක්වා යෝජිත නල මාර්ගය සඳහා වන මාර්ගය

## කන්කසන්තුරෙහි පිහිටි තොග තෙල් ගබඩාව නව භූමියක ප්‍රතිස්ථාපනය කිරීම

කන්කසන්තුරෙයි (KKS) හි පිහිටි CPSTL තොග තෙල් ගබඩාව නව භූමියක ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියෙහි කටයුතු සිදුකෙරෙමින් පවතින අතර එම භූමිය ශ්‍රී ලංකා රජයට අයත් දිගුකාලීන කල් බදු පදනම යටතේ ක්‍රියාත්මක වන්නකි.

අක්කර හයක් පමණ විශාල මෙම නව භූමිය CPSTL විසින් වසර 30 ක කල්බදු පදනම මත ලබා ගෙන ඇත. මේ දක්වා මෙහෙයුම් සිදුකරනු ලැබූ තොග ගබඩා භූමිය නැවත භාවිතා කිරීමට රජය සැලසුම් කර ඇති බැවින් මෙම ප්‍රතිස්ථාපනය අත්‍යවශ්‍ය කරුණක් වන අතර නව ස්ථානයක නැවත පිහිටුවීමෙන් තොග ගබඩාවට අවශ්‍ය පරිදි මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වන යටිතල පහසුකම් ගොඩනැගීමට සහ පුළුල් කිරීමට CPSTL හට ඉඩ සැලසේ.

රුපියල් මිලියන 169.6 ක ආයෝජන වටිනාකමකින් යුතු මෙම ව්‍යාපෘතිය මගින් උතුරු පළාතේ ඉන්ධන ගබඩා කිරීම සහ බෙදාහැරීමේ දිගුකාලීන සංවර්ධනයට සහාය වන අතර, ජාතික ඉන්ධන යටිතල පහසුකම් සැපයීමේ සැලසුම් සමඟ අනුකූල වේ.

වර්තමාන ප්‍රාදේශීය ඉන්ධන අවශ්‍යතා සපුරාගැනීමට සහ අනාගතයේදී රජය විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය සංවර්ධන කටයුතු සඳහා සූදානම සහතික කිරීමට මෙම තොග ගබඩාවේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය ඉතා වැදගත් වේ. ව්‍යාපෘතියෙන් 40% ක් 2024 වසර අග වන විට අවසන් කර ඇත.



ටැංකි රථ පිරවුම් ගැන්ට්‍රිය ඉදිකිරීම





තඩාග අංගනය ඉදිකිරීම

## සූර්ය බල PV විදුලි උත්පාදනය ඒකාබද්ධ කිරීම

මෙම ව්‍යාපෘතිය සමාගමේ දිගුකාලීන මෙහෙයුම් උපායමාර්ගික සැලැස්මේ කොටසක් වන අතර, එයින් බලශක්ති කාර්යක්ෂමතාව වැඩි කිරීම, මෙහෙයුම් වියදම් අඩු කිරීම සහ රටේ බලශක්ති මිශ්‍රණය තුල පුනර්ජනනීය බලශක්තියේ භාවිතය ඉහළ නැංවීමට අරමුණු කරගත් ජාතික ඉලක්ක සමඟ ගැළපෙන ව්‍යාපෘතියක් වේ. 2021 දී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු, CPSTL විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) සහ ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO) වෙතින් අවශ්‍ය අවසර ලබා ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක කෙරේ.

අදියර 1 ලෙස, CPSTL 2024 ජූලි මාසයේදී, කොලොන්නාව පර්යන්තයේ ඇති ගොඩනැගිලි වල වහල අවකාශය භාවිතා කරමින් 300kWp ධාරිතාවයෙන් යුත් වහල සූර්ය විද්‍යුත් (PV) උත්පාදන පද්ධතියක්, TF-02 ට්‍රාන්ස්ෆෝමරයට සම්බන්ධ කර, ක්‍රියාත්මක කර ඇත.

අදියර 2 ලෙස, 287 kWp ධාරිතාවයෙන් යුත් සූර්ය PV විදුලි උත්පාදන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට CPSTL සූදානම් වන අතර, මිලදී ගැනීම් ක්‍රියාවලියට අදාල ප්‍රසම්පාදන කටයුතු දැනට ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය 2025 ජූලි වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

මෙම සූර්ය පැනල (PV) පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක වීම තුලින් සමාගම විසින් නව තාක්ෂණයට අනුකූල වීමේ එක් පියවරක් වන අතර, එය ජාතික පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයට දායක වන අතර, සමාගමේ මෙහෙයුම්වල කාබන් පියවර අඩු කිරීමටද ඉතා වැදගත්ය.





කොලොන්නාව පර්යන්තයෙහි 300kWp වෝල්ටීයතා සූර්යබල (PV) උත්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීම

## තඩාග ප්‍රතිසංස්කරණය සහ මුතුරාජවෙල පර්යන්තයේ අභ්‍යන්තර පාවෙන වහල සහිත (IFR) තඩාග අංක 09 සහ තඩාග අංක 10 ස්ථාපනය

CPSTL සමාගම, මුතුරාජවෙල පර්යන්තයෙහි තඩාග අංක 09 සහ තඩාග අංක 10 ලෙස නම් කර ඇති පෙට්‍රල් ගබඩා තඩාග දෙක මත විශාල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම සෑම තඩාගයක්ම ඝන මීටර 10,000ක ධාරිතාවයක් දරණ අතර, 2003 වර්ෂයේ සිට ඩීසල් ගබඩා කිරීමට භාවිතයට ගන්නා ලදී. පසුව 2021 දී, පීඩන රික්තක වෑල්ව් සහ සම්බන්ධ නල පද්ධති වෙනස්කිරීම් සිදු කිරීමෙන් පසු පෙට්‍රල් ගබඩා කිරීමට යෝග්‍ය පරිදි පරිවර්තනය කරන ලදී.

පෙට්‍රල් අතිශය වාෂ්පීකරණශීලී නිෂ්පාදනයක් වන බැවින්, ස්ථිර වහල ඇති තඩාගවල පීඩන රික්තක PV වෑල්ව් පාලනය සමඟ වාෂ්පවීමෙන් අලාභයන් සිදු වේ. අභ්‍යන්තර පාවෙන වහල (IFR) නොමැති විට, ද්‍රවය මත ඇති වාෂ්ප අවකාශය හයිඩ්‍රොකාබන් නිකුත් වීම වැඩි කරන අතර, එය නිෂ්පාදන අලාභ හා ගිනි ගැනීමේ අවදානමද ඉහළ දමයි. කෙසේ නමුත්, අභ්‍යන්තර පාවෙන වහල IFR පද්ධති ද්‍රව මතුපිට සෘජුව පවතින නිසා, වාෂ්ප අවකාශය අඩු කරමින් වාෂ්පීකරණය සම්පූර්ණයෙන් අඩු කරයි. මෙයින් වාෂ්පශීලී කාබනික සංයෝගය (Volatile Organic Compound) නිකුත් වීම අඩුවීම, ගිනි ගැනීම පිළිබඳ අවධානම අඩු වීම හා ආරක්ෂාව වැඩිවීම, සිදුවන අතර කර්මාන්තයේ විශිෂ්ට පරිචයන් හා පාරිසරික සම්මතයන්ටද අනුකූල වීම සහතික කෙරේ.

අභ්‍යන්තර පාවෙන වහල පිහිටුවීමට පෙර, තඩාගවල සැලසුම් සහ මෙහෙයුම් අවශ්‍යතා පිළිබඳව මූලික ව්‍යුහමය වෙනස්කිරීම් පිළිබඳ අවධානය යොමු කරයි. මෙහිදී, පීඩන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා වහල වායු විවර එකතු කිරීම, අභ්‍යන්තර ප්‍රවේශය පහසු කිරීම සඳහා අමතර මෑන්හෝල් පිහිටුවීම, ෂෙල් නෝසල් ශක්තිමත් කිරීම සහ අභ්‍යන්තර පාවෙන වහල IFR පද්ධතියට ගැළපෙන වෙනත් ව්‍යුහමය වෙනස්කිරීම් සිදු කෙරේ.

මෙම මෙහෙයුම් සහ ආරක්ෂාකාරී වාසි හඳුනාගෙන, CPSTL සමාගම අභ්‍යන්තර පාවෙන වහල පිහිටුවීමේ ව්‍යාපෘතිය 2023 දී ආරම්භ කරන ලදී. අභ්‍යන්තර පාවෙන වහල එකලස් කිරීම් නිම කර 2025 මැද භාගය වන විට භාර දීමට සැලසුම් කර ඇති අතර වෙනස්කම් කිරීමේ වැඩසටහන 2025 මුල් භාගයේ ආරම්භ කිරීමට කටයුතු කෙරේ. පර්යන්තයේ මෙහෙයුම් අඛණ්ඩව තබාගැනීම සඳහා, එක් තඩාගයක් සම්පූර්ණ කල පසු අනෙක් තඩාගය ආරම්භ කරමින්, අනුක්‍රමිකව මෙම කාර්ය සිදු කෙරෙනු ඇත.

මෙම යාවත්කාලීන කිරීම සම්පූර්ණ වූ විට, පෙට්‍රල් වාෂ්පීකරණ මගින් සිදුවන අලාභ අඩුවීම, නිෂ්පාදන ගබඩා කිරීම හා පාලනය වැඩිවීම, ආරක්ෂාව වැඩිවීම සහ තඩාග භාවිතා කල හැකි කාල සීමාවද දීර්ඝ වන අතර, මෙමගින් පර්යන්තයේ ගබඩා කිරීමේ කටයුතු වල කාර්ය සාධනය ප්‍රශස්ත කරයි.





තඩාග අංක 09 සහ අංක 10 හි අභ්‍යන්තර පාවෙන වහල සහිත තඩාග (IFR) ස්ථාපනය

## කොලොන්නාව පර්යන්තයේ තඩාග අංක 21 අළුත්වැඩියා කිරීම

කොලොන්නාව පර්යන්තයේ තඩාග අංක 21 යනු 1998 දී ඉදිකරන ලද අභ්‍යන්තර පාවෙන වහලක් සහිත සිරස් කේතු

හැඩයෙන් යුතු ස්ථිර වහල සහිත තඩාගයකි. මෙහි මුළු ධාරිතාව ඝන මීටර 21,324 (විෂ්කම්භය - මීටර් 41.04, උස - මීටර් 17.06) වේ. එය දැනට ගෑසොලින් ගබඩා කිරීම සහ මුහුදු ජලය සේදීම සඳහා භාවිතා කරයි.

2022 ජනවාරි මාසයේදී CPSTL හි සිදු කරන ලද පුළුල් පරීක්ෂාවකින් පසුව අංක 21 තඩාගය අලුත්වැඩියා කිරීම ආරම්භ කරන ලද අතර, වෑල්ඩින් පිරවීම සහ සම්පූර්ණ නැවත පින්තාරු කිරීම ඇතුළුව පතුලේ අලුත්වැඩියාවන් සඳහා ක්ෂණික අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.

පරීක්ෂණ ඒකකයේ නිර්දේශය මත පදනම්ව, CPSTL විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව අංක 21 තඩාගයේ අලුත්වැඩියා කටයුතු කරගෙන යාමට තීරණය කර ඇත. කාර්යයේ විෂය පථයට ව්‍යුහාත්මක අලුත්වැඩියාවන් සහ පින්තාරු කිරීම ඇතුළත් වේ.

සැලසුම් කර ඇති අලුත්වැඩියාවන් මගින් තඩාගයේ මෙහෙයුම් ආයු කාලය තවත් වසර 10 කින් දීර්ඝ කිරීමට අපේක්ෂා කෙරේ. වැඩ කඩිනමින් සිදු කිරීමට අපොහොසත් වීමෙන් සම්පූර්ණ තඩාග පතුල ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතාවයක් ඇති වන අතර වහල ආවරණයේ ආයු කාලය අඩු විය හැකිය.

මේ අනුව, අළුත්වැඩියා කටයුතු 2024 නොවැම්බර් මාසයේ ආරම්භ කර ඇති අතර, දැනට එහි වැඩ සිදුකරමින් පවතින අතර 2025 මාර්තු වන විට නිම කිරීමට සැලසුම් කර ඇත.



තඩාග අංක 21 හි සිදුවෙමින් පවතින නඩත්තු කාර්යයන්

## කොලොන්නාව සහ තොග ගබඩාවල පිපිරුම්-ප්‍රතිරෝධී ආකාරයේ ආලෝකකරණ සහ ස්විච් ගියර් සවිකිරීම

CPSTL සමාගමට අයත් ඉන්ධන පිරවුම් මධ්‍යස්ථාන 17ක් ඇත. ඒ අතර, කොලොන්නාව පර්යන්තයෙහි කලාප 6ක් සහ තොග ගබඩා 11ක් ඇතුලත් වන අතර, අවුරුදු 40 ඉක්ම වූ දුම්රිය ටැංකි පිරවුම් ගැන්ට්‍රි තුනක්ද ක්‍රියාත්මක වේ. මෑත වසරවල ඉන්ධන ඉල්ලුම ඉහළ යාමත් සමඟ, සවස්කාලයේදී මෙහෙයුම් කටයුතු කිරීමේ අවශ්‍යතාව වැඩි වීම හේතුවෙන් ආලෝකකරණ අවශ්‍යතා පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කෙරුණි.මෙම ඇගයීමේදී, සාමාන්‍ය ආලෝකකරණය ඉන්ධන පිරවීම, වැල්ව් ක්‍රියාත්මක කිරීම, නල සම්බන්ධකරණය වැනි නිරන්තර කටයුතු සඳහා සහ විශේෂ ආලෝකකරණය මුද්‍රා කිරීම සහ ඩිප් මට්ටම් කියවීම් වැනි කාර්යයන් සඳහා යන ද්විත්වයම සලකා බලා ඇත.

අධ්‍යයනයේදී හඳුනා ගන්නා ලද්දේ ආලෝක මට්ටම 12lux සිට 300lux දක්වා වෙනස් වුවද, ඒකාකාරීව විහිදී නොමැති බවයි. උපකරණ ආසන්න ප්‍රදේශවලට පමණක් ප්‍රමාණවත් ආලෝකය ඇති අතර, මැද භාගයේ ආලෝක මට්ටම සීමා වූ 20 lux පමණට අඩුවේ. මෙය මෙහෙයුම්කරුවන්ට අපහසුතා ඇතිකර ඇති අතර, සවස/රාත්‍රී මෙහෙයුම් කටයුතු ප්‍රමාද වීම සහ ආරක්ෂක ගැටලු ඉහළ යාමට හේතු වී ඇත. එම නිසා, සාමාන්‍ය ආලෝකකරණය හා විශේෂ ආලෝකකරණය යන ද්විත්වයම වහාම වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව පැන නැගී ඇත.

ජාත්‍යන්තර ප්‍රමිතිය ISO 8995:2020 - Lighting of Indoor Workplaces යටතේ, වැඩ කරන මතුපිටේ අවම ආලෝක මට්ටම 300 lux ලෙස පවත්වා ගත යුතුය. දැනට, ගැන්ට්‍රි වේදිකා හරහා ආලෝකකරණය අසමාන වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම්වල කාර්යක්ෂමතාව අඩු වේ. එබැවින්, සාමාන්‍ය ආලෝක මට්ටම වැඩි කිරීම හා අසමාන ව්‍යාප්තිය අවම කිරීම සඳහා, පිපිරීම්-ප්‍රතිරෝධී ආරක්ෂිත ආලෝක උපකරණ පිහිටුවීම යෝජනා කර ඇත.

මේ සඳහා වන කොන්ත්‍රාත්තුව 2024 ජූලි මාසයේදී සැපයුම්කරුවෙකු වෙත බාර දෙන ලද අතර, දැනට එම කටයුතු සිදුවෙමින් පවතී.

යෝජිත ආලෝකකරණ සැකැස්මේ ශක්‍යතාව ඇගයීම සඳහා කලාප 1 දුම්රිය ගැන්ට්‍රියේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. ආලෝකකරණ පද්ධති සැලසුම Dialux® මෘදුකාංගය භාවිතයෙන් සිදු කරන ලද අතර, නියමු පරීක්ෂණයෙන් තහවුරු වූයේ දැනට ඇති 22 lux මට්ටම 497 lux දක්වා වැඩි කළ හැකි බවයි. මෙම යෝජිත පද්ධතිය තාක්ෂණිකව ක්‍රියාත්මක කළ හැකි බවත්, රාත්‍රී කාලයේදී සිදු කරන ගැන්ට්‍රි මෙහෙයුම්වල කාර්ය සාධනය හා ආරක්ෂාව සැලකිය යුතු ලෙස වැඩි දියුණු කළ හැකි බවත් පෙන්වා දී ඇත.





කලාප 01 හි ගැන්ට්‍රියක් තුල පිපිරුම්-ප්‍රතිරෝධී ආකාරයේ ආලෝකකරණ සවිකිරීම

## කොලොන්නාව පර්යන්තයේ ඝන මීටර 15,000 තඩාග 03 ක්, ඝන මීටර 7,000 තඩාග 02 ක් සහ ඝන මීටර 5,000 තඩාග 01 ක් ප්‍රසම්පාදනය, ගොඩනැගීම සහ භාවිතයට නැංවීම

CPSTL සමාගම, මුළු ධාරිතාව ඝන මීටර 64,000ක් වන ගබඩා තඩාග 06 ක් ගොඩනැගීමේ ව්‍යාපෘතිය කොලොන්නාව පර්යන්තයේ ආරම්භ කර ඇත. මෙය රුපියල් මිලියන 2,225ක ආසන්න පිරිවැයක් සහිත ව්‍යාපෘතියක් වන අතර, මාස 40ක් තුළ සම්පූර්ණ කිරීමට නියමිතව ඇත. මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ආනයනික ඉන්ධන හා පිරිපහදු කරනු ලබන නිෂ්පාදන ගබඩා කිරීමට අවශ්‍ය ධාරිතාව වැඩි කිරීම වේ. එමඟින් රටේ ඉන්ධන අවශ්‍යතා සපුරා ගැනීම සහ සෑම අවස්ථාවකම අවම වශයෙන් දින 30ක ජාතික අවශ්‍යතාවයට සරිලන තොග සංචිතයක් තබා ගැනීම සහතික කිරීමද සිදු වනු ඇත. ඛනිජ නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම CPSTL සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කාර්යය වන බැවින්, ඝන මීටර 15,000 තඩාග 03 ක්, ඝන මීටර 7,000 තඩාග 02 ක් සහ ඝන මීටර 5,000 තඩාග 01 ක් සඳහා "ප්‍රසම්පාදනය, ගොඩනැගීම සහ භාවිතයට නැංවීම" පිළිබඳ ගිවිසුම 2019 ඔක්තෝබර් මාසයේදී ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය 2023 පෙබරවාරි මාසය වන විට සම්පූර්ණ කිරීමට මූලිකව සැලසුම් කර ඇත.

| තඩාගය | නිෂ්පාදනය | ධාරිතාව (ඝන මීටර) | ඝනත්වය | ධාරිතාව (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|---|
| B තඩාගය | ගැසොලින් 92 | 15,000 | 0.745 | 11,175 |
| C තඩාගය | ගැසොලින් 95 | 15,000 | 0.745 | 11,175 |
| D තඩාගය | ගුවන් තෙල් (Jet A-1) | 15,000 | 0.795 | 11,925 |
| G තඩාගය | ගෑස් ඔයිල් 500ppm | 7,000 | 0.840 | 5,880 |
| H තඩාගය | භූමිතෙල් | 7,000 | 0.795 | 5,565 |
| J තඩාගය | ගෑස් ඔයිල් 10ppm | 5,000 | 0.840 | 4,200 |
| | එකතුව | 64,000 | | 49,920 |

කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන්, CPSTL සමාගම 2022 ජනවාරි මාසයේදී ගිවිසුම අවසන් කළ අතර, කොන්ත්‍රාත්කරු සමඟ නැවත අන්‍යෝන්‍ය එකඟතාවයෙන් යුත් සාමකාමී විසඳුමකට ළඟා වීම සඳහා මේ වන විට සාකච්ඡා කරමින් පවතී.එහි අතරතුර, නව සමාගම් ඉන්ධන වෙළඳපොළට ඇතුළත් වීමත් සමඟ ගබඩා ධාරිතාව පුළුල් කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන, CPSTL සමාගම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ ඉදිරියට ගෙන යාමට තීරණය කර ඇත.ඒ අනුව, 2024 අගෝස්තු මාසයේදී නව ටෙන්ඩර් කැඳවීම සිදු කර ඇති අතර දැනට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවෙමින් පවතින අතර, ව්‍යාපෘතිය 2026 වන විට සම්පූර්ණ කිරීමට නියමිතය.





කොලොන්නාව පර්යන්තයෙහි B තඩාගය සහ D තඩාගය සඳහා අත්තිවාරම ඉදිකිරීම

# මානව ප්‍රාග්ධනය




## අපගේ සේවකයන්: CPSTL හි හදවත:

ඉංජිනේරුවන්, මෙහෙයුම්කරුවන්, පරිසර විශේෂඥයන්, පාරිභෝගික සේවා විශේෂඥයන් සහ වෘත්තීය පුද්ගලයන් ඇතුළු 2000කට අධික විවිධ කණ්ඩායම් වලින් සමන්විත වූ සේවක පිරිස අපගේ සාර්ථකත්වයේ පදනමයි.

## අපගේ සමාජීය වගකීම:

සාර්ථක සමාගමක් යනු ඉතා පුළුල් පරාසයක් තුළ යහපත සඳහා සහාය වීම බව අප විශ්වාස කරමු. CPSTL සමාගම සමාජ සංවර්ධනය, පරිසර සංරක්ෂණය හා තිරසාර ව්‍යාපාර ක්‍රියාකාරීත්වය පිළිබඳ සක්‍රීය භූමිකාවක් ඉටු කරයි. අපි මෙහෙයුම් කටයුතු තුළ උසස් නීතිමය ප්‍රමිතීන් අනුගමනය කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ප්‍රගතිය සඳහා දායකත්වය දැක්වීමට කැප වී සිටිමු.




## වරප්‍රසාද, ප්‍රතිලාභ සහ ඇගයීම්

CPSTL ආයතනයේ ප්‍රතිලාභ සැලැස්ම විනිවිදභාවයෙන් යුක්තව සකසා ඇති අතර එය ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව ව්‍යාපාරය පුරා සත්‍ය හා සාධාරණ ලෙස ඒකාකාරීව නියම ප්‍රමිතීන්ට අනුව සියළුම ශ්‍රේණි වලට පවත්වා ගෙන යයි. නිර්වචනය කරන ලද නිපුණතා රාමුවක් මත පදනම්ව සියලුම සේවකයන් වාර්ෂික කාර්ය සාධන ඇගයීම් වලට භාජනය කරයි.

CPSTL ආයතනයෙහි ස්ථිර සේවකයන්ට ලබාදෙන ප්‍රතිලාභ පහත පරිදි වේ.

| ස්ථිර සේවකයන් සඳහා හිමිවන ප්‍රතිලාභ | විස්තරය |
|---|---|
| නිවාඩු - වාර්ෂික නිවාඩු | දින 14 |
| නිවාඩු - අනියම් නිවාඩු | වැඩ කරන දින 7 |
| නිවාඩු - වෛද්‍ය නිවාඩු | වැඩ කරන දින 21 |
| නිවාඩු - මාතෘ නිවාඩු | වැඩ කරන දින 84ක් සඳහා |
| | අර්ධ වැටුප් දින 84 සඳහා |
| | වැටුප් රහිත දින 84 සඳහා |
| හදිසි අනතුරු නිවාඩු | රාජකාරියේ යෙදී සිටියදී සේවක අනතුරු |
| හිලව් නිවාඩු | මාසයේ සෙනසුරාදා දින 4 සේවය කරන සේවකයාට දින 2ක නිවාඩු ලබා ගත හැක. |
| විශේෂ නිවාඩු | විශේෂ සිදුවීම් අතරතුර (මැතිවරණය, ඇඳිරි නීතිය ආදිය) |
| රාජකාරි නිවාඩු | නිල රාජකාරි සඳහා විශේෂ අවස්ථා වලදී |
| වැටුප් රහිත නිවාඩු | විදේශ අධ්‍යාපන, පුහුණුව, වැඩමුළු ආදිය සඳහා |
| වැටුප් වර්ධක | සේවක රාජකාරි, පැමිණීම සහ හැසිරීම ඇගයීම මත වැටුප් වැඩිවීම |
| දීමනා | ආහාර දීමනා, ගමන් දීමනා, පර්යන්ත දීමනා, පැමිණීමේ දිරි දීමනා, සේවා මුර දීමනා, වාර්ෂික නිවාඩු දිරි දීමනා, ජීවන වියදම් දීමනා, වෘත්තීය දීමනා, සති අන්ත දීමනා, නිල දුරකතන ප්‍රතිලාභ ආදිය |
| ප්‍රසාද දීමනා | වෛද්‍ය නිවාඩු දිරිදීමනා, වාර්ෂික ප්‍රසාද දීමනා |
| ආපදා ණය | මාස 10ක වැටුප, සරල සහනදායී පොලී අනුපාතය, මාසික වාර 60කින් අයකර ගැනීම. |

| | |
|---|---|
| නිවාස ණය | ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම හෝ නිවාස ඉදි කිරීම. සරල සහනදායී පොලී මාසික වාරික 300කින් අයකර ගැනීම හෝ සේවකයාගේ ඉතිරි සේවා කාලය අනුව අයකර ගැනීම. |
| නිවාස අලුත්වැඩියා ණය | නිවාස අලුත්වැඩියා කිරීම සඳහා, සරල සහනදායී පොලී අනුපාත, මාසික වාරික 120කින් ආපසු අයකර ගැනීම. |
| ගෘහ පහසුකම් ණය | ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට සරල සහනදායී පොලී අනුපාත, මාසික වාර 60කින් අයකර ගැනීම. |
| සකසුරුවම් සමිති ණය | මාස 03ක වැටුප. සරල සහනදායී පොලී අනුපාත. මාසික වාර 60කින් අයකර ගැනීම. |
| මොටර් රථ ණය | මොටර් රථ ණය අදාල වන්නේ විධායක නිලධාරීන් සඳහා පමණි. සරල සහනදායී පොලී අනුපාත. මාසික වාර 60කින් අයකර ගැනීම. |
| මෝටර් සයිකල් ණය සහ ත්‍රිරෝද රථ ණය | සරල සහනදායී පොලී අනුපාත. මාසික වාරික 60කින් අයකර ගැනීම. |
| උත්සව අත්තිකාරම් | පොලී නොමැත, මාස 10කින් අයකර ගැනීම. |
| අලුත් අවුරුදු අත්තිකාරම් | සරල සහනදායී පොලී අනුපාත. මාසික වාර 10කින් අයකර ගැනීම. |
| පාසල් පොත් අත්තිකාරම් | පොලී නොමැත, මාස 10කින් අයකර ගැනීම. |
| සම්මාන පිරිනැමීම | සම්මාන පිරිනැමීම සේවකයන්ගේ සේවා කාලය මත රඳා පවතී. |
| සුබසාධන සම්බන්ධ ප්‍රතිලාභ | ▪ සෑම සේවකයෙකුටම ඕනෑම CPSTL / CPC සංචාරක බංගලාවක දින 3ක්/රාත්‍රී 2ක් පවුලේ අය සමඟ රැඳී සිටීමට අයිතියක් ඇත.<br>▪ CPSTL ක්‍රීඩා සමාජ කටයුතුවලට සහභාගී වීම<br>▪ වාර්ෂික විනෝද චාරිකාව<br>▪ ලේ දන් දීමේ ව්‍යාපාරය<br>▪ CPSTL පරිශ්‍රයේ සමුපකාර වෙළෙඳසැල<br>▪ CPSTL පරිශ්‍රයේ පවත්වාගෙන යන ආපනශාලාව |
| වෛද්‍ය ප්‍රතිලාභ | ▪ CPSTL හි නේවාසික වෛද්‍ය නිලධාරියා සහ නොමිලේ ඖෂධ ලබා දීම සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය ද ලබා දීම.<br>▪ රෝහල්ගත කිරීම සඳහා වෛද්‍ය රක්ෂණය<br>▪ රසායනාගාර පරීක්ෂණ ප්‍රතිපූර්ණය<br>▪ විශේෂ පරීක්ෂණ වියදම් ප්‍රතිපූර්ණය (CT ස්කෑන්, MRI ආදිය) |
| මරණ ප්‍රතිලාභ | මරණ වන්දි |
| සකසුරුවම් සමිති ප්‍රතිලාභ | ▪ මරණ පාරිතෝෂිකයට සේවකයින්ගේ සහ ආසන්නතම පවුලේ සාමාජිකයින්ගේ මරණ ඇතුලත්ය.<br>▪ ව්‍යවස්ථාපිත පාරිතෝෂිකයට සමාන පාරිතෝෂික දීමනාවක් ලබා දෙනු ලැබේ. |
| විශ්‍රාමික ප්‍රතිපාදන | ව්‍යවස්ථාපිත පාරිතෝෂිකය |
| අනෙකුත් පහසුකම් | විශේෂ රාජකාරි සඳහා නිල ඇඳුම් සැපයීම, රාත්‍රී රාජකාරි සේවකයන් සඳහා ආහාර සැපයීම |

CPSTL ආයතනය සිය සේවකයන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කරමින් උසස් අධ්‍යාපනය සඳහා ඔවුන්ව දිරිමත් කරයි. වර්ෂය තුළ විවිධ ක්ෂේත්‍ර වල උපාධි අපේක්ෂකයන් 81 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව ප්‍රධානය කරන ලදී.




සේවකයන්ගේ දරුවන් සඳහා ලබාදෙන ශිෂ්‍යත්ව - 2024

නිශ්චිත සේවා වසර අවසාන කළ සේවකයින්ව සමාගම විසින් වාර්ෂිකව ඇගයීමට ලක් කරනු ලැබේ.

| සම්පූර්ණ කරන ලද සේවා කාලය | සේවක සංඛ්‍යාව |
|---|---|
| අවුරුදු 20 | 31 |
| අවුරුදු 30 | 7 |
| අවුරුදු 35 | 15 |
| අවුරුදු 40 | 1 |

## පුහුණුව හා වෘත්තිය සංවර්ධනය

වර්තමාන ව්‍යාපාරික පරිසරය වේගයෙන් සංවර්ධනය වෙමින් පවතින බැවින්, අඛණ්ඩ අධ්‍යාපන අනුවර්ත්‍යතාවය සහ ස්ථායි සාර්ථකත්වය අත්‍යවශ්‍ය වේ. තම සේවක බලකාය සංවිධානයේ දැක්ම ඉටුකිරීම සඳහා දීර්ඝකාලීන වටිනාකම නිර්මාණය කිරීමේ මූලික භූමිකාවක් ඉටු කරන බව CPSTL සමාගම අවබෝධ කරගෙන ඇත. එබැවින්, තරගකාරී සහ කුසලතාවයන්ගෙන් පූර්ණ සේවක පිරිස සංවර්ධනය කිරීම සහ රඳවා තබා ගැනීම ආයතනයේ උපායශීලී ප්‍රමුඛතා ක්‍රියාත්මක කරමින් වර්ධන ඉලක්ක සපුරාලීමේදී ඉතා වැදගත් වේ.

අපගේ පුහුණු හා මානව සම්පත් සංවර්ධන කාර්යාංශය සේවකයන්ගේ වෘත්තීය හා පෞද්ගලික වර්ධනය අඛණ්ඩව ප්‍රවර්ධනය කිරීම සඳහා කැපවී ඇත. මේ සඳහා ක්‍රමානුකූලව පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, කුසලතා හිඟයන් පියවීම සහ අඛණ්ඩ සංවර්ධනය සහ අධ්‍යාපනය පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම ඇතුළත් වේ.

පුහුණු අවශ්‍යතා, කාර්ය සාධන ප්‍රතිචාර යාන්ත්‍රණ සහ ව්‍යුහගත කුසලතා සාකච්ඡා මඟින් අගය කෙරේ. සේවකයන්ට අභ්‍යන්තර පුහුණු වැඩසටහන් හා හඳුනාගෙන ඇති වෘත්තීය ආයතන සහ පුහුණු සංවිධානය මඟින් පැවැත්වෙන බාහිර පුහුණුවීම් වලට ක්‍රියාකාරීව සහභාගී වීමට පොළඹවනු ලැබේ.

මෙම වසරේදී, CPSTL සේවකයන්ගේ තාක්ෂණික දක්ෂතා ශක්තිමත් කිරීම, මෘදු කුසලතා වර්ධනය කිරීම හා නායකත්ව හැකියාවන් ගොඩනඟා ගැනීම සහ ඉලක්කගත පුහුණු

වැඩසටහන් එකතුවක් ක්‍රියාත්මක කරන ලදී. මෙම කටයුතු සමඟින් සේවක සංවර්ධනය සඳහා සම්පූර්ණයෙන්ම පැය 4424ක පුහුණු ආයෝජනයක් සිදු විය.

| වැඩසටහන | කාලසීමාව | සහභාගීවන්නන් ගණන | පුහුණු පැය |
|---|---|---|---|
| කුලී ටැංකි රථ කාර්ය මණ්ඩලය සඳහා ආරක්ෂා වැඩසටහන | 7 | 58 | 406 |
| කුසලතා සංවර්ධන වැඩසටහන | 7 | 9 | 63 |
| ප්‍රථමාධාර වැඩසටහන | 7 | 40 | 280 |
| නව බඳවාගත් "විමර්ශණ නිලධාරීන්" සඳහා හඳුන්වාදීමේ වැඩසටහන | 7 | 20 | 140 |
| ශ්‍රී ලංකාවේ සේවක සමාජ ආරක්ෂිත ක්‍රමය හදුන්වාදීමේ වැඩසටහන | 7 | 10 | 70 |
| නායකත්ව සංවර්ධන වැඩසටහන් | 7 | 12 | 84 |
| පෞරුෂත්ව වර්ධනය | 7 | 10 | 70 |
| නීති කාර්යාංශයේ විනිශ්චය නිලධාරීන් සඳහා වැඩසටහන | 7 | 12 | 84 |
| ටැංකි මිනුම්කරුවන් සඳහා නැවත පුහුණුව | 7 | 23 | 161 |
| කුලී ටැංකි රථ කාර්ය මණ්ඩලය සඳහා ආරක්ෂා වැඩසටහන (විශේෂ) | 7 | 416 | 2912 |
| පරීක්ෂක නිලධාරියාගේ භූමිකාව | 7 | 10 | 70 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් හා අංශ ප්‍රධානීන් සඳහා පුහුණු වැඩසටහන | 7 | 12 | 84 |
| | | | 4424 |

සමාගම සේවකයන්ගේ වෘත්තීය උසස්වීම සඳහා සෑම විටම උනන්දු වන අතර, පිළිගත් වෘත්තිය ආයතනවලට එක්වීමට කැමති සේවකයන්ට ඒ පිළිබඳ සහාය සපයමින් වෘත්තීය සංවර්ධනය සඳහා ඉමහත් කැපවීමෙන් යුතුව කටයුතු කරයි. එමෙන්ම MBA සහ අනෙකුත් උපාධි උසස් අධ්‍යාපන අධ්‍යයන සිදු කිරීමට මූල්‍යමය සහාය සපයන අතර, වාර්ෂික වෘත්තීය ආයතන සඳහා සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය කරයි. තවද, වෘත්තීය ආයතන විසින් සංවිධානය කරන සමුළු හා වැඩමුළු සඳහා ගාස්තු ලබාදීම මඟින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ප්‍රවර්ධනය කරයි.





## රැකියා ආශ්‍රිත සෞඛ්‍යය හා ආරක්ෂාව

CPSTL සමාගම සිය සියලුම මෙහෙයුම් කටයුතු තුළින් උසස්ම සෞඛ්‍යය හා ආරක්ෂා ප්‍රමිතීන් සුරැකිව පවත්වා ගැනීමට දැඩිව කැපවී සිටියි. සෑම සේවකයෙකුටම ආරක්ෂිත හා අනතුරු රහිත අඛණ්ඩ සේවා පරිසරයක් සැපයීමට කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඛනිජ තෙල් පර්යන්ත ක්‍රියාකරු ලෙස හා, ජාතික බලශක්ති සැපයුම් පද්ධතියෙහි ප්‍රධානතම කාර්යය ඉටු කරන්නා ලෙස යම් හදිසි ගිනි ගැනීමේ අවස්ථාවක් වුවහොත් රටේ ආර්ථිකයට ඉමහත් බලපෑමක් සිදුවිය හැකි බැවින් ඒ අනුව ආයතනයේ මෙහෙයුම් සැලැස්ම තුල කාර්මික සහ රැකියා ආශ්‍රිත සෞඛ්‍යය සහ ආරක්ෂාව සඳහා මූලික ප්‍රමුඛතාවයක් ලබා දී ඇත.

මානව හා දේපල ආරක්ෂා කිරීම සඳහා CPSTL ආයතනය විශේෂිත, 24 පැය පුරාම පවත්නා පහසුකම් පහත පරිදි පවත්වාගෙන යයි.

- **ගිනි හා ආරක්ෂක ඒකකය** - සම්පූර්ණයෙන් කැපවූ, සියළු උපකරණයන්ගෙන් සමන්විත වූ පෞද්ගලික ගිනි නිවීම් අංශයක්, සතියේ දින 7ක්, පැය 24ක් ක්‍රියාත්මක වන අතර, සියලු මෙහෙයුම් කටයුතු ආරක්ෂිතව සිදු කිරීමට හදිසි අවස්ථා වලදී කඩිනමින් ක්‍රියාකාරී වේ.

- **වෛද්‍ය මධ්‍යස්ථානය** - සියළුම පහසුකම් වලින් සපිරි අංග සම්පූර්ණ හදිසි සේවකයන් සඳහා අඛණ්ඩ හා ක්‍රියාකාරී සෞඛ්‍ය පහසුකම් සලසයි. මේ සඳහා සතියේ දින 7 පැය 24 පුරා ක්‍රියාත්මක වන ගිලන් රථ සේවයක්ද සහාය වේ.
- **රසායනාගාර ඒකකය** - නවීනතම තාක්ෂණයෙන් සුසැදි අභ්‍යන්තර පරීක්ෂණාගාරයක් 24 පැය පුරා ක්‍රියාත්මක වෙමින් සියලුම තෙල් නිෂ්පාදන උසස්ම ගුණාත්මක හා ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරයි. නවීන පරීක්ෂණ පහසුකම් හා පළපුරුදු වෘත්තීය නිළධාරීන් යොදාගෙන, නිෂ්පාදන සහතික කිරීම හා නිෂ්පාදන ස්වාභාවිකතාවය පාලනය කරමින්, වෙළෙඳපොලට පිවිසෙන සියළු කාණ්ඩයන් නියාමනයන් යටතේ පවතින ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලමින් මෙහෙයුම් සුරක්ෂිතභාවය සහ පාරිභෝගික විශ්වාසය තහවුරු කරයි.









සමාගම සෞඛ්‍යය හා ආරක්ෂාවට ඉහළ වැදගත්කමක් දක්වන අතර, සියලු ක්‍රියාකාරකම් තුළ මෙහෙයුම් අවදානම් ඉවත් කිරීමේ ප්‍රමුඛතාවයක් ලෙස සලකා ක්‍රියා කරයි. ඒ අනුව සලකා බලන ප්‍රධාන අංශ පහත පරිදි වේ.

- **මෙවලම්, උපකරණ සහ වැඩ පද්ධති සැපයීම හා නඩත්තු කිරීම.** අවදානම් මෙහෙයුම් ආරක්ෂාව සහ විශ්වාසනීයත්වය රැකීම.
- **ඉන්ධන ආරක්ෂිතව හැසිරවීම, ගබඩා කිරීම හා ප්‍රවාහනය.** දැඩි ක්‍රමවේද හා කර්මාන්තයේ උසස් ප්‍රමිතීන් අනුව ප්‍රවාහනය කිරීම.
- **තොරතුරු, පුහුණු කිරීම සහ නිරීක්ෂණ සැපයීම.** සේවකයින්ට තම කාර්යයන් ආරක්ෂිතව සිදු කිරීමට අවශ්‍ය කුසලතා සහ අවදානම් පිළිබඳ දැනුවත් කිරීම.
- **යෝග්‍යතම සේවා ස්ථාන පවත්වා ගැනීම.** සේවක සුභසාධනය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා.
- **සෞඛ්‍යය හා ආරක්ෂක අනතුරු වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන යෑම.** පද්ධතිමය අවදානම් හදුනාගැනීම සහ පිළියම් කිරීම.
- **සියලු සේවකයන් විසින් සෞඛ්‍යය හා ආරක්ෂක උපදෙස් දැඩිව පිළිපැදීම.** සංවිධානය පුරා ශක්තිමත් ආරක්ෂක සංස්කෘතියක් නිර්මාණය කිරීම.

## සේවක ක්‍රියාකාරකම්

### ක්‍රිකට් තරඟ

ක්‍රීඩා කමිටුව විසින් සමාගමේ විවිධ අංශවල සේවකයින් අතර සුහදශීලී අන්තර්-අංශ ක්‍රිකට් තරඟයක් සංවිධානය කරන ලදී. මෙම අවස්ථාව උද්යෝගයකින් පිරුණු සහභාගිත්වයකින් යුත් සේවකයන්ට විශේෂ තරඟාවලියක් විය. කණ්ඩායම් ක්‍රීඩා භූමියෙහි සියලු කුසලතා විදහා දක්වමින් තරගකාරීත්වයකින් සහ විශිෂ්ට ක්‍රීඩා ශිල්පීය ගුණාංගයක් පෙන්නුම් කළහ.

මෙම තරගාවලිය තම එදිනෙදා සේවා කටයුතු මධ්‍යයේ තම ශාරීරික ක්‍රියාකාරීත්වය සහ සේවකයන් අතර අන්‍යෝන්‍ය සුහදශීලීත්වය වැඩි දියුණු කරගැනීමට ලත් මහත් විනෝදජනක විවේකයක් විය. මෙය ඉතිහාසයට මතක සටහනක් එක් කළ කණ්ඩායම්ශීලී, ඒකීයභාවය සහ සෞඛ්‍යය සම්පන්න කාර්ය-ජීවිත සමතුලිතතාවය ඔප් නැංවූ මහඟු අවස්ථාවක් විය.










### බෞද්ධ ධර්ම දේශනා

CPSTL බෞද්ධ සංගමය විසින් මාසිකව ආයතනය තුළ සෑම පොහෝ දිනකම ධර්මානුශාසනාවක් පවත්වනු ලබන අතර ඒ සඳහා සියලු සේවකයන්ට ආරාධනා කරයි. ඊට අමතරව, ප්‍රධාන පොහොය දින වලදී විශේෂ ආගමික වැඩසටහන් සංවිධානය කරයි.










### කතෝලික දේශනා

ආයතනය තුළ එකමුතුභාවය සහ සතුට පිළිබිඹු කරමින් 2024 නත්තල වෙනුවෙන් ක්‍රිස්තියානි සංගමය මඟින් උත්සවයක් සංවිධානය කළ අතර අලංකාර නත්තල් ගසක් සහ ගවලෙනක් ද ඒ අතර විය. කොලොන්නාවේ පිහිටි සාන්ත ජෝසප් පල්ලියෙහි පාලක ගරු ප්‍රියන්ත සිල්වා පියතුමා විසින් ශුද්ධ වූ මෙහෙයක් පැවැත් වූ අතර එයට ආයතනයේ සේවකයන් සහ විශ්‍රාම ලැබූ සේවකයන්ද සහභාගී විය. එය සහෝදරත්වය,

භක්තිමත්භාවය උද්දීපනය කළ අතර සෞභාග්‍ය, සාමය සහ සියළු ජාතීන්ට ආශිර්වාද පැතීමෙන් අවසන් විය.







# පාලනය සහ අනුකූලතාව



# ආයතනික පාලනය

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනය**

CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික පාලන මූලධර්ම අනුගමනය කිරීමට දැඩි ලෙස කැපවී සිටින බවත්, ආයතනික පාලන භාවිතයන් පිළිබඳ ආයතනික පාලන වාර්තාව සාධාරණ ප්‍රකාශනයක් සපයන බවත්, අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සියලුම පිරිස් අදාල නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කර සිටිමි.

ඩී.ජේ.ඩී.එස්. ද එස්. රාජකරුණා
සභාපති

CPSTL හි ආයතනික පාලනය, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වයේ වගවීම සහ විනිවිදභාවය වැඩි දියුණු කරන ශක්තිමත් සහ ඵලදායී ආයතනික සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා ව්‍යුහගත කර ඇත. එය සියලු ගනුදෙනු වලදී සාධාරණත්වය සහතික කරන අතර සංවිධානය කෙරෙහි මහජන විශ්වාසය ගොඩනැගීමට දායක වේ. ආයතනික පාලනයේ මූලික අරමුණ වන්නේ සමාගමේ දිගුකාලීන සාර්ථකත්වය සහතික කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන ඵලදායී, ව්‍යවසායක සහ විචක්ෂණශීලී කළමනාකරණය සක්‍රීය කිරීමයි.

- දැක්ම, මෙහෙවර, අරමුණු සහ උපාය මාර්ග සැලසුම් කර සන්නිවේදනය කරන ආකාරය,
- සාරධර්ම සමග මනාව අනුකූලවන ආකාරය,
- අවදානම් කළමනාකරණය කරන ආකාරය,
- විනිවිදභාවය ප්‍රවර්ධනය කරන ආකාරය,
- තිරසාරව මෙහෙයුම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න,
- අනාගත නායකයින් දිරිමත් සහ සංවර්ධනය කරන ආකාරය,
- ආයතනයට ඇල්මැති පාර්ශවකරුවන්ගේ වටිනාකම් ඉහළ නැංවීම සඳහා ආයතනික සංස්කෘතිය ප්‍රවර්ධනය කරන ආකාරය යන පුළුල් අර්ථයන් ද එයට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාව තුල ඛනිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීමේ ප්‍රධාන පහසුකම් සපයන්නා ලෙස, රටේ නියාමන ආයතන විසින් සකස් කරන ලද නීති, රෙගුලාසි සහ සංග්‍රහවලට අනුගතව ආයතනික පාලනය පිළිබඳ මූලධර්ම ක්‍රියාත්මක කිරීමට සහතික වන අතර, එය සමාගම විසින් සකසන ලද අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශවලට ද අනුකූල වේ.

## ආයතනික පාලන ව්‍යුහය

CPSTL පාලන ව්‍යුහය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය, එහි අනු කමිටු, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, කොටස් හිමියන්, නියාමකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර මූලික සබඳතා මෙහෙයවනු ලැබේ.

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ආයතනික පාලන ව්‍යුහය පහත ප්‍රධාන කරුණු තුන මත රඳා පවතී.

1. අනුකූලතාව
2. අභ්‍යන්තර පාලන ව්‍යුහය
3. සහතික වීම සහ පාලනය




## 1. අනුකූලතාව

සමාගමේ ආයතනික පාලන භාවිතයන් පහත සඳහන් නීති, ප්‍රඥප්ති සහ ස්වේච්ඡා භාවිතයන්ට අනුකූල වේ.

- 2023 දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය.
- 2021 දී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් (SOEs) සඳහා වන ආයතනික පාලනය සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ මාර්ගෝපදේශ.
- 2007 අංක 7 දරණ සමාගම් පනත.
- 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත, එහි සංශෝධන සහ අනෙකුත් ප්‍රඥප්ති.
- සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රතිපත්ති.
- සමාගම් රෙගුලාසි.
- ව්‍යාපාර චර්යා සංග්‍රහය.
- අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සහ කළමනාකරණ කමිටුවල නිදර්ශන නියමයන්.

## 2. අභ්‍යන්තර පාලන ව්‍යුහය

### අධ්‍යක්ෂ මණ්ඩලය

ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් හරහා සමාගමේ සියලුම ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. පාලනයේ අරමුණ වන්නේ ඵලදායී සහ විචක්ෂණශීලී කළමනාකරණය තුළින් දිගුකාලීන තිරසාර කොටස්හිමියන්ගේ වටිනාකමක් නිර්මාණය කිරීමයි.

- **අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්**

  අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම් පහත පරිදි වේ;

  - ආයතනයේ දිගුකාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් උපාය මාර්ග සැකසීම සහ මග පෙන්වීම.
  - උපාය මාර්ගික මාර්ගෝපදේශ සැපයීම සහ ආයතනික උපාය මාර්ග සහ සමාගමේ කාර්ය සාධන අරමුණු ඇගයීම, සමාලෝචනය සහ අනුමත කිරීම.
  - වාර්ෂික සැලසුම් සහ දිගුකාලීන ව්‍යාපාර සැලසුම් සමාලෝචනය සහ අනුමත කිරීම.
  - යහපාලන පද්ධති සහ ඊට අනුකූලවීම අධීක්ෂණය කිරීම.
  - මූල්‍ය සහ අනෙකුත් වාර්තාකරණ භාවිතයන් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.
  - ප්‍රධාන අත්පත් කර ගැනීම්, බැහැර කිරීම් සහ ප්‍රාග්ධන වියදම් සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම.
  - විධායක මට්ටම් දක්වා පවරන ලද අභිමතයන්/අධිකාරියන් සඳහා වෙනස්කම් තීරණය කිරීම.
  - අභ්‍යන්තර පාලන පද්ධති සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීම.

- **අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය**

  2024 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පහත පරිදි විය.

  1. ඩී.ජේ.ඒ.එස්.ද එස් රාජකරුණා මහතා - සභාපති
  2. ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා - කළමනාකාර අධ්‍යක්ෂ
  3. ඩබ්.එස්. හේමන්ත කුමාර මහතා - විධායක අධ්‍යක්ෂ
  4. දීපක් දාස් මහතා - අධ්‍යක්ෂ
  5. අවිනාශ් සිංහාල් මහතා - අධ්‍යක්ෂ
  6. සුනිල් කේ මහාරණ මහතා - අධ්‍යක්ෂ
  7. එම්.එම්. ක්‍රිස්ටි ඩොස් මහතා - අධ්‍යක්ෂ
  8. එස්. හේමන්ත විජිත කුමාර මහතා - අධ්‍යක්ෂ
  9. ඒ.ජේ.එල්. විමලරත්න මහතා - අධ්‍යක්ෂ

2024 වර්ෂය තුල අධ්‍යක්ෂවරුන්ගේ වෙනස්වීම්

| | අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ දිනය | අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස් වූ දිනය | තනතුර |
|---|---|---|---|---|
| 1 | සාලිය වික්‍රමසූරිය මහතා | 10.10.2023 | 26.09.2024 | සභාපති |
| 2 | කර්නල් ප්‍රියදර්ශන රත්නායක (විශ්‍රාමික) | 10.10.2023 | 26.09.2024 | MD |
| 3 | ඊ.ඒ. රත්නසීල මහතා | 27.01.2020 | 10.09.2024 | NED |
| 4 | අසීම් භාර්ගවා මහතා | 18.08.2021 | 21.09.2024 | NED |
| 5 | රාජේෂ් භගත් මහතා | 18.08.2021 | 21.09.2024 | NED |
| 6 | ධර්මදාස පණ්ඩිතරත්න මහතා | 09.03.2022 | 26.09.2024 | NED |
| 7 | මනෝජ් ගමගේ මහතා | 13.12.2022 | 26.09.2024 | NED |
| 8 | යසිරු ලංකාතිලක මහතා | 31.03.2023 | 26.09.2024 | NED |
| 9 | ඩී.ජේ.ඒ.එස්.ද එස් රාජකරුණා මහතා | 26.09.2024 | | සභාපති |
| 10 | ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා | 26.09.2024 | | MD |
| 11 | ඩබ්.එස්. හේමන්ත කුමාර මහතා | 26.09.2024 | | ED |
| 12 | දීපක් දාස් මහතා | 30.05.2023 | | NED |
| 13 | අවිනාශ් සිංහාල් මහතා | 22.08.2024 | | NED |
| 14 | සුනිල් කේ. මහාරණ මහතා | 22.08.2024 | | NED |

| | | | | |
|---|---|---|---|---|
| 15 | ඒ.ජේ.එල්. විමලරත්න මහතා | 26.09.2024 | | NED |
| 16 | එම්.එම්. ක්‍රිස්ටි ඩොස් මහතා | 03.10.2024 | | NED |
| 17 | එස්. හේමන්ත විජිත කුමාර මහතා | 09.10.2024 | | NED |

NED විධායක නොවන අධ්‍යක්ෂ MD කළමනාකාර අධ්‍යක්ෂ ED විධායක අධ්‍යක්ෂ

වාර්ෂික වාර්තාවේ පිටු 20 සිට 24 දක්වා වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ පළපුරුද්ද, උපාය මාර්ග පිළිබඳ ගැටළු පිළිබඳ ස්වාධීන විනිශ්චයක් සැපයීමට ප්‍රමාණවත් හැකියාව, කාර්ය සාධනය මෙන් ම සමාගමට වැදගත්වන සම්පත් සහ ව්‍යාපාරික භාවිතයන් ආදිය දැක්වෙයි.

- **අධ්‍යක්ෂ මණ්ඩල විවිධත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩල තුලනය**

  අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනික පාලන රාමුවෙහි ප්‍රධානම සංරචකය වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සතු කුසලතා, දැනුම, අත්දැකීම්, වෘත්තීය සුදුසුකම්, වයස, ජාතිකත්වය ආදියෙහි පවතින විවිධත්වය, කුසලතා සංචිතය සහ සම්පත් භාවිතා කිරීම පිළිබඳ වඩා එලදායී තීරණ ගැනීම මෙන් ම එමගින් වඩා හොඳ ප්‍රතිලාභ ලබාගැනීමට ඉවහල් වෙයි.

  සමාලෝචිත වර්ෂය තුළ විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය සහ පළපුරුද්ද සහිත ප්‍රශස්ත කුසලතා සම්මිශ්‍රණයක් ඇති අධ්‍යක්ෂවරුන් නව දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය.

- **අධ්‍යක්ෂවරුන් පත් කිරීම**

  සාංගමික ව්‍යවස්ථාවලියේ කොන්දේසි මත, අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ වාර්ෂික මහා සභා රැස්වීමේදී ය. ඒ සඳහා අපේක්ෂකයින් සලකා බැලීමේදී ඔවුන් සතු අත්දැකීම්වල පරාසය, ව්‍යාපාරයේ මූල්‍ය ගැටළු පිළිබඳ අවබෝධය, නිවැරදි විනිශ්චයන් ලබාදීමේ හැකියාව, විවිධත්වය, නායකත්වය, සහ අත්දැකීම් මෙන් ම ව්‍යාපාරයට සහ කර්මාන්තයට බලපාන කාරණාවල දී ලබා ඇති ජයග්‍රහණ යනාදිය සැලකිල්ලට ගනු ලැබේ.

- **වගකීම් බෙදීයාම**

  2023 ඔක්තෝබර් මස 10 වන දින සිට සභාපතිවරයාගේ සහ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ භූමිකාවන්, වගකීම්වල පැහැදිලි වෙනසක් සහිතව වෙන්කර ඇත. එමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලනය සහ සමාගමේ මෙහෙයුම් සඳහා විධායක කළමනාකරණය අතර වගවීම සහ අධිකාරියේ තුලනයක් සහතික විය.

  2023 ඔක්තෝබර් මස 10 වන දින සිට 2024 සැප්තැම්බර් මස 26 වන දින දක්වා සාලිය වික්‍රමසූරිය මහතා සභාපතිවරයා ලෙස කටයුතු කළ අතර, කර්නල් ප්‍රියදර්ශන රත්නායක (විශ්‍රාමික) මහතා ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන ලදී. ඉන්පසු ඩී.ජේ.ඩබ්.එස්.ද එස් රාජකරුණා මහතා නව සභාපති ලෙස පත්කළ අතර ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා නව කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.

  සභාපතිවරයාගේ කාර්යභාරය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම, කාර්යක්ෂම සංවිධානයක් සහතික කිරීම හා එහි කාර්යයන් ඉටුකිරීම සහ විධායක නොවන සහ විධායක අධ්‍යක්ෂවරුන් අතර සම්බන්ධතාවයේ විශ්වාසනීයත්වය සහ ඵලදායීතාවය තහවුරු කිරීම වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික දිශාව, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව සංවිධානයේ එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කිරීම සඳහා කළමනාකාර අධ්‍යක්ෂවරයා වගකිව යුතුය.

  ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි මෙහෙයුම් උප කාණ්ඩ ලෙස එනම්, කොලොන්නාව පර්යන්තයේ මෙහෙයුම්, මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම්, කොළඹ වරායේ තෙල් පහසුකම් කාර්යාලයේ මෙහෙයුම් සහ දිවයින පුරා පිහිටි ලංකා තොග ගබඩාවල මෙහෙයුම් ලෙස වර්ග කළ හැකි ය. මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම් කටයුතු පර්යන්ත කළමනාකාර (මුතුරාජවෙල) ගේ ප්‍රධානත්වයෙන් සිදුවෙයි. කොළඹ වරායේ තෙල් පහසුකම් කාර්යාලයේ ප්‍රධානියා මෙහෙයුම් කළමනාකාර (අක්වෙරළ) වේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ගේ අධීක්ෂණය යටතේ ලංකා තොග ගබඩාවල ප්‍රධානත්වය දරන්නේ ගබඩා අධිකාරීවරුන් විසිනි.

- **අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම**

  සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබන අතර, විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍යතා මත කැඳවනු ලැබෙයි. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෝ ද ආරාධනා මත රැස්වීම්වලට සහභාගි වෙති.

  න්‍යාය පත්‍රයකට අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් ලෙස පවත්වනු ලබන අතර රැස්වීම්වලට පෙර අධ්‍යක්ෂවරුන්ට, ආයතනික කළමනාකරණය විසින් විස්තීර්ණ පසුබිම් තොරතුරු සපයනු ලැබේ. 2024 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වනු ලැබිණි.

මෙම රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පහත වගුවේ දක්වා ඇත;

| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නම | ජන 24 | පෙබ 28 | අප්‍රේ 24 | මැයි 31 | ජූනි 7 | ජූලි 10 | ජූලි 17 | අගෝ 22 | සැප් 20 | ඔක් 10 | නොවැ 08 | දෙසැ 11 |
| 1 | සාලිය වික්‍රමසූරිය මහතා | P | P | P | P | P | P | P | P | P | | | |
| 2 | කර්නල් ප්‍රියදර්ශන රත්නායක (විශ්‍රාමික) | P | P | P | P | P | P | P | P | P | | | |
| 3 | දීපක් දාස් මහතා | P | P | P | P | P | P | P | P | P | P | P | P |
| 4 | ඊ.ඩී. රත්නසීල මහතා | P | P | P | P | P | P | P | P | Ab | | | |
| 5 | අසීම් භාර්ගවා මහතා | P | P | P | P | P | P | P | P | | | | |
| 6 | රාජේෂ් භගත් මහතා | P | P | P | P | P | P | P | P | | | | |
| 7 | ධර්මදාස පණ්ඩිතරත්න මහතා | P | P | P | P | Ab | P | Ab | Ab | Ab | | | |
| 8 | මනෝජ් ගමගේ මහතා | P | P | P | P | P | P | P | P | Ab | | | |
| 9 | යසිරු ලංකාතිලක මහතා | P | P | P | P | Ab | P | P | P | Ab | | | |
| 10 | අවිනාශ් සිංහාල් මහතා | | | | | | | | | P | P | P | P |
| 11 | සුනිල් කේ. මහාරණ මහතා | | | | | | | | | P | P | P | P |
| 12 | ඩී.ජේ.ඒ.එස්.ද එස් රාජකරුණා මහතා | | | | | | | | | | P | P | P |
| 13 | ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා | | | | | | | | | | P | P | P |
| 14 | ඩබ්.එස්. හේමන්ත කුමාර මහතා | | | | | | | | | | P | P | P |
| 15 | එම්.එම්. ක්‍රිස්ටි ඩොස් මහතා | | | | | | | | | | P | P | P |
| 16 | එස්. හේමන්ත විජිත කුමාර මහතා | | | | | | | | | | P | P | P |
| 17 | ඒ.ජේ.එල්. විමලරත්න මහතා | | | | | | | | | | P | P | P |

P-පැමිණීම Ab-නොපැමිණීම

- **බලය බෙදීම සහ කමිටු**

  අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති කරුණු හැර, වෙනත් කරුණු සඳහා උප කමිටුවෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට නිශ්චිත වගකීම් පවරා ඇති පහත සඳහන් කමිටුවල සහාය ලැබේ.

  අ) විගණන සහ කළමනාකරණ කමිටුව

  සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන සහ කළමනාකරණ කමිටුව පත් කරනු ලැබේ. විගණන සහ කළමනාකරණ කමිටුව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. විගණන සහ කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත සමස්ත පාලන ක්‍රියාවලිය තුළ ක්‍රියා කරන අතර වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

  CPSTL විගණන සහ කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරුන් 03 දෙනෙකුගෙන් සමන්විත වේ. විගණන සහ කළමනාකරණ කමිටු සංයුතිය සහ සිදු කරනු ලබන කාර්යයන් මෙම වාර්ෂික වාර්තාවේ 74 පිටුවේ ඉදිරිපත් කර ඇත.

  ආ) තොග සමාලෝචන කමිටුව

  CPSTL කාර්ය මණ්ඩලයේ සහ CPC/ LIOC නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් ඉන්ධන තොග සමාලෝචන කමිටුව සතිපතා පවත්වනු ලැබේ. පවතින ඉන්ධන තොග සමාලෝචනය කරන අතර, ඉදිරි මාස තුන සඳහා අවශ්‍යතාවය කල් ඇතිව සැලසුම් කෙරෙයි. රටේ ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන ශක්‍යතාව සහ ගබඩා ධාරිතාව සැලකිල්ලට ගැනීමෙන් පසු ආනයනය කළ යුතු ප්‍රමාණය හඳුනා ගැනේ. දෛනිකව සිදු කෙරෙන සමීප නිරීක්ෂණ රට තුළ ඉන්ධන අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා සමාගමට හැකියාව ලබා දෙයි.

  ඇ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

  TEC (තාක්ෂණික ඇගයීම් කමිටුව) සහ DPC (දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව) ප්‍රසම්පාදන කාර්යයේ විනිවිදභාවය සහතික කිරීම සඳහාත්, සැපයුම් ප්‍රමාදයන් අවම

කිරීම සහ ගුණාත්මකව හොඳම සේවාවන් ලබාගැනීම සඳහාත්, මූල්‍යමය වශයෙන් වඩාත්ම වාසි ලබා ගැනීමටත්, පත්කර ඇති අතර සමාගම විසින් නිෂ්පාදන, භාණ්ඩ, වැඩ සහ සේවා, මිලදී ගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කරයි.

මෙම කමිටුවේ ප්‍රධානත්වය දරන්නේ CPSTL හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ වන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) සහ බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

- **තොරතුරු සහ සම්පත් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රවේශය**

අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රාජකාරී සහ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය කළමනාකරණ සහ සංවිධාන තොරතුරු ලබාගැනීමටත් සම්පත් පරිහරණයටත් අසීමිත අවසරයක් ඇත. විධායක කළමනාකරණය විසින් මෙහෙයුම් සැලසුම් කාර්ය සාධනය, උපාය මාර්ග, මූල්‍ය කළමනාකරණය, පිරිවැය, වත්කම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, අනුකූලතාවය සහ නියාමන වෙනස්කම් ඇතුළු කරුණු සම්බන්ධයෙන් විවිධ ඉදිරිපත් කිරීම් කරයි. මෙහිදී අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය අවස්ථාවලදී ස්වාධීන වෘත්තීය උපදෙස් සහ තොරතුරු ලබාගත හැකි අතර වියදම සමාගම විසින් දරනු ලැබේ.

- **සමාගම් ලේකම්වරු**

අධ්‍යක්ෂ මණ්ඩලයට එහි රාජකාරි ඉටු කිරීම සහ වගකීම් සම්බන්ධයෙන් මග පෙන්වීම සහ ආයතනික පාලනය පිළිබඳ හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කරමින්, ඩිලොයිට් කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම ලේකම්වරුන් ලෙස කටයුතු කරයි. සමාගම් ලේකම් සමග සියලුම අධ්‍යක්ෂවරුන්ට කටයුතු කළ හැක. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනෙකුත් උප කමිටු රැස්වීම් සංවිධානය කිරීම සහ අදාල වාර්තා සටහන් පවත්වා ගැනීම සමාගම් ලේකම් විසින් සිදුකරනු ලබයි.

## 3. සහතික කිරීම සහ පාලනය

- **මූල්‍ය වාර්තාකරණය**

මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සාධාරණ දැක්මක් සහිතව ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) එනම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) සහ LKAS වලට අනුවය. විගණන කමිටුව විසින් මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත්කිරීමට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ඇති අනුකූලතාව, යෝග්‍යතාවය ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් සහ වැදගත් තීන්දුමය කරුණු පිළිබඳව කළමනාකරණය සහ බාහිර විගණකවරුන් සමග සමාලෝචනය කර සාකච්ඡා කර ඇත.

- **විනිවිදභාවය සහ අනුකූලතාවය**

සියලුම ගනුදෙනුවලදී නීති සහ රෙගුලාසි සමග දැඩි අනුකූලතාව සහතික කරමින්, සදාචාරාත්මක ප්‍රමිතීන්, කම්කරු හා මානව හිමිකම් සහ සමාගමේ ප්‍රතිපත්ති ආරක්ෂා කරමින්, විනිවිදභාවය පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

- 1961 අංක 28 දරණ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත සහ 1971 අංක 38 දරණ මූල්‍ය පනතෙහි විධිවිධානවලට අනුව සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිය නිර්මාණය කර ඇත.
- 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූලව විගණකාධිපති විසින් ආයතනයේ බාහිර විගණනය සිදු කරන ලදුව, මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශයට පත් කර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
- වගවීම සහතික කිරීම සඳහා, නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) සහ අනෙකුත් අදාල රෙගුලාසිවලට, සමාගම අනුගත වේ.

- **අභ්‍යන්තර පාලනය**

මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය සාක්ෂාත් කර ගැනීම සඳහාත්, මූල්‍ය වාර්තාවල විශ්වාසනීයත්වය සහ අදාල නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහ අවදානම් කළමනාකරණය සඳහාත් අභ්‍යන්තර පාලන පද්ධතියක් නිවැරදිව ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. මෙය මූල්‍ය හා ගිණුම්කරණයේ තොරතුරුවල අඛණ්ඩතාව තහවුරු කරන අතර මෙහෙයුම් සහ ලාභදායීතාවය පිළිබඳ ඉලක්ක සපුරාලීම සඳහාත්, කළමනාකරණ ප්‍රතිපත්ති සංවිධානය පුරා සම්ප්‍රේෂණය කිරීමටත් ඉතා වැදගත් වේ. ඕනෑම අභ්‍යන්තර පාලන පද්ධතියකට සහතික කළ හැක්කේ සාධාරණ කාල සීමාවක් තුළ දෝෂ සහ අක්‍රමිකතා ඇති බව හෝ ඉදිරිපත් කරනු ඇති බව පිළිබඳ සාධාරණ සහතිකයක් මිස නිරපේක්ෂ සහතිකයක් නොවේ.

CPSTL හි ස්ථාපිත අභ්‍යන්තර පාලන පද්ධතිය තුල ආයතනය කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව අභ්‍යන්තර විගණන කාර්යාංශය සහතික කරයි.

- **අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණනය, ස්වාධීන කළමනාකරණයක් සහිත අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලැබේ. අභ්‍යන්තර විගණනයක පරමාර්ථය වන්නේ සංවිධානයක සියලුම ක්‍රියාකාරකම් පාලනය කිරීම දැඩිව තබා ගැනීමයි. කළමනාකරණයට මූල්‍ය වාර්තාවල අව්‍යාජභාවය පිළිබඳ සහ සංවිධානයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිළිබඳ සහතිකයක් අවශ්‍ය වේ. විගණනය මේ අවශ්‍යතා දෙකම තහවුරු කිරීමට උපකාරී වේ. නීති රෙගුලාසිවලට හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවට එය නිසියාකාරව සහතික කරයි.

අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය පහත පරිදි වේ.

- සියලුම ව්‍යාපාරික ගනුදෙනු ක්‍රියාත්මක කිරීමට පෙර පවතින නීති හා රෙගුලාසිවලට අනුකූලව නිසි ලෙස පූර්ව අනුමත කර ඇතිබව සහතික කිරීම.
- සියලුම ගිණුම් තොරතුරු නිසි පරිදි SAP හි නිසි ලෙස වාර්තා කර ඇති බවටත්, ප්‍රාථමික වාර්තා නිවැරදිව නඩත්තු කෙරෙන බවටත්, කාර්යක්ෂම

කළමනාකරණය සහතික කිරීම සඳහා අදාල සංඛ්‍යා ලේඛන සහ පාලන දත්ත නිසි ලෙස නිර්මාණය කර ඇති බවටත් තහවුරු කිරීම.

- ♦ මූල්‍ය ගිණුම්කරණ ප්‍රකාශයන් සංවිධානයේ තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ නිරූපණයක් කරන බව සහතික කිරීම.
- ♦ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම.
- ♦ පද්ධති පදනම් ප්‍රවේශය යොදාගනිමින් පහත කරුණු සමාලෝචනය සහ ඇගයීම.
  - දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබන වැඩසටහන් සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සාක්ෂාත් කර ගැනීම මැනීමට කළමනාකරණය විසින් භාවිත කරන සියලුම පද්ධති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
  - කළමනාකරණ සැලසුම්, ක්‍රියා පටිපාටි සහ ප්‍රතිපත්ති සහ අනෙකුත් අවශ්‍යතා නීති සම්පාදනයට අනුකූල වීමේ මට්ටම.
  - වත්කම් අත්පත් කර ගැනීම, බැහැර කිරීම සහ ආරක්ෂා කිරීම, වංචා අක්‍රමිකතා සහ අක්‍රමිකතාවලින් පැන නගින පාඩු ඇතුළු පොළිය.
  - ආර්ථික සහ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහ නාස්තිය වළක්වා ගැනීම.
  - තීරණගැනීම සහ වගවීම සඳහා සපයනු ලැබෙන තොරතුරුවල ප්‍රමාණවත් බව, විශ්වාසනීයත්වය සහ අඛණ්ඩතාව මෙන්ම භාවිතා කරන තොරතුරු ප්‍රමාණය.

- ▪ **බාහිර විගණනය**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය පිළිබඳ සාධාරණ හා සත්‍ය නියෝජනය පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීම සඳහා බාහිර විගණකවරුන් වගකිව යුතුය.

1971 අංක 38 දරණ මූල්‍ය පනත සහ 2018 ජාතික විගණන පනතට අනුව, ආයතනයේ බාහිර විගණනය විගණකාධිපති විසින් සිදු කරන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.

**2023 වසරේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයට අනුකූලතාව.**

| අංකය | ආයතනික පාලන ප්‍රතිපත්ති | අනුකූලතාව පිළිබඳ විස්තර | අනුකූලතාවයේ තත්ත්වය |
|---|---|---|---|
| A | **අධ්‍යක්ෂකවරු** | | |
| A.1 | අධ්‍යක්ෂ මණ්ඩලය | අධ්‍යක්ෂ මණ්ඩලය උපාය මාර්ගික දිශානතිය සැකසීමේදී සහ සාර්ථක පාලන රාමුවක් ස්ථාපිත කිරීමේදී නායකත්වය ලබා දෙයි. | අනුකූල වේ |
| A1.1 | නිත්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | ▪ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වෙන අතර, අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විටදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවනු ලැබේ.<br>▪ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පැමිණීම 56 වන පිටුවෙහි ඇති වගුවේ විස්තර කර ඇත. | අනුකූල වේ |
| A1.2 | අධ්‍යක්ෂ මණ්ඩල කාර්යභාරයන් සහ වගකීම් | අධ්‍යක්ෂ මණ්ඩලය පහත වගකීම් භාරගනිමින් ව්‍යවසායකත්වමය නායකත්වය ලබාදිය යුතුය.<br>▪ උපාය මාර්ග සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.<br>▪ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කුසලතා සහ අනුප්‍රාප්තිය.<br>▪ තොරතුරුවල අඛණ්ඩතාව, අභ්‍යන්තර පාලන, ව්‍යාපාර අඛණ්ඩතාව සහ අවදානම් කළමනාකරණය.<br>▪ නීති, රෙගුලාසි සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීම.<br>▪ තීරණ ගැනීමේ දී සියලු පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සලකා බැලීම.<br>▪ තිරසාර ව්‍යාපාර සංවර්ධනය.<br>▪ සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීම සහ මූල්‍ය රෙගුලාසි සමග, අනුකූලතාවය. | අනුකූල වේ |
| A1.3 | රටේ නීතිවලට අනුකූලව කටයුතු කිරීම | සමාගම අදාල නියමයන්, නීති සහ රෙගුලාසි සියල්ලට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. | අනුකූල වේ |

| | | | |
|---|---|---|---|
| A1.4 | සමාගම් ලේකම්ගේ උපදෙස් සහ සේවාවන් සඳහා ප්‍රවේශය | ▪ ඩිලොයිට් කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම ලේකම්වරුන් ලෙස කටයුතු කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම සහ ආයතනික පාලනයේ හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට මග පෙන්වයි.<br>▪ ඕනෑම නව නීති සහ පිළිපැදිය යුතු රෙගුලාසි පිළිබඳව ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙයි. | අනුකූල වේ |
| A1.5 | ස්වාධීන විනිශ්චය | අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයට අදාල කාරණා සම්බන්ධයෙන් ස්වාධීනව අදහස් ප්‍රකාශ කිරීමට සමාන අවස්ථා තිබේ. | අනුකූල වේ |
| A1.6 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සමාගමේ කරුණු සඳහා ප්‍රමාණවත් කාලයක් කැප කිරීම | සෑම රැස්වීමකටම පෙර දැන්වීම, න්‍යාය පත්‍රය සහ ලිපි ලේඛන සියලුම අධ්‍යක්ෂවරුන්ට සපයනු ඇත. එසේ කරනුයේ එය සමාලෝචනය කිරීමට සහ අතිරේක තොරතුරු විමසීමට හෝ පැහැදිලි කරගැනීම් අවශ්‍ය නම් ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදීමටය. | අනුකූල වේ |
| A1.7 | අවශ්‍ය නම්, සමාගමේ අවශ්‍යතාව සඳහා, අධ්‍යක්ෂවරුන්ගෙන් 1/3 පිරිසකට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට යෝජනාවක් ඉල්ලා සිටිය හැක. | | අදාල නොවේ |
| A1.8 | අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රේරණය සහ පුහුණුව | සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින්, අභ්‍යන්තර හා බාහිර පරිසරය සම්බන්ධ අදාල තොරතුරු ගැන, අධ්‍යක්ෂවරුන් නිතිපතා යාවත්කාලීන කරනු ලැබේ. | අනුකූල වේ |
| A.2 | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී භූමිකාවල වගකීම් බෙදීම | සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල, වගකීම් සහ පාලනය පිළිබඳ පැහැදිලි බව සහතික කිරීම සඳහා සභාපතිවරයාගේ සහ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ භූමිකාවන් වෙන් කරන ලදී. | අනුකූල වේ |
| A.2.1 | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී භූමිකාවන් ඒකාබද්ධ කිරීම සාධාරණීකරණය කිරීම (එක් පුද්ගලයෙකු තුළ) | | අදාල නොවේ |
| A.3 | යහපත් ආයතනික පාලනයක් පවත්වාගැනීමේදී සභාපතිවරයාගේ වගකීම | සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයන අතර,<br>▪ අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී සහභාගීත්වය සහ දායකත්වය තහවුරු කරයි.<br>▪ සලකා බලනු ලබන ගැටළු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ අදහස් තහවුරු කරයි.<br>▪ අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ කටයුතු සම්පූර්ණයෙන්ම පාලනය කරන අතර සියලුම පාර්ශවකරුවන් වෙත එහි බැඳීම පිළිබඳ අනතුරු අඟවයි. | අනුකූල වේ |

| | | | |
|---|---|---|---|
| A.4 | ආයතනය සතු මූල්‍ය ඥානය | සමාගමේ මූල්‍ය කටයුතු කළමනාකරණය කිරීමේදී, අවශ්‍ය මූල්‍ය දැනුම සහ ප්‍රවීණත්වය ඔස්සේ මග පෙන්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය සතු මූල්‍ය වෘත්තිකයන් දෙදෙනෙකු ඇත.<br>▪ අවිනාශ් සිංහාල් මහතා දිල්ලි විශ්ව විද්‍යාලයේ, හින්දු විද්‍යාලයේ වාණිජ උපාධිධාරියෙකු වන අතර, ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් ගණකාධිකාරීවරයෙකි.<br>▪ විමලරත්න මහතා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය කළමනාකරණපති පශ්චාත් උපාධිය (MPM) ලබා ඇති අතර, වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසන් අදියර සමත්වූවෙකි. ඔහු ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ ජ්‍යෙෂ්ඨ ශිල්පීය මට්ටමේ සාමාජිකයෙකු ද (SAT), ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරීවරයෙකු (CBA) සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකි. | අනුකූල වේ |
| A.5 | අධ්‍යක්ෂ මණ්ඩල තුලනය | 2024 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් නව දෙනාගෙන් හය දෙනෙකු විධායක නොවන අධ්‍යක්ෂවරු වේ. | අනුකූල වේ |
| A.6 | සුදුසු විධිවිධාන සහ කාලෝචිත තොරතුරු | නියමිත රැස්වීමට පෙර අධ්‍යක්ෂවරුන්ට අදාළ තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් සැපයීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ න්‍යාය පත්‍රය කල්තියා බෙදා හරිනු ලැබේ. | අනුකූල වේ |
| A.7 | අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් | සාංගමික ව්‍යවස්ථාවලියේ නියමයන්ට යටත්ව වාර්ෂික මහා සභා රැස්වීමක් මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරු පත් කරනු ලැබේ. 2024 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්වීම් 54 සහ 55 පිටුවල ඇති වගුවේ දක්වා ඇත. | අනුකූල වේ |
| B | **අධ්‍යක්ෂවරුන්ගේ වේතනය** | | |
| B.1 | විධායක සහ අධ්‍යක්ෂ වේතන පිළිබඳ ප්‍රතිපත්තිය සංවර්ධනය සඳහා ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම | | අනුකූල වේ |
| B.2 | වේතන මට්ටම සහ සැකැස්ම | | අනුකූල වේ |
| B.3 | ගෙවන ලද අධ්‍යක්ෂ මණ්ඩල වේතන අනාවරණය කිරීම | මූල්‍ය තොරතුරු - විස්තරාත්මක ආදායම් ප්‍රකාශය | අනුකූල වේ |
| C | **කොටස් හිමියන් සමග සබඳතා** | | |
| C.1 | වාර්ෂික මහා සභා රැස්වීම (AGM) සහ මහා සභා රැස්වීම් පැවැත්වීම ඵලදායී ලෙස භාවිතා කිරීම. | | අනුකූල වේ |
| C.2 | කොටස් හිමියන් සමග සන්නිවේදනය | කාලෝචිත තොරතුරු බෙදා හැරීම සඳහා කොටස් හිමියන් දෙදෙනා සමග සමාගමට විධිමත් මාධ්‍යයක් ඇත. | අනුකූල වේ |

| | | | |
|---|---|---|---|
| C.3 | සම්බන්ධිත පාර්ශවවල ගනුදෙනු ඇතුළු ප්‍රමාණාත්මක ගනුදෙනු අධ්‍යක්ෂවරුන් විසින් කොටස් හිමියන්ට අනාවරණය කළ යුතුය. | | අනුකූල වේ |
| D | **වගවීම සහ විගණනය** | | |
| D.1 | මූල්‍ය වාර්තාකරණය | ▪ වාර්ෂික වාර්තාව මූල්‍ය තත්ත්වය, කාර්ය සාධනය, ව්‍යාපාර ආකෘතිය, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, අභියෝග සහ අවස්ථාවන් පිළිබඳ සමබර සමාලෝචනයක් ඉදිරිපත් කරන බව සහතික කිරීම සඳහා සියලු උත්සාහයන් ගනු ලැබේ.<br>▪ වාර්ෂික වාර්තාව සහ අනෙකුත් අතුරු වාර්තා සකස් කිරීමේදී සමාගමට අදාල නීති සහ රෙගුලාසි වලට අනුකූල විය.<br>▪ පහත සඳහන් අනාවරණයන් සංග්‍රහය මගින් උපදෙස් ලබාදී ඇති පරිදි වාර්ෂික වාර්තාවේ ඇතුලත් වේ.<br>i. කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය 30 - 50 පිටු.<br>ii. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 71-73 පිටු.<br>iii. සමාගමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය 86 පිටුව.<br>iv. අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රකාශය<br>v. අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 71 පිටුව.<br>vi. ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 78 - 85 දක්වා පිටු.<br>vii. සභාපතිගේ සහ කළමනාකාර අධ්‍යක්ෂගේ වගකීම පිළිබඳ ප්‍රකාශය 16-19 පිටු.<br>viii. මූල්‍ය ප්‍රකාශනවල සටහන් 19 හි අනාවරණය කර ඇති සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු.<br>ix. කැඳවීමට බරපතල ප්‍රාග්ධන අලාභ නොමැත.<br>▪ රජයේ චක්‍රලේඛවලට අනුව සමාගම විසින් අමාත්‍යාංශය ඉල්ලා සිටි අවශ්‍ය අනෙකුත් අතුරු වාර්තා ඉදිරිපත් කර ඇත. | අනුකූල වේ |
| D.2 | අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය | විගණන කමිටුවේ මගපෙන්වීමෙන් සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන්, ප්‍රතිපත්ති, අභ්‍යන්තර පාලන සහ කාලීන නියාමන වලින් සමන්විත ඉතා ඉහළ අවදානම් කළමනාකරණ රාමුවක් සමාගම විසින් ස්ථාපිත කර ඇත. 63 - 70 පිටුවල අවදානම් කළමනාකරණ කොටසේ සහ 74 - 76 පිටුවල විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාවේ මේවා විස්තර කර ඇත. | අනුකූල වේ |
| D.3 | විගණන කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වෙයි. එයට අභ්‍යන්තර විගණන අංශයේ සහාය ලැබේ. එහි සංයුතිය සහ විගණන කමිටුව විසින් සිදු කරනු ලබන කාර්යයන් වාර්ෂික වාර්තාවේ 74 - 76 පිටුවල සඳහන් වෙයි. | අනුකූල වේ |
| E | **ආයතනික ආයෝජකයින්** | | |
| | කොටස් හිමියන්ගේ ඡන්දය | කොටස් හිමියන්ගේ රැස්වීම්වලට සහභාගී වීමට සියලුම ආයතනික කොටස් හිමියන් දිරිගන්වනු ලබන අතර ඔවුන්ගේ අදහස් අදාළ සියල්ලන්ටම දැනුම් දෙනු ලැබේ. | අනුකූල වේ |
| | පාලනය හෙළිදරව් කිරීම් ඇගයීම | වාර්ෂික වාර්තාව ආයතනික පාලන ක්‍රියාවලිය විස්තර කරයි. | අනුකූල වේ |

| G | **අන්තර්ජාලය සහ සයිබර් ආරක්ෂාව** | | |
|---|---|---|---|
| | සයිබර් අවදානම් කළමනාකරණයට හා සමාගමේ අභ්‍යන්තර හා බාහිර තොරතුරු තාක්ෂණ උපාංග ආයතන ජාලයට සම්බන්ධ කරන ආකාරය පිළිබඳ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලයට තිබිය යුතුයි. | ▪ ආපදා ප්‍රතිසාධන කළමනාකරණ මධ්‍යස්ථාන (DRMC) ව්‍යාපෘතිය ක්‍රියාකාරීව ඇත.<br>▪ සැක සහිත ජාල ක්‍රියාකාරකම් නිතිපතා පරීක්ෂා කිරීම සහ සත්‍යාපනය සමග ජාල පරාමිති ආරක්ෂා කිරීම, දත්ත නැතිවීම, සයිබර් වංචා කිරීම, බෙදා හැරීමේ සේවා ප්‍රතික්ෂේප කිරීම, ජංගම දුරකථන උපාංග සහ සැක සහිත සයිබර් ක්‍රියාකාරකම් නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා ජාල ආරක්ෂණ තාක්ෂණය ක්‍රියාත්මක කිරීම.<br>▪ උපස්ථ සේවාදායකය (Backup server) සහ ප්‍රතිසාධන සේවාදායකය (recovery server).<br>වැඩිදුර විස්තර වාර්තාවේ 63 - 70 පිටුවල අවදානම් කළමනාකරණ කොටසේ විස්තර කර ඇත. | අනුකූල වේ |
| H | **පාරිසරික හා සමාජීය සාධක පාලන පිළිබඳ වාර්තාකරණය** (ESG) | | |
| | ESG කාර්ය සාධනයේ ප්‍රමාණවත් අනාවරණය | වාර්ෂික වාර්තාව කාර්ය සාධනය පිළිබඳ පරිපූර්ණ සමාලෝචනයක් සපයයි. සමූහය විසින් භාවිතා කරන විවිධ අංශවල කාර්ය සාධනය වාර්තාවේ වෙනම කොටස්වල විස්තර කර ඇත. | අනුකූල වේ |

# අවදානම් කළමනාකරණය

CPSTL ආයතනය දිගු කාලීන ස්ථායි වර්ධනයක් සහතික කර ගැනීම සඳහා ක්‍රමවත් සහ සුරක්ෂිත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිවල වැදගත්කම අවබෝධ කරගෙන ඒ අනුව කටයුතු කරයි. අපගේ මූල්‍ය අරමුණ වන්නේ අපගේ සංවිධාන ක්ෂේමතාවයේ සදාචාරාත්මක වටිනාකම වැඩි දියුණු කිරීමයි. මෙම කැපවීම යටතේ විරෝධාත්මක බලපෑම් ඇති කළ හැකි කරුණු සම්බන්ධයෙන් ඇති වාසි සහ අවාසිදායක බලපෑම් පිළිබඳ සවිස්තරාත්මක අවධානයක් දක්වයි. අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අඛණ්ඩ හා අනුවර්තිත බවකින් යුක්ත වන බැවින් එය අපගේ සමාගම් යෝජනා ක්‍රමවේදය සාර්ථකව ඉටු කිරීමේ මූලිකම කොටසකි.

අප සමාගමට මුහුණපාන ව්‍යාපාර අවදානම්, විවිධ සාධක මඟින් බලපවත්වන්නන් වන අතර, ඒ සියළු සාධක අපගේ පාලනයට යටත් නොවන බව පිළිගත යුතුයි. මෙම බාහිර අභියෝග, සමාගමේ ප්‍රසිද්ධිය, ආරක්ෂාව, පරිසර කාරණා, සෞඛ්‍ය හා ආරක්ෂණ සලකුණු, නිෂ්පාදන ගුණාත්මකභාවය හා තොරතුරු තාක්ෂණය යන සාමාන්‍ය ව්‍යාපාර අවදානම් සමඟ එකට, අපගේ සම්පූර්ණ අවදානම් කළමනාකරණ සැලැස්මට අන්තර්ගත වශයෙන් දෘඪව හා නිරන්තරයෙන් ඇගයීම් කෙරේ.

## ව්‍යාපාර අවදානම් කළමනාකරණ සැලැස්ම (ERM)

CPSTL සමාගමේ ආයතනික පාලන සැලැස්මේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස, අවදානම් කළමනාකරණය සමන්විත වන අතර එය කළමනාකරණ තීරණ, උපායමාර්ගික සැලසුම් හා දෛනික මෙහෙයුම් සමඟ අඛණ්ඩව සම්බන්ධ කර ඇත. CEYPETCO, LIOC, SINOPEC සහ RM Parks ආයතන වෙනුවෙන් තොග ඉන්ධනයන්හි භාරකරු ලෙස වගකීම් ඉටු කිරීමේදී මෙහෙයුම් අඛණ්ඩතාවය රැක ගැනීම සඳහා කාර්යක්ෂම අවදානම් කළමනාකරණය මූලික වන බව සමාගම අවබෝධ කරගෙන ඇත. ඉහළ අවදානම් පරිසරයක ක්‍රියාත්මක වන CPSTL, ව්‍යාපාර කාර්ය සාධනය අපේක්ෂිත ලෙස පැවැත්වීමට නොහැකි වන අවාසනාවන්ත සිදුවීම් වලින් ව්‍යාපාරික අරමුණු ආරක්ෂා කිරීම සඳහා සක්‍රීයව අවදානම් හඳුනා ගැනීම හා ඒ කෙරෙහි ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිරතුරු අවධානය දක්වයි. ව්‍යාපාර සැලැස්ම, වාර්තාකිරීම්, පරීක්ෂණ හා තොරතුරු පද්ධති තුළ අවදානම් සලකා බැලීම මඟින් අවදානම් අඩු කිරීම සඳහා සංවිධානාත්මක හා දූරදර්ශී පිළිවෙතක් සමාගම විසින් අනුගමනය කරයි.

සමාගම අවදානම් කළමනාකරණය සඳහා සංකීර්ණ ව්‍යාපාරමය අවදානම් පාලන සැලැස්මක් සකස් කර ඇත. මෙම සැලැස්ම එහි සංවිධාන සංස්කෘතිය සමඟ එකතු වී බලවත් ව්‍යාපාර අවදානම් කළමනාකරණයේ මූලික පදනම බවට පත්වී තිබේ. සංවිධාන සංස්කෘතිය සමාගමේ ආචාර ධර්ම, අගයන්, අභිප්‍රේරණයන් හා අවදානම් පිළිබඳ සියළු අවබෝධය අවධාරණය කරයි. මෙය සමාගමේ සියළු මට්ටම් අතර අවදානම් පිළිබඳ හැඟීම ලබා දීම හා සංවිධානයේ උපායමාර්ගික අරමුණු ඉලක්ක සමඟ හැසිරීම් එකඟතාවට ගෙන ඒමට අත්‍යවශ්‍ය වේ.

බලවත් අවදානම් සංස්කෘතියක් වගකීම, ආචාරවත් තීරණ ගැනීම, විවෘතභාවයෙන් යුත් සංවාදයන් සහ අවදානම් වෙත වගකීම් යොමු කිරීම වැඩි කරයි. මෙය දෛනික මෙහෙයුම් සහ උපායමාර්ගික තීරණ ගැනීම් ක්‍රියාවලීන් තුළ අවදානම් සම්බන්ධ කටයුතු සලකා බලන බව සහතික කරයි. තවද, මෙම සැලැස්ම කාලීන හා විනිවිදභාවයෙන් යුත් අවදානම් තොරතුරු සන්නිවේදනය සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කරන අතර, සමාගමට බාධක හමුවේ ධනාත්මක ප්‍රතිචාර දැක්වීමට ද අවස්ථාවන් සඳහා ශක්තිමත්ව ක්‍රියා කිරීමටද උපකාරී වේ. මෙම සැලැස්ම සමාගමේ සම්පූර්ණ වශයෙන් අවදානම් හඳුනා ගැනීම, ඇගයීම, කළමනාකරණය කිරීම සහ නිරීක්ෂණය කිරීම සඳහා සංවිධානාත්මක, සම්මත හා අඛණ්ඩ පිළිවෙතක් සපයයි. මෙය සමාගමේ පහළ මට්ටමේ සිට ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය දක්වා සියළුම සේවකයන් විසින් අවදානම් කළමනාකරණය පිළිබඳ තම භූමිකාව සහ වගකීම් පිළිබඳ අවබෝධයක් ලබා ඇති බවටත් එමඟින් ඒකාබද්ධ සහ සමගාමී වූ අවදානම් කළමනාකරණයක් ඇති බවත් සහතික කරයි.

## සැලැස්මේ ප්‍රධාන අංග

මෙම සැලැස්ම ප්‍රධාන අන්තර් සම්බන්ධිත අංග 6කින් සමන්විත අතර, එක් එක් අංගය අවදානම් පිළිබඳ දැනුවත් සංස්කෘතියක වැඩි දියුණු කිරීම සහ කාර්යක්ෂම තීරණ ගැනීම සඳහා සුවිශේෂී කාර්යභාරයක නිරත වේ.

I. **අවදානම්, අවදානම් කළමනාකරණ, සහ ව්‍යාපාර අවදානම් කළමනාකරණය**
සංවිධානයේ සාමාන්‍ය අවබෝධයක් පවත්වා ගැනීම සඳහා මූලික කරුණු පැහැදිලි කරයි.

II. **දැක්ම, මෙහෙවර, දර්ශනය, මූලික අගයන් සහ ERM මූලධර්ම**
අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහා මඟ පෙන්වන උපාය මාර්ගික පසුබිම සහ මූලධර්ම සපයයි.

III. **අවදානම් දරා ගැනීමේ හැකියාව**
සංවිධානය එහි අරමුණු සපුරාලීමේදී දැරිය හැකි අවදානම් ප්‍රමාණය සහ වර්ගය නිර්වචනය කරයි.

IV. **කළමනාකරණ ඉලක්ක**
ව්‍යාපාරික අරමුණු හා කාර්ය සාධනයට අනුකූලව අවදානම් කළමනාකරණ ක්‍රියාකලාප සම්බන්ධ කරයි.

V. **සම්පූර්ණ සංවිධානයට අදාළ අවදානම් පාලන ව්‍යුහය**
ERM පාලනය සහ වගකීම් සඳහා භූමිකා, වගකීම්, උපදෙස් සහ වාර්තා කිරීමේ මාර්ග සරලව විස්තර කරයි.

VI. **අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය**
අවදානම් හඳුනා ගැනීම, ඇගයීම, අවම කිරීම, නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා ක්‍රමානුකූල පියවර සකසා දක්වයි.







මෙම අංග හය (06) ඇතුලත් සමූහය සමගින් CPSTL සංස්කෘතියට, උපාය මාර්ගයන්ට හා දෛනික මෙහෙයුම් වලට අවදානම් පිළිබඳ දැනුවත්වන ලෙස ඒකාබද්ධව ඇතුළත් කරමින්, සම්පූර්ණ හා සමගාමී ව්‍යාපාර අවදානම් කළමනාකරණ (ERM) සැලැස්මක් නිර්මාණය කර ඇත.

අවදානම් කළමනාකරණය සමාගමේ උපාය මාර්ගික අරමුණු හා සම්බන්ධ කිරීම තුලින්, ආයතනය තුළ වගකීම් නියමාකාරයෙන් නිර්වචනය කිරීම තුලින් සහ නියමාකාරව සැකසූ පද්ධති ක්‍රියාවට නැංවීම මඟින් CPSTL ආයතනය අවදානම් සක්‍රිය ලෙස කළමනාකරණය කිරීම, මෙහෙයුම් ස්ථාවරත්වය සහතික කිරීම සහ සියලු පාර්ශවයන්ට දිගු කාලීන වටිනාකමක් නිර්මාණය කිරීම සිදු කරනු ලබයි.

මෙම සැලැස්ම මඟින් වේගවත් සහ අවදානම්කාරී පරිසරයක් තුළ විනිවිදභාවයෙන්, වගකීමෙන් දියුණුවකින් ක්‍රියා කිරීමට කැප වීමෙහි ඇති ශක්තිමත්භාවය පෙන්නුම් කරයි.

## අවදානම් පාලන ව්‍යුහය

අවදානම් පාලනය සමාගමේ මුළු ආයතනික පාලන සැලැස්මේ මූලික අංගයකි. එය අවදානම් කළමනාකරණය සංවිධානයේ සියලු මට්ටම්වලට ඒකාබද්ධ කළ බව සහතික කිරීම සහ උපායමාර්ගික සැලැස්ම, තීරණ ගැනීම සහ දෛනික මෙහෙයුම් සමඟ කාර්යක්ෂම ලෙස අන්තර්ගත වී ඇති බවට සහතික වේ. හොඳින් සංවිධානාත්මක අවදානම් පාලන සැලැස්මක් වගකීම, විනිවිදභාවය වැඩි දියුණු කරන අතර දිගු කාලීන සංවිධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා අවස්ථා සලසයි.

සමාගමේ අවදානම් පාලන ව්‍යුහය සංවිධානය පුරා අවදානම් කළමනාකරණයට අදාල පැහැදිලි භූමිකා සහ වගකීම් නිර්වචනය කරයි. මෙම භූමිකා විවිධ පාර්ශ්වකරුවන් අතර බෙදා හැරෙමින් පාලනය, මෙහෙයුම් හා සමාලෝචන කාර්යයන් සඳහා යොදා ගනී. එබැවින් සම්පූර්ණ සහ සම්බන්ධිත අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා ඉඩ සලසයි.

මෙම ව්‍යුහය බහුලව පිළිගත් හොඳම පරිචයන් වන ආරක්ෂාකාරී මූලධර්ම 3 ආකෘතියට (Three Lines of Defense) සමීපව සකස් කර ඇති අතර, එය අවදානම් කළමනාකරණයේ සහ වගකීම් වෙන්වීම් අතර වෙනස්කම් පැහැදිලි කරයි.

## අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අවදානම් කළමනාකරණය අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර සමාගමේ කාර්යක්ෂමතා සමීක්ෂණ සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වේ. අවදානම් කළමනාකරණයේ අරමුණ වන්නේ සිදුවීමට ඉදිරියෙන් ඇති සැක සහිත ගැටලු හඳුනාගෙන අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සැලසුම් කර අවශ්‍ය වන විට එම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මඟින් අරමුණු ඉටු කිරීමට බාධා වන අවදානම් අඩු කිරීමයි. අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පහත දැක්වෙන මූලික පියවරවලින් සමන්විත වේ.

1. **පරිසරය ස්ථාපිත කිරීම**
   සංවිධානය ක්‍රියාත්මක වන අභ්‍යන්තර හා බාහිර පරිසරය, අරමුණු, විෂය හා අවදානම් කළමනාකරණයේ ක්‍රියාමාර්ග සඳහා මූලධර්ම නිර්වචනය කරයි. මෙම පියවර මඟින් සම්පූර්ණ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට පදනමක් සලසයි.

2. **අවදානම් ඇගයීම**
   මෙය ව්‍යාපාරික අරමුණු ඉටු කිරීමේදී අභ්‍යන්තර හා බාහිර මූලාශ්‍රවල ඉදිරිපත් විය හැකි අවදානම්

හඳුනාගෙන විශ්ලේෂණය සහ ඇගයීම සිදු කිරීමේ ක්‍රමවත් ක්‍රියාවලියකි.

3. **අවදානම් නිරාකරණය / අවදානම් අවම කිරීම**
අවදානමේ බරපතල බව සහ ඇතිවීමේ හැකියාව අනුව සහ තක්සේරු කළ මට්ටම අනුව අවදානම් කළමනාකරණය සඳහා ක්‍රියාමාර්ග ගැනීම, අවදානම් හානි වැලැක්වීම, මාරු කිරීම, අවම කිරීම හෝ පිළිගැනීම ගන්නා ක්‍රියාමාර්ගයන්ට ඇතුළත් විය හැක.

4. **වාර්තා කිරීම, නිරීක්ෂණය සහ සමාලෝචනය**
අවදානම් සහ පාලන මිනුම් නිතරම සමාලෝචනය සහ යාවත්කාලීන කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියකි. එය අවදානම් පරිසරයේ වෙනස්කම් හඳුනාගෙන අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති කාර්යක්ෂමව පවත්වාගෙන යාමට උපකාරී වේ.

5. **සන්නිවේදනය සහ සාකච්ඡාව**
අවදානම් කළමනාකරණ සැලසුමේ අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස සම්පූර්ණ ව්‍යාපාර මට්ටමින් ඒකාබද්ධ කිරීමකි. එය සේවකයන් ඔවුන්ගේ භූමිකා අනුව සංවිධානයේ අවදානම් ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ වගකීම් පිළිබඳ දැනුවත්ව ඇති බව සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය, අවදානම් කළමනාකරණ සැලැස්ම පරීක්ෂා කිරීම, කාර්යක්ෂම අභ්‍යන්තර සන්නිවේදන ක්‍රියාවලීන් සකස් කිරීම හා අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පිළිබඳ බාහිර වාර්තාකිරීම් සඳහා වගකීම භාර ගැනීමේ මූලික භූමිකාවක් දරයි.



| සමාගමට බලපාන ප්‍රධාන අවදානම් පිළිබඳ විශ්ලේෂණය | | |
|---|---|---|
| **අවදානම** | **ප්‍රධාන මෙහෙයවන්නන්** | **අවම කිරීමේ උපාය මාර්ග** |
| **තරඟකරුවන්ගේ අවදානම** | | |
| අනෙකුත් පර්යන්ත සමාගම්වලින් අපගේ පාරිභෝගිකයින්ට අඩු මිලකට, ඉතා හොඳ ගබඩා පහසුකම් ලබාදිය හැකිනම් ඉන් ඇතිවන තරඟය අපගේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් ප්‍රතිඵල කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය.<br><br>2002 අංක 33 දරණ ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීමත් සමග 2022 ඔක්තෝබර් 21 දින සම්මත කරන ලද පනත් කෙටුම්පත හරහා පුද්ගලික අංශයට ශ්‍රී ලංකාව තුල ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය හා බෙදා හැරීම සඳහා බලපත්‍ර ලබා දෙනු ඇති අතර එමගින් අනාගතයේදී තරඟකරුවන්ගේ අවදානමක් නිර්මාණය විය හැක. | ▪ අප තරග කරන CPC සහ LIOC සමාගම් CPSTL හි කොටස් හිමියන් වෙති.<br>▪ පුද්ගලික සමාගම්වලට ඛනිජ තෙල් කර්මාන්තයට ඇතුළුවීමට අවස්ථාව ලබා දීම තුලින් අනාගතයේදී තරඟකාරිත්වයේ අවදානම වැඩි විය හැක. | ▪ ගබඩා ධාරිතාව වැඩි කිරීම හෝ වෙනත් ආකාරයකින් දැනට පවතින පර්යන්ත පුළුල් කිරීම.<br>▪ ටැංකිරථ සංචිතය පුළුල් කිරීම.<br>▪ සුදුසුකම් ඇති සේවකයින් බඳවා ගැනීම, පුහුණු කිරීම සහ උසස් සේවා ප්‍රමිතීන් පවත්වා ගෙන යාම.<br>▪ වෙනස්වන පාරිභෝගික මනාපයන්ට ගැලපෙන නව තාක්ෂණයෙන් පිරිපුන් සේවාවන් සැපයීම සඳහා පර්යේෂණ සහ සංවර්ධනය හරහා නවෝත්පාදන මත අඛණ්ඩව රැඳෙමින් අපගේ තරගකරුවන්ට වඩා ඉදිරියෙන් සිටීමට අපි අවධානය යොමු කරමු. |
| **සේවක රඳවා තබා ගැනීමේ අවදානම** | | |
| අපගේ අනාගත සාර්ථකත්වය රඳා පවතින්නේ අපගේ විධායක නිලධාරීන්ගේ සේවය සහ අනෙකුත් ප්‍රධාන සේවකයන්ගේ අඛණ්ඩ පැවැත්ම මතය. අපගේ විධායක නිලධාරීන්ගෙන් හෝ ප්‍රධාන සේවකයින් එක් අයෙකුගේ හෝ වැඩි ගණනක සේවය අහිමි වුවහොත් අපගේ ව්‍යාපාරයට, මෙහෙයුම් ප්‍රතිඵලයට සහ මූල්‍ය තත්ත්වයට හානියක් විය හැකිය.<br><br>රට තුල දැනට පවතින අවිනිශ්චිතතාවය මත වෘත්තිකයන් වෙනත් රටවලට සංක්‍රමණය වීමේ ප්‍රවණතාවක් පවතින අතර ඒ හේතුවෙන්, පළපුරුදු සේවකයින් අහිමි වීම හරහා සමාගමට බලපෑම් ඇති විය හැක. | ▪ රට තුළ පවතින ආර්ථික හා දේශපාලන අවිනිශ්චිතභාවය<br>▪ පවතින උසස්වීම් යෝජනා ක්‍රමය සහ ක්‍රියා පටිපාටි පිළිබඳ සේවක බලාපොරොත්තු සුන්වීම.<br>▪ වෘත්තියේ සංවර්ධන අවස්ථා නොමැතිකම.<br>▪ අගය නොකිරීමේ හැඟීම.<br>▪ දුර්වල නායකත්වය.<br>▪ නම්‍යශීලී බවක් නොමැති වීම. | ▪ ප්‍රධාන භූමිකාවන් සඳහා අනුප්‍රාප්තික සැලසුම්.<br>▪ ආයතනයේ සියළු මට්ටම් සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශන (KPI) පිහිටුවන අතර ඒවා සේවකයන්ගේ සියළු ඉදිරි උසස්වීම්, වැටුප් වර්ධන, ප්‍රසාද දීමනා සහ වෘත්තීය සංවර්ධන සම්බන්ධ තීරණයන්ට සෘජුව බැඳී යනු ඇත.<br>▪ උසස් තත්ත්වයේ දක්ෂතා සඳහා "Skill Fit" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.<br>▪ සේවක පිළිගැනීමට ලක්කිරීම සහ උසස්වීම් ඔස්සේ ශක්තිමත් සේවක වටිනාකම් ඇගයීම් හරහා සේවක අභිප්‍රේරණය පවත්වා ගැනීම.<br>▪ වෘත්තීය දියුණුව සඳහා අවස්ථා<br>▪ සමාජ සහ සුබසාධන සත්කාරකත්වය සඳහා අඛණ්ඩ නියැලීම්.<br>▪ සියලුම සේවකයින් ආවරණය වන ලෙස පුහුණු, සංවර්ධන සහ ව්‍යුහගත පුහුණු වැඩසටහන් සඳහා අඛණ්ඩ ආයෝජනය. |
| **ආර්ථික අවදානම** | | |
| සැහැල්ලු පිරිපහදු නිෂ්පාදන, අධි පිරිපහදු නිෂ්පාදන, බොරතෙල් සහ අනෙකුත් ආශ්‍රිත සේවාවන් කෙරෙහි පවතින ඉල්ලුම මත අපගේ මූල්‍ය ප්‍රතිඵල රඳා පවතී. | ▪ ගෝලීය වෙළෙඳපොළ බොරතෙල් බැරලයක මිල අනුව ඉන්ධන මිල සූත්‍රය නිරන්තරයෙන් වෙනස් කිරීමට සිදු විය.<br>▪ තීරුබදු / බදු, පොලී අනුපාත, උද්ධමනය, බලශක්තිය මිල පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ඉන්ධන නිෂ්පාදන සඳහා පවතින ඉල්ලුමට සෘජුවම බලපායි. | ▪ අහිතකර ආර්ථික සාධක හරහා පැන නගින අවිනිශ්චිත මූල්‍ය අර්බුදවලට විකල්ප ලෙස කෙටි කාලීන සහ දිගු කාලීන මූල්‍ය ආයෝජන ඉදිරිපත් කෙරෙයි.<br>▪ රසායනාගාර පරීක්ෂණ ගාස්තු, පුද්ගලික ටැංකි රථ පුහුණුව/ පෝටර් ගාස්තු, ගිනි නිවීමේ සේවා, ක්‍රමාංකන ගාස්තු, කුලියට දීම් ආදී වෙනත් මූලාශ්‍රවලින් ආදායම වැඩි දියුණු කිරීම.<br>▪ ඛනිජතෙල් කර්මාන්තය ලිහිල් කිරීම මගින් විදේශ මුදල් අර්බුදය හේතුවෙන් ඉන්ධන සැපයුම අඩාල වීමේ අවදානම අවම කිරීමට රජය පියවර ගෙන ඇත. මෙම පියවර පුද්ගලික අංශයට වෙළඳපොළට ඇතුළු වීමට ඉඩ සලසන අතර එමගින් අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීමට සහ විදේශ මුදල් සංචිතවල පීඩනය සමනය කිරීමට උපකාරී වේ. |

| | | |
|---|---|---|
| **දේශපාලන අවදානම** | | |
| දේශපාලනික සහ නියාමන සාධක ව්‍යාපාරික පරිසරයට සැලකිය යුතු ලෙස බලපෑ හැකි අතර අප සමාගම ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තයේ ක්‍රියාත්මක වන බැවින් දේශපාලන අවදානම් කිහිපයකට මුහුණ දීමට සිදු විය හැකි එම දේශපාලන අවදානම් වලට ඇතුළත් වන්නේ: | ▪ **නියාමන වෙනස්කම්:** ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් කර්මාන්තය ලිහිල් කිරීම සඳහා 2002 අංක 33 දරණ ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම.<br>▪ **ඉන්ධන මිල පාලනය**<br>▪ **රජයේ ප්‍රතිපත්ති වෙනස් කිරීම්:** මිල නියම කිරීම්, බදුකරණය සහ ආනයන/අපනයන ප්‍රතිපත්ති ඇතුළුව ඛනිජතෙල් කර්මාන්තයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම් CPSTL හි මෙහෙයුම් සහ ලාභදායිත්වයට සෘජුවම බලපෑ හැකිය.<br>▪ **විදේශ විනිමය පාලනය:** මුදල් අර්බුද හෝ ආර්ථික අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, ආනයන සහ ගෙවීම් සඳහා විදේශ මුදල් ප්‍රවේශ කිරීමට CPSTL සතු හැකියාව කෙරෙහි බලපාන විදේශ විනිමය පාලනයන් රජය විසින් පැනවිය හැක.<br>▪ **භූ දේශපාලන ආතතීන්:** අසල්වැසි රටවල් සහ ගෝලීය බලවතුන් සමඟ ශ්‍රී ලංකාවේ භූ දේශපාලනික සබඳතා ඛනිජතෙල් කර්මාන්තයට බලපෑම් කළ හැකි අතර අවිනිශ්චිතභාවයක් ඇති කළ හැකිය. | ▪ මෙම දේශපාලන අවදානම් අවම කිරීම සඳහා, ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට ක්‍රියාශීලී අවදානම් කළමනාකරණය සහ රාජ්‍ය සම්බන්ධතා පවත්වා ගැනීම යන ප්‍රයත්නවල නිරත විය හැක. මෙයට රාජ්‍ය නිලධාරීන් සමග අඛණ්ඩ සංවාදයන්, රෙගුලාසි පිළිපැදීම සහ අනුකූලතා ප්‍රමිතීන් ඇතුළත් විය හැකිය.<br>▪ ව්‍යාපාර මෙහෙයුම් විවිධාංගීකරණය කිරීම. |
| **සේවක සබඳතා අවදානම** | | |
| අපගේ සේවකයින්ගෙන් 99% ක් පමණ වෘත්තීය සමිති සාමාජිකයන් වන අතර ආයතනය ඒ නිදහසේ අයිතිය පිළිගෙන ඇත.<br>උදාහරණයක් ලෙස, රජයේ ආයතන පෞද්ගලීකරණය කිරීමට සහ ඛනිජ තෙල් පනත සංශෝධනය කිරීමට එරෙහිව වසර තුළ විරෝධතා කිහිපයක් පැවැත්විණි. | ▪ වෘත්තීය සමිති කම්කරු වැඩ වර්ජන අනවශ්‍ය බාධා ඇති කරයි. | ▪ වෘත්තීය සමිති සමග සබඳතා ශක්තිමත් කිරීමට සහ දුක්ගැනවිලි තර්ජනීය අවදානමක් දක්වා වර්ධනය වීමට පෙර ඒවා විසඳීමට වේදිකාවක් ලෙස භාවිතා කෙරෙයි.<br>▪ සැලකිලිමත් විය යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට වෘත්තීය සමිති නියෝජිතයන් සමග විධිමත් ව්‍යුහගත සංවාදයන්<br>▪ සැලකිලිමත් විය යුතු ක්ෂේත්‍ර පිළිබඳ සාකච්ඡා කිරීමට සේවකයින් සඳහා විවෘත ප්‍රතිපත්තියක් |

| ස්වාභාවික උපද්‍රව සහ අවිනිශ්චිතතා | | |
|---|---|---|
| ස්වාභාවික විපත් සහ අපගේ පාලනයෙන් තොර වෙනත් සිදුවීම් නිසා අපගේ මෙහෙයුම්වලට බලපෑම් ඇති විය හැක. | ▪ ගංවතුරෙන් බාධා, නායයෑම්, දරුණු කුණාටු<br>▪ ත්‍රස්ත ක්‍රියා | ▪ ඇතැම් අවදානම් හඳුනාගෙන ඒවාට පිළියමක් ලෙස රක්ෂණ ආවරණ ලබා ගෙන ඇත.<br>▪ සමාගම ආර්ථික මර්මස්ථානයක් බැවින් අධි ආරක්ෂිත පියවර සහ පාලනයන් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| **මෙහෙයුම් අවදානම** | | |
| සමාගමට මෙහෙයුම් ආශ්‍රිත උපද්‍රව බලපෑ හැකිය. | ▪ අනපේක්ෂිත කාන්දුවීම් /නල මාර්ගවලට හානි වීම් මෙහෙයුම් ප්‍රමාදයක් ඇති කරයි.<br>▪ යටිතල පහසුකම් හෝ පහසුකම් සැපයුමේ බාධා<br>▪ අනතුරු<br>▪ මහා පරිමාණ ගිනි | ▪ කාන්දුවීම් හා හානි අවම කිරීම සඳහා නල මාර්ග නිතිපතා සේවා සැපයීම සහ නඩත්තු කිරීම.<br>▪ ඕනෑම හානිකර බලපෑමක් අවම කිරීම සඳහා සේවකයන් ප්‍රමාණවත් ලෙස පුහුණු කර ඇත.<br>▪ CPSTL විසින් ගෘහස්ථ ගිනි නිවන ඒකකයක් රඳවා ඇත. |
| **නෛතික අවදානම** | | |
| අපගේ මෙහෙයුම් නිෂ්පාදන තත්ත්ව පිරිවිතරයන්ට අදාල ශ්‍රී ලංකා නීති සහ රෙගුලාසිවලට යටත් වේ. එසේම අපගේ අලෙවිකරුවන් විසින් බෙදා හරින අපේ නිෂ්පාදනවල ප්‍රමිතිය පිළිබඳ වගකීම අප සතු ය. | ▪ වාෂ්ප පීඩනය, සල්ෆර් අන්තර්ගතය, එතනෝල් අන්තර්ගතය සහ ජෛව ඩීසල් සාන්ද්‍රණය යනාදි නිෂ්පාදන තත්ත්ව පිරිවිතර සුරැකීම හෝ මිශ්‍ර කිරීම පිළිබඳ නෛතික අවශ්‍යතා<br>▪ මෙහෙයුම් වලට සම්බන්ධ නිෂ්පාදනවල ගුණාත්මකභාවය උල්ලංඝනය කිරීම මත අපට ආරෝපණය කළ හැකි නීති මගින් සැලකිය යුතු දඩ සහ දඬුවම් මෙන් ම ඍණාත්මක ප්‍රචාරයන්වලට ද මුහුණ දීමට සිදුවිය හැක.<br>▪ බෙදා හරින ලද ප්‍රමිතියෙන් තොර නිෂ්පාදන නිසා එන්ජින් කාර්ය සාධනය දුර්වල වී හෝ එන්ජින් හානියක් සිදුවී ඇත්නම් ඒ සඳහා වගකිව යුතු මෙන් ම ඍණාත්මක ප්‍රචාරයන්වලට ද මුහුණ දීමට සිදුවිය හැක. | ▪ CPSTL සතුව, ඕනෑ ම ආකාරයක ඉන්ධන විශේෂයක් පිළිබඳ පරීක්ෂණ සියුම් ලෙස සිදුකිරීම සඳහා තත්ත්ව පාලන යාන්ත්‍රණ සහ අනුකූලතාවය සහ නියාමනය පිළිබඳ සහතික ලත් නවීන රසායනාගාරයක් ඇත. |

| | | |
|---|---|---|
| **සෞඛ්‍යය, ආරක්ෂාව සහ පාරිසරික අවදානම** | | |
| සංකීර්ණ සහ නිතර වෙනස් වන පාරිසරික, සෞඛ්‍යය සහ ආරක්ෂාව, නීති සහ රෙගුලාසිවලට, අනුකූල වීමේදී අපට සැලකිය යුතු පිරිවැයක් සහ වගකීම් දැරීමට සිදු විය හැකිය. | ▪ වහා ගිනි ඇවිලෙන සුළු නිෂ්පාදන හැසිරවීමේ මෙහෙයුම් කටයුතු අධි අවදානම් කාණ්ඩයට අයත් වේ. සුළු අත් වැරැද්දකින් වුව ද මහා පරිමාණ ගින්නක් ඇතිවිය හැකි නිසා එවැනි සිදුවීමක් වුව ද සමාග මේ මෙහෙයුම් මෙන්ම රටේ ආර්ථිකය අඩපණ කිරීමට හේතු වනු ඇත.<br>▪ ගබඩා කිරීම, හැසිරවීම සහ ඛනිජතෙල් ප්‍රවාහන ක්‍රියාවලියේදී හානිකර වායු, ගෑස් සහ ද්‍රව්‍ය වායු ගෝලයට සහ පරිසරයට විමෝචනය කිරීම.<br>▪ අපගේ ව්‍යාපාරය තුළ අහඹු කාන්දුවීම්, විසර්ජන හෝ වෙනත් ඛනිජතෙල් නිකුත් වීම් සහ අනතුරුදායක සිදුවීම් නෛසර්ගිකව විය හැකිය. පරිසරයට සහ අසල්වැසි ප්‍රදේශයන්ට එවැනි අවදානමක් ඇත්නම් වගකීම් සහගතව පිළියම් යෙදීමට සිදුවේ.<br>▪ අදාල පාරිසරික, සෞඛ්‍යය සහ ආරක්ෂක නීති සහ රෙගුලාසිවලට අනුකූල වීමට අපොහොසත් වුවහොත් අපගේ සියලුම මෙහෙයුම් අවලංගු කිරීම් සහ වාරණ නියෝග පැනවීමටත් සමහරක් සීමා කිරීම හෝ තහනම් කිරීම සිදු විය හැක. | ▪ CPSTL විසින් ප්‍රථමාධාර පුහුණුව, ගිනි ආරක්ෂක පුහුණුව සහ දැනුවත් කිරීමේ වැඩසටහන් නිරතුරු ක්‍රියාත්මක කරයි. යොදවා ඇති ගිනි ආරක්ෂණ උපකරණ නිරතුරුව පරීක්ෂා කර උපරිම ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බව සහතික කරනු ලැබේ. එනම් නිතිපතා ගිනි සයිරන් ක්‍රියාකාරීදැයි පරීක්ෂා කිරීම, කාර්යාලීය උපකරණවලට ලිහිසි තෙල් දැමීම සහ නළ මාර්ග නිතිපතා පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.<br>▪ CPSTL වරින් වර විධිමත් ටෙන්ඩර් ක්‍රියාවලියක් මගින් අපවිත්‍ර තෙල් බැහැර කරන අතර, අපද්‍රව්‍ය පරිසරයට හානි නොකරන බවට සහතික වෙයි.<br>▪ අපජලයේ ගුණාත්මකභාවය අවශ්‍ය ප්‍රමිතිය රඳවා ගැනීමට අපජල බැහැර කිරීමේ පද්ධතිය නියාමනය කර ඇත.<br>▪ නිසි ලෙස කසළ වෙන් කිරීම සහ බැහැර කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කර ඇත.<br>▪ නළ මාර්ග/ අක්වෙරළ කාන්දුවීම් හැසිරවීම සඳහා මනා පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් යොදවා ඇත. |
| **සයිබර් අවදානම** | | |
| අපගේ වත්කම් ක්‍රියාත්මක කිරීමට සහ ව්‍යාපාර කළමනාකරණය කිරීමට තාක්ෂණික පද්ධති භාවිතා කරන අතර සයිබර් ප්‍රහාරයක් හෝ වෙනත් ආරක්ෂක බිඳවැටීමක් නිසා අපගේ තොරතුරු තාක්ෂණික පද්ධති වල කඩාවැටීමක්, තීරණාත්මක මෙහෙයුම් හෝ මූල්‍ය පාලනයන් බිඳ වැටීමට මෙන්ම වාණිජ ක්‍රියාකාරකම් හෝ මූල්‍ය ක්‍රියාවලීන් ඇණහිටීමට හේතු විය හැකිය. | ▪ සයිබර් සිදුවීම්වල බලපෑම, හැකර්වරුන්ගේ ඉලක්කගත ප්‍රහාරයක්, ඉලක්කගත නොවන ප්‍රහාරයක්, අභ්‍යන්තරික ප්‍රහාරයක්, අහඹු සයිබර් ප්‍රහාරයක් හෝ ඒ අතුරින් කිහිපයකින් එල්ල විය හැකිය. | ▪ ජාල පරිමිතිය ආරක්ෂාව කළමනාකරණය කිරීමේ තාක්ෂණය, දත්ත නැතිවීම, සයිබර් වංචා කිරීම, බෙදා හරින ලද සේවා ප්‍රහාරය ප්‍රතික්ෂේප කිරීම, ජංගම උපාංග සහ සැක සහිත සයිබර් ක්‍රියාකාරකම් නිරීක්ෂණය, පාලනයන් නිතිපතා පරීක්ෂා කිරීම සහ සත්‍යාපනය යනාදී ජාල ආරක්ෂණයන් ක්‍රියාත්මක කිරීම.<br>▪ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක ආපදා ප්‍රතිසාධන කළමනාකරණ මධ්‍යස්ථානය (DRMC)<br>▪ උපස්ථ සේවාදායකය සහ ප්‍රතිසාධන සේවාදායකය |
| **තොග, දේපළ සහ උපකරණ පිළිබඳ අවදානම** | | |
| ගබඩා කළ නිෂ්පාදනවල ගිනිගැනීමේ ස්වභාවය හේතුකොටගෙන, රක්ෂණ ආවරණයේ කිසියම් ප්‍රමාණවත් නොවන/ අපැහැදිලි බවක් මගින් රක්ෂණ සමාගම විසින් රක්ෂණ හිමිකම් අගරු කිරීමකට හේතු විය හැක. | | ▪ IBSL යටතේ ලියාපදිංචි වී ඇති කීර්තිමත් සමාගම්වලින් ලබාගත් රක්ෂණය<br>▪ CPSTL විසින් ගිනි සහ වාණිජ රක්ෂණය, නැව්කඳ ඔප්පුව (අක් වෙරළ නළ මාර්ග), නිෂ්පාදන රක්ෂණය, රථවාහන රක්ෂණය, ගබඩා ටැංකි සහ උපකරණ රක්ෂණ ආදී ප්‍රමාණවත් රක්ෂණ ආවරණ ලබා ගෙන ඇත. |

| ඉන්ධන පර්යන්ත කර්මාන්තය සබැඳි නිශ්චිත වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් නොමැතිවීම/ සීමිතකම | | |
|---|---|---|
| කාර්යය ක්‍රියාත්මක කිරීමේ වේගය සහ ඉහළ වැඩ පිරිවැය | | ▪ කාර්යයන් භාර දීමෙන් දේශීය සේවක පිරිස් සංවර්ධනය කිරීමේ හැකියාව ඇති විදේශීය පාර්ශවයන් සමග ඔවුන් සක්‍රීයව සහභාගී කරවීම. |
| **ප්‍රාදේශීය ප්‍රජා සම්බන්ධතා පිළිබඳ අවදානම** | | |
| සමාගමේ ප්‍රතිරූපය ගොඩනැගීමේ දී ප්‍රජාවන්ගේ සමාජ-ආර්ථික ප්‍රගතිය බලගැන්වීම සහ දායක වීම සඳහා අපේ ක්‍රියාත්මක වීම ඉතා වැදගත් වේ. | | ▪ ඉහළ මට්ටමේ ප්‍රජා සහභාගීත්වය සහ අපේ ප්‍රජාවන් සමග අර්ථවත් සබඳතා පෝෂණය කිරීම.<br>▪ දැනට පවතින ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කිරීම. |
| **වංචා සහ නීති විරෝධී ක්‍රියා** | | |
| කළමනාකරණ වංචා, සේවක වංචා සහ වෙනත් නීති විරෝධී ක්‍රියා පිළිබඳ අවදානම | | ▪ අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකයක් ලබා දීමේ ක්‍රියාවලිය සඳහා CPSTL සමාගමට වෙනම අභ්‍යන්තර විගණන අංශයක් ඇත.<br>▪ සෑම ක්‍රියාවලියක් සඳහාම අංශ ප්‍රධානීන්ගේ අධීක්ෂණය සහ අභ්‍යන්තර විගණන අංශයේ මගපෙන්වීම යටතේ බලය පැවරීම.<br>▪ බාහිර විගණකවරුන් විසින් ඇගයීමට ලක් කරන ලද මූල්‍ය ප්‍රකාශයේ අඛණ්ඩතාව |

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

2007 අංක. 7 දරණ සමාගම් පනතට අනුව පිළියෙල කළ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා, සමාගමේ කටයුතු පිළිබඳ වූ වාර්ෂික වාර්තාව පිළිගැන්වීමට ලැබීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ සතුට ප්‍රකාශ කරමු.

## ප්‍රමුඛ ක්‍රියාකාරීත්වය

සමාගමේ ප්‍රමුඛ ක්‍රියාකාරීත්වය වන්නේ ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් තොග ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ කටයුතු පහසුකිරීම සඳහා පිහිටුවා ඇති පොදු පරිශීලක පහසුකම සහ 2003 ඔක්තෝබර් 13 දිනැති අංක 1310 - 8 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්ත, ගබඩා පහසුකම්, නළ මාර්ග, බවුසර් ඇණියෙන් සමන්විත ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ යටිතල පහසුකම් අයිතිකාරීත්වය සමග ක්‍රියාත්මක කිරීමත් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් භුක්තිවිඳින කොලොන්නාව සහ මුතුරාජවෙල පර්යන්තයන්, දිවයින පුරා පිහිටි තොග ගබඩා හා ඒ ආශ්‍රිත පහසුකම්, කොළඹ වරායේ තෙල් පහසුකම් භාවිත කිරීමට අයිතිය සහ/හෝ බදු අයිතිය, ඒකස්ථාන පාවෙන බෝයාවේ සිට මුතුරාජවෙල පර්යන්තය දක්වා වූ කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා නළ මාර්ගයේ සිට පාරිභෝගිකයින්ගේ සීමා දක්වා ගාලු වරායේ සිට මාගල්ල තොග ගබඩාව දක්වා නළ මාර්ගය ඉහත සඳහන් කළ පර්යන්ත සහ තොග ගබඩා තුල පිහිටි නළ මාර්ග සහ/හෝ කාර්යයන් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට අයත්ය.

## මෙහෙයුම් සහ මූල්‍යමය විශේෂතා සමාලෝචනය

රු.3,381,228,846/- ක ශුද්ධ ලාභයක් සමග රු.18,898,875,688/- ක ආදායමක් මෙහෙයුම්වලින් පෙන්වා ඇත.

| විස්තර | 31.12.2024 රු. | 31.12.2023 රු. |
|---|---|---|
| ආදායම | 18,898,875,688 | 10,150,031,584 |
| බදුවලට පෙර ලාභය | 4,998,057,255 | (314,493,117) |
| බදුවලට පසු ලාභ/අලාභ (PAT) | 3,381,228,846 | 36,611,411 |

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 7,500,000,000/-කි. කොටස් හිමිකාරීත්වයේ බෙදීයාම පහත පරිදි වේ.

| | සාමාන්‍ය කොටස් |
|---|---|
| ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 500,000,000 |
| ලංකා IOC සමාගම | 250,000,000 |

## දේපළ, පිරියත සහ උපකරණ

වසර තුල දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් පිළිබඳ දත්ත මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන - 10 යටතේ දක්වා ඇත.

### ලාභාංශ

අධ්‍යක්ෂවරු 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වසරට සමාගමේ ලාභාංශ නිර්දේශ කොට නැත.

### 2024 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂවරු

2024 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය:

- ඩී.ජේ.ඒ.එස්.ද සිල්වා රාජකරුණා මහතා
- ආචාර්ය එන්.කේ.එම්.සී. නෙත්තිකුමාර මහතා
- දීපක් දාස් මහතා
- ඩබ්.එස්.එච්. කුමාර මහතා
- ඒ. සිංහාල් මහතා
- එස්.කේ. මහාරණ මහතා
- එස්.එච්.ටී. කුමාර මහතා
- ඒ.ජේ.එල්. විමලරත්න මහතා
- එම්.එම්.සී. ඩොස් මහතා

### අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප්

අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප්, මූල්‍ය ප්‍රකාශනයේ විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

### සම්බන්ධතා ලේඛනය

2007 අංක. 07 දරණ සමාගම් පනත අනුව සමාගම සම්බන්ධතා ලේඛනයක් පවත්වා ගනියි. 2007 අංක. 07 දරණ සමාගම් පනතෙහි 192(2) දරණ වගන්තිය අනුව සියලු අධ්‍යක්ෂවරු ප්‍රකාශ නිකුත් කොට ඇත. අදාල දත්ත සමාලෝචිත වර්ෂය තුල සම්බන්ධතා ලේඛනයට ඇතුලත් කොට ඇත.

### ව්‍යවස්ථාපිත ගෙවීම

සමාගම රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සියලු ව්‍යවස්ථානුකූල ගෙවීම් තම අවබෝධයට අනුව මේ දක්වා ගෙවා ඇති බවට හෝ පොත්වල ප්‍රතිපාදනය කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්ව ඇත.

### අඛණ්ඩ පැවැත්ම

සිය ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට තරම් ප්‍රමාණවත් සම්පත් ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි. අඛණ්ඩ පැවැත්මේ පදනම මූල්‍ය වාර්තා සැකසීමට යොදාගැනීම යෝග්‍ය බව අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරයි.

### ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

සමාගම වෙත ප්‍රමාණවත් බලපෑම් ඇතිකරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ගැලපීම් අවශ්‍ය කරන මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක. 22 යටතේ දක්වා ඇති ඒවා හැර ශේෂපත්‍ර දිනයෙන් පසු සිදුවූ වැදගත් සිදුවීම් නොමැත.

### විගණකවරු

19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව, සමාගමේ විගණකවරු වශයෙන් විගණකාධිපති හෝ ඔහු විසින් නම්කළ අයෙකු සමාගමට පත්කිරීම අවශ්‍ය වේ.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂයේ විගණන කටයුතු ජාතික විගණන කාර්යාලය විසින් සිදුකරන ලදී. විගණකවරුන්ට සිදුකළ ගෙවීම් මූල්‍ය ප්‍රකාශවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

විගණකවරුන්ට සමාගම හෝ සමාගම් සමූහය සමග කිසිදු සම්බන්ධයක් (විගණකවරයෙක් වශයෙන් හැර) නොමැති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවබෝධයයි. ඔවුන් වරලත් ගණකාධිකාරීවරුන්ගේ

ආයතනයේ ආචාර ධර්ම මාලාවට අනුකූල බවත්, ස්වාධීන බවත් අධ්‍යක්ෂ මණ්ඩලය අවධාරණය කරයි.

## සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම

සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2025 අගෝස්තු 26 වන දින ප.ව. 3ට සමාගමේ ලියාපදිංචි කාර්යාලයේදී පැවැත්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්,

**සභාපති** **අධ්‍යක්ෂ**

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩිලොයිට් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
**ලේකම්වරු**

# විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

## කමිටුවේ කාර්යභාරය

විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) යනු අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ විධිමත් ලෙස පිහිටුවා ඇති අනු කමිටුවකි. එය අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර වගවීමට බැඳී සිටී. විගණන සහ කළමනාකරණ කමිටුවේ මූලික කාර්යභාරය වන්නේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ අඛණ්ඩතාව සහ විශ්වාසනීයත්වය සහතික කරන අතරම සමාගමේ පාලන ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ කාර්යය ක්‍රියාත්මක කිරීම, ගැටළු විසඳීම සහ සහාය වීමයි. එය ජාත්‍යන්තර හොඳම භාවිතයන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිර්වචනය කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අදාළ දේශීය නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සහතික කරයි.

## සංයුතිය

2024 මැයි මස 29 වන දින දක්වා CPSTL හි විගණන සහ කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නොවන පහත සඳහන් ස්වාධීන අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකුගෙන් සමන්විත විය.

- ඊ.ඒ. රත්නසීල මහතා - සභාපති
- අසීම් භාර්ගවා මහතා - සාමාජික
- මනෝජ් ගමගේ මහතා - සාමාජික
- යසිරු ලංකාතිලක මහතා - සාමාජික

2024 නොවැම්බර් මස 22 වන දින සිට පහත සඳහන් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් CPSTL හි විගණන සහ කළමනාකරණ කමිටුව නියෝජනය කළහ.

- එස්.හේමන්ත විජිත කුමාර මහතා - සභාපති
- ඒ. සිංහාල් මහතා - සාමාජික
- ඩී.ජේ.එල්. විමලරත්න මහතා - සාමාජික

රාජ්‍ය වාණිජ ව්‍යවසායන්හී විගණන සහ කළමනාකරණ කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව වගකීම්, අධිකාරීන් සහ නිශ්චිත රාජකාරී විෂය පථය ආවරණය කරමින් කමිටුවේ විගණන ප්‍රඥප්තිය සකස් කර ඇත.

## විගණන සහ කළමනාකරණ කමිටුවේ කාර්යයන්

ක්‍රියාවලීන්ගේ විශ්වාසනීයත්වය සහතික කිරීම සඳහා වාර්ෂික මූල්‍ය වාර්තාකරණයේ සකස් කිරීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම් වල ප්‍රමාණවත් බව සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයන්හි අනුකූලතාව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සමපාත වීම කමිටුව සමාලෝචනය කරයි. එමෙන්ම සමාගමේ මූල්‍ය වාර්තාකරණයට අනුකූල වීමේ අවශ්‍යතාව, සමාගම් පනතට අදාළ තොරතුරු අවශ්‍යතා සහ අනෙකුත් අදාල මූල්‍ය වාර්තාකරණයට අදාල රෙගුලාසි සහ අවශ්‍යතා කමිටුව සමාලෝචනය කරයි. තවද කමිටුව අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත් බව ද, ස්වාධීනත්වය සහ බාහිර විගණකවරුන්ගේ කාර්ය සාධනය ද තක්සේරු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම ද කමිටුව සමාලෝචනය කරයි. එසේම සමාගම අවදානමකට නිරාවරණය වී ඇත්නම් ඒවා කළමනාකරණය කිරීම සහ එවැනි අවදානම් වලින් පැන නගින බලපෑම අවම කිරීම සඳහා සමාගම විසින් ගත යුතු ක්‍රියාමාර්ග ද යෝජනා කරයි.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යාංශය 2020 ඔක්තෝබර් මාසයේ සිට මහේන්ද්‍ර ජයසේකර මහතා FCMA, CPA (Aus), MBA විසින් මෙහෙයවනු ලැබේ. අභ්‍යන්තර විගණන කණ්ඩායමට මූල්‍ය, තොරතුරු තාක්ෂණය, තොරතුරු ආරක්ෂාව, වංචා විමර්ශනය ඇතුළු විෂය ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගේ සම්මිශ්‍රණයක් ඇති අතර, කාර්යාංශය විසින් අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ (IIA) ගෝලීය හොඳම පරිචයන් යොදා ගනී.

වත්කම් සුරක්ෂිත බවට සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය මෙන් ම පද්ධතිය මත විශ්වාසය තැබිය හැකි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා නිර්මාණය කර ඇති ගිණුම්කරණ ක්‍රම සහ මූල්‍ය පාලනයේ සඵලතාවය තක්සේරු කිරීමට අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ විෂය පථය සහ ආවරණය විගණන සහ කළමනාකරණ කමිටුව සමාලෝචනය කරයි. අභ්‍යන්තර විගණන කාර්යාංශය සමාගම තුළ ස්ථාපිත කර ඇත. ක්‍රියාත්මක වෙමින් පවතින විගණන නිර්දේශ තහවුරු කර ගැනීමට වරින් වර පසු විපරම් සමාලෝචන සැලසුම් කර ඇත.

අවදානම් පාදක අභ්‍යන්තර විගණනය යනු 2018 දී අභ්‍යන්තර විගණනයේ විෂය පථය පුළුල් කිරීම සඳහා අලුතින් හඳුන්වා දුන් ප්‍රවේශයකි. අවදානම් ශ්‍රේණිගත කිරීම තුළින් එවැනි ගැටළු කෙරෙහි ක්ෂණික පිළියම් ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය තුළ වැඩි අවධානයක් යොමු කරවයි. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය මගින් අභ්‍යන්තර විගණන විෂය පථය පාලනය කෙරෙයි.

## ව්‍යවස්ථාපිත විගණනය

කමිටුව, 2018 ජාතික විගණන පනතට අනුකූලව විගණනයේ ස්වභාවය, ප්‍රවේශය සහ විෂය පථය සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ විගණකවරුන් සමග ද සාකච්ඡා කරයි. මතුවන ලද ගැටළුවලට සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ සඵලතාවයට කළමනාකාරීත්වය ගනු

ලබන පියවර ද සාකච්ඡා කෙරෙයි.

## රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ ඔවුන් වෙත පවරා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා ඇත.

වසර තුළ විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී වූ සාමාජිකයින් සහ නිරීක්ෂකයින් පහතින් සටහන් වේ.

| අනු අංකය | දිනය | කමිටුවේ ශක්තිය | සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව | සාමාජිකයින්ගේ නම් |
|---|---|---|---|---|
| 01 | 20.02.2024 | 04 | 04 | ටී.ඒ. රත්නසීල මහතා - සභාපති<br>අසීම් භාර්ගවා මහතා - සාමාජික<br>මනෝජ් ගමගේ මහතා - සාමාජික<br>යසිරු ලංකාතිලක මහතා - සාමාජික<br>ඩී.ජී.ඒ.එස්. අනුලසිරි මහතා (නිරීක්ෂක-ජාතික විගණන කාර්යාලය)<br>කේ.එස්. සමදරා මිය (නිරීක්ෂක-ජාතික විගණන කාර්යාලය)<br>ඩී.පී.එස්.ජේ. කුමාර මහතා (නිරීක්ෂක-විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය) |
| 02 | 29.05.2024 | 04 | 02 | ටී.ඒ. රත්නසීල මහතා - සභාපති<br>යසිරු ලංකාතිලක මහතා - සාමාජික<br>ඩී.ජී.ඒ.එස්. අනුලසිරි මහතා (නිරීක්ෂක-ජාතික විගණන කාර්යාලය)<br>කේ.එස්. සමදරා මිය (නිරීක්ෂක-ජාතික විගණන කාර්යාලය)<br>ඩී.පී.එස්.ජේ. කුමාර මහතා (නිරීක්ෂක-විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය) |
| 03 | 22.11.2024 | 03 | 03 | එස්.හේමන්ත විජිත කුමාර මහතා - සභාපති<br>ඒ. සිංහාල් මහතා - සාමාජික<br>ඒ.ජේ.එල්. විමලරත්න මහතා - සාමාජික<br>එන්.එච්.ඒ.ආර්.කේ. ගුණරත්න මහතා (නිරීක්ෂක-ජාතික විගණන කාර්යාලය)<br>එස්.යු.ඩී. මානවසිංහ මහතා (නිරීක්ෂක-ජාතික විගණන කාර්යාලය)<br>ඩී.පී.එස්.ජේ. කුමාර මහතා (නිරීක්ෂක-විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය) |
| 04 | 06.12.2024 | 03 | 03 | එස්.හේමන්ත විජිත කුමාර මහතා - සභාපති<br>ඒ. සිංහාල් මහතා - සාමාජික<br>ඒ.ජේ.එල්. විමලරත්න මහතා - සාමාජික<br>එන්.එච්.ඒ.ආර්.කේ. ගුණරත්න මහතා (නිරීක්ෂක-ජාතික විගණන කාර්යාලය)<br>ඩී.පී.එස්.ජේ. කුමාර මහතා (නිරීක්ෂක-විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය) |

## විගණන සහ කළමනාකරණ කමිටුවේ කාර්යභාරය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාවට නැගිය හැකි උපායමාර්ගික කරුණු හා සබැඳි තීරණ ගණනාවක් සහ නිර්දේශ කිහිපයක් විගණන සහ කළමනාකරණ කමිටුව විසින් ඉදිරිපත් කර ඇත.

- කළමනාකාරීත්වය සමග, විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරුන් සමග අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම.
- මූල්‍ය ප්‍රකාශනයන්හි විනිවිදභාවය, අවබෝධය සහ විශ්වාසනීයත්වය සහතික කිරීම මගින් මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම තහවුරු කිරීමට මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම.
- සිදු කරන ලද සහ සවිස්තරාත්මක විශ්ලේෂණය සහ අධ්‍යයනයන්වලින් අලාභය සඳහා හේතු සහ බලපෑම් හඳුනා ගැනීම

සහ වහාම අදාළ අංශයන්හි අලාභ මගහැරවීමට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීම හෝ නිර්දේශ කිරීම.

- වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන, සැලකිය යුතු විගණන සොයාගැනීම් සහ ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීම.
- විස්තීරණ සහ අඛණ්ඩ ලෙස අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහතික කිරීමෙන් පිළිගත හැකි මට්ටමට අවදානම අවම කිරීම.
- ශක්තිමත් සහ ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහිත පුළුල් කැපවීමක් ඇති සංවිධානයක් ඉහළ ස්ථරයෙහි නිර්මාණය කිරීම.
- නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම, ආචාර ධර්ම, විෂමාචාර හෝ වංචා විමර්ශනය සම්බන්ධ ආයතනික ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.
- පවත්නා තත්ත්වය, ප්‍රගතිය සහ නව ප්‍රවණතා මෙන් ම ගැටළු සහිත කරුණු සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමග අඛණ්ඩව සන්නිවේදනය කිරීම.

## ආයතනික කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටුවේ ප්‍රධාන නිර්දේශ.

- අභ්‍යන්තර සංවර්ධනයේ දීර්ඝ කාලීන ප්‍රමාදයන් සැලකිල්ලට ගනිමින්, කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම සහ වැඩිදියුණු කළ ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා නව වැටුප් පද්ධතියක් සංවර්ධනය කිරීමට බාහිර පාර්ශවයකට භාරදීම සුදුසු බව කමිටුව නිර්දේශ කළේය.
- සේවක වගවීම වැඩිදියුණු කිරීම, ඉහළ කාර්ය සාධනය හඳුනා ගැනීම සහ ප්‍රතිඵල මත පදනම් වූ ආයතනික සංස්කෘතියකට සහාය වීම සඳහා විධිමත් කාර්ය සාධන ඇගයීම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කමිටුව නිර්දේශ කළේය.
- ඛනිජ තෙල් කර්මාන්තයේ පරිණාමය වන ගතිකතාවයන් සැලකිල්ලට ගෙන, අදාළත්වය සහ සන්දර්භමය නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා ආයතනික සැලැස්ම සකස් කිරීම සඳහා අභ්‍යන්තර විශේෂඥතාව භාවිතා කිරීමට කමිටුව නිර්දේශ කළේය.
- අභ්‍යන්තර පාලන සහ තොරතුරු තාක්ෂණ පද්ධතිවල ශක්තිමත්භාවය ඇගයීමට පුළුල් පද්ධති විගණනයක් පැවැත්වීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගැනීමට කමිටුව නිර්දේශ කළේය.
- මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වටිනාකම් නිවැරදිව නිරූපණය කිරීම සහතික කිරීම සදහා තක්සේරු දෙපාර්තමේන්තුව හරහා ස්ථාවර වත්කම් නැවත තක්සේරුවක් ආරම්භ කිරීම පිළිබඳ මාර්ගෝපදේශ කමිටුව විසින් සපයන ලදී.
- අවදානම් කළමනාකරණයේ සහ තොරතුරු පාලනයේ වැදගත්කම හඳුනා ගනිමින්, කැපවූ අවදානම් නිලධාරියෙකු සහ ප්‍රධාන තොරතුරු නිලධාරියෙකු පත් කිරීමට කමිටුව නිර්දේශ කළේය.
- CCTV පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා කමිටුව මඟ පෙන්වීය.



**එස්. හේමන්ත විජිත කුමාර**
සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව

# මූල්‍ය වාර්තා



# විගණන වාර්තා

## ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ENR/C/CPSTL/AR/2024 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } // July 2025

සභාපති
ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික සහ නියාමන නිර්දේශ හා බැඳි විගණකාධිපතිවරයාගේ වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. තත්ත්වාගණනය කල මතය**

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ("සමාගම") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත, 2024 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධාන අනුව මාගේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2024 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

(අ) සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල පිරිවැය රුපියල් මිලියන 10,477ක් වූ අතර, ඊට අයිතම 26,267කින් සමන්විත දේපල, පිරියත සහ උපකරණ ඇතුළත් විය. මේවා LKAS 16 - දේපල, පිරියත සහ උපකරණ ප්‍රමිතියේ 51 වන ඡේදයට අනුව එහි අවශේෂ අගය සහ ප්‍රයෝජනවත් ආයුකාලය සමාලෝචනය නොකර සමාගම විසින් අඛණ්ඩව භාවිත කර තිබේ. එමෙන්ම, මෙම වත්කම් එම ප්‍රමිතියේ 79(ආ) ඡේදයට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොමැති අතර, මෙහිදී සමාගම විසින් 2003 වසරේ ආරම්භයේ සිට ඉඩම් සහ ගොඩනැගිලි හැර එහි වත්කම් නැවත තක්සේරු කර නොතිබුණි. එබැවින්, සමාලෝචනයට ලක් වූ වර්ෂය සඳහා ඉඩම් සහ ගොඩනැගිලි හැර අනෙකුත් ස්ථාවර වත්කම්වල සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු නොවන බව නිරීක්ෂණය විය.

(ආ) LKAS 16 - දේපල, පිරියත සහ උපකරණ ප්‍රමිතියේ 36 වන ඡේදයට අනුව, “දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් නැවත තක්සේරු කරන්නේ නම්, එම වත්කම අයත් වන දේපල, පිරියත සහ උපකරණවල සම්පූර්ණ පන්තියම නැවත තක්සේරු කළ යුතුය” යනුවෙන් සඳහන් වේ. කෙසේ වෙතත්, සමාගමට අයත් ගොඩනැගිලි 371න්, ගොඩනැගිලි 81ක් නැවත තක්සේරු කිරීමට සමාගම අපොහොසත් වී ඇති අතර, ඒවායේ පිරිවැය රුපියල් 246,985,014ක් හා මුළු ගොඩනැගිලි පිරිවැයෙන් 13% අගයකි. තවද, පවතින තොරතුරු අනුව නැවත තක්සේරු කළ ගොඩනැගිලි 147ක් ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.2.2. ගිණුම්කරණයේ දුර්වලතා

(අ) සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු

(i) සමාගමේ 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් (CPC) ලැබිය යුතු මුදල රුපියල් 8,100,420,819කි. කෙසේ වෙතත්, CPC විසින් තහවුරු කරන ලද ශේෂය රුපියල් 6,753,780,207ක් විය. ඒ අනුව, ශේෂයන් දෙක අතර රුපියල් 1,346,640,612ක වෙනසක් නිරීක්ෂණය විය. සමාගම විසින් වෙනස්කම් සමථයකට පත් කිරීම සඳහා සැසඳුම් වාර්තාවක් සකස් කර ඇති අතර එම වෙනස්කම් එකඟ කර ගැනීම සඳහා CPC සමඟ සාකච්ඡා කර ඇත. ඒ අනුව, සමාගම විසින් CPC සමඟ රුපියල් 24,000,000ක ශුද්ධ වෙනස්කම් සඳහා අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, වෙනස්කම් වලට තුඩු දෙන රුපියල් 777,413,155ක් වූ ගනුදෙනු වල දළ වටිනාකම, සමාගමේ මූල්‍ය වාර්තාවල 2024 දෙසැම්බර් 31 වන විට සටහන් කර නොතිබුණි. තවද, සැසඳුම් වාර්තාවේ රුපියල් 1,322,640,612ක වෙනසක් සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය වශයෙන් එකඟතාවයකට පැමිණි නොතිබුණි. එසේම, වසර 5 සිට 14 දක්වා හිඟව පවතින දීර්ඝකාලීන ශේෂයක් වන රුපියල් 719,393,334ක මුදලක් ද නිරීක්ෂණය විය.

(ii) 2024 වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලංකා ඉන්දියන් ඔයිල් සමාගමෙන් (LIOC) ලැබිය යුතු මුදල රුපියල් 1,163,874,058කි. කෙසේ වෙතත්, LIOC විසින් තහවුරු කරන ලද ශේෂය රුපියල් 356,002,161ක් විය. ඒ අනුව, ශේෂයන් දෙක අතර රුපියල් 807,871,897ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව, වෙනස්කම් හඳුනාගැනීම සඳහා සමාගම විසින් සැසඳුම් වාර්තාවක් සකස් කර තිබුණි. කෙසේ වෙතත්, තොග ප්‍රවාහන ගාස්තු LIOC විසින් වාර්තා නොකිරීමෙන් ඇති වූ රුපියල් 637,032,487ක වෙනස්කම් සම්බන්ධයෙන් LIOC සමඟ අන්‍යෝන්‍ය එකඟතාවකට පැමිණ නොතිබුණි. තවද, වසර 8කට වැඩි කාලයක් පුරා පියවා නොමැති රුපියල් 2,495,897ක දිගුකාලීන ලැබිය යුතු ශේෂයක් පැවතුණි.

(ආ) සමාගම විසින් ප්‍රාදේශීය මට්ටමේ ගබඩා පහසුකම් පවත්වාගෙන යාම සඳහා දිගුකාලීන කුලී පදනම මත දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පරිශ්‍ර 09 ක් භාවිතා කරන බවත්, එකඟ වූ පරිදි 2013 වසර දක්වා කුලී ගෙවීම් සිදු කර ඇති බවත් නිරීක්ෂණය විය. 2024 සැප්තැම්බර් 12 දිනැති දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරීවරයාගේ ලිපියට අනුව ගෙවිය යුතු හිඟ කුලිය රු. 111,108,874 කි. නමුත්, 2024 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු කුලිය ලෙස හඳුනාගෙන ඇති වටිනාකම රු. 99,876,792කි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු කුලිය ලෙස රු. 11,232,082ක් අඩුවෙන් හඳුනාගෙන තිබුණි. තවද, මෙම බදු ගිවිසුම් 2013 දෙසැම්බර් මාසයේදී කල් ඉකුත් වී ඇති බව නිරීක්ෂණය විය. දුම්රිය දෙපාර්තමේන්තුව විසින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නිවැරදි කුලී වටිනාකම තක්සේරු කිරීමෙන් පසුව ගිවිසුම් ඉදිරිපත් කර තිබුණද, තක්සේරු කල කුලී වටිනාකම සමඟ එකඟ නොවීම හේතුවෙන් සමාගම ගිවිසුමට අත්සන් කර නොතිබුණි.

**1.2.3 විගණනයේදී ලබා නොදුන් ලේඛනගත විගණන සාක්ෂි**

අ) රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.7 ඡේදයට අනුව, ස්ථාවර වත්කම් වාර්ෂික පදනමින් භෞතිකව සත්‍යාපනය කළ යුතුය. කෙසේ වෙතත්, සමගම විසින් 2003 වර්ෂයේ සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු වත්කම් භෞතිකව සත්‍යාපනය කර නොමැත. මේ හේතුවෙන් සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇති රු. 18,597,745,238 ක වටිනාකමකින් යුතු විශාල පරිමාණ වත්කම් සහිත ස්ථාවර වත්කම් පන්තිවල පැවැත්ම සහ තක්සේරුව සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) 2024 දෙසැම්බර් 31 වන විට, වර්ෂය තුළ ලාභයට එරෙහිව රු. 23,137,341 ක ව්‍යාපෘති 6කට අදාළව ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ ලියා හැර තිබුණි. මේ පිලිබඳ පරීක්ෂා කිරීමේදී, රු. 16,979,325 කට අදාල ඉන්වොයිසි සහ රු. 8,225,012 කට අදාල ඉංජිනේරු සහතික, විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. මෙයට අමතරව ඉහත කපා හැරීම සඳහා වූ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය විගණනයේදී අප හට ලබා ගත නොහැකි විය. එබැවින්, එම ලාභයට එරෙහිව ලියා හැරීම පිළිබඳ අධිකාරිය, නිරවද්‍යතාවය සහ වටිනාකම සත්‍යාපනය කිරීමට නොහැකි විය.

මා විසින් මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව සිදුකරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මගේ වගකීම්, විගණන වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරයාගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මා ලබාගෙන ඇති විගණන සාක්ෂි මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

### 1.3 සමාගමේ 2024 වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් කර ඇති අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරුවලට 2024 වාර්ෂික වාර්තාවේ අන්තර්ගත තොරතුරු ඇතුළත් වන නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ මගේ විගණන වාර්තාව එහි ඇතුළත් නොවේ. එය මෙම විගණන වාර්තාවේ දිනයෙන් පසුව මට ලැබෙන්නට සලස්වනු ඇත යැයි අපේක්ෂිතය. අනෙකුත් තොරතුරු සැපයීම කළමනාකරණයේ වගකීමකි. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය වෙනත් තොරතුරු ආවරණය නොකරන අතර මා ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික නිගමනයක් ඉදිරිපත් නොකරමි.

මූල්‍ය ප්‍රකාශනයට අදාලව විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු මට ලැබෙන්නට සැලැස්වූ විට ඒවා කියවා බැලීම හා එසේ කිරීමේදී, අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ප්‍රමාණාත්මක ලෙසින් නොගැලපෙනවාද යන්න හෝ විගණනයේදී ලබාගත් මාගේ දැනුම හෝ වෙනත් ආකාරයකින් ප්‍රමාණාත්මක වැරදි ලෙස ප්‍රකාශ කර ඇති බවක් පෙනෙන්නට තිබේද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, ඒවා නිවැරදි කිරීම සඳහා පත් කර ඇති පාර්ශවයන් හට ඒ බව මා දැනුම් දිය යුතුය. එයින් පසුවද නිවැරදි නොකරන ලද සාවද්‍ය ප්‍රකාශ තිබේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව පාර්ලිමේන්තුවට මා ඉදිරිපත් කරනු ඇති මාගේ වාර්තාවට ඒවා ඇතුලත් වනු ඇත.

### 1.4. මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීමට හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමයි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධිත පාර්ශව විසින් දරණු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙහි ලා විගණකවරයාගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්ථාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පදනම් වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීමේ ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

වෙනත් කරුණුද සමඟ, මාගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලන දුර්වලතා ඇතුලත්ව, විගණනයේදී සොයා ගනු ලබන සුවිශේෂී කරුණු පාලනයට සම්බන්ධ පාර්ශව වෙත සන්නිවේදනය කරන ලදී.

**2. අනෙකුත් නෛතික හා නියාමන නිර්දේශ මත වන වාර්තාව**

**2.1. පහත අවශ්‍යතා සඳහා 2018 අංක 19 දරණ ජාතික විගණන පනත, සහ 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.**

2.1.1. මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසෙහි විස්තර කර ඇති කරුණුවල බලපෑම් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීමේ මා ලබා ගත්තෙමි. මගේ නිරීක්ෂණයට පෙනෙන ආකාරයට, වර්ෂ 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ නිර්දේශවලට අනුව සමාගම් විසින් නිසි ගිණුම් වාර්තා තබා ඇත.

2.1.2. 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වැනි වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකසා ඇත.

2.1.3. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (d) (iii) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව පෙර වසරට අනුකූල වේ.

2.1.4. ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන වල 1.2.1 (අ.), 1.2.2 (අ.)(i) සහ 1.2.2 (අ.) (ii.) විගණන කරුණු හැර පසුගිය වර්ෂයේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් වේ. 2018 අංක 19 වන ජාතික විගණන පනතේ 6(1) (d) (iv) වගන්තියේ අවශ්‍යතාවයට අනුව මාගේ මතයෙහි පදනම වාර්තාවේ විස්තර කොට ඇත.

**2.2. ලබා ගත් ප්‍රමාණාත්මක කරුණු වලට සීමා වූ සාක්ෂි සහ අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි මත පදනම්ව.**

2.2.1. වර්ෂ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (d) වගන්තියේ නිර්දේශවලට අනුව ව්‍යාපාරයේ සාමාන්‍ය හේතුවෙන් බැහැර වන සමාගම විසින් ඇති කර ගත් ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් සමාගමේ පාලක මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර බැඳියාවක් ඇත යැයි සඳහන් කළ හැකි කිසිවක් මගේ අවධානයට ලක් වූයේ නැත.

2.2.2. පහත සඳහන් කරුණු හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (f) වගන්තියේ නිර්දේශ වලට අනුව සමාගමේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද ආදේශ වන ලිඛිත නීතිවලට අදාලව සාමාන්‍ය සහ විශේෂ උපදෙස් කිසිවක් සමාගම විසින් අනුගමනය කර නොමැත යැයි නිගමනය කළ හැකි කිසිවක් මගේ අවධානයට ලක් වූයේ නැත.

(අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය මගින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෙ ්පදේශවල 2.3 වගන්තිය. සමාලෝචනයට භාජනය වන වර්ෂය ආවරණය වන පරිදි සමාගමේ ක්‍රියාකාරී සැලැස්ම සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම, සමාගම විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, (මව් සමාගම) සහ මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3. සමාගම 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (g) වගන්තියේ අවශ්‍යතාවයට අනුව එහි බලතල, කාර්යයන් සහ රාජකාරි ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට.

2.2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (h) වගන්තියේ අවශ්‍යතාවයට අනුව අදාළ නීතිවලට අනුකූලව සහ කාල රාමු තුළ සමාගමේ සම්පත් ආර්ථික වශයෙන්, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව ප්‍රකාශ කිරීමට.

(අ) කොලොන්නාව පර්යන්තයේ ඉන්ධන ටැංකි 6ක් (15,000 $m^3$ කල ටැංකි 3ක්, 7,000 $m^3$ක ටැංකි 2ක්, සහ 5,000 $m^3$ක ටැංකියක්) ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2019 සැප්තැම්බර් 18 දිනැති අංක 19/2129/119/078/TBR දරණ කැබිනට් තීරණය යටතේ ඇමරිකානු ඩොලර් 12,680,000 කට M/S JPMA-GTPL සංගමයට ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන්, මෙම ටැංකි 6 ඉදිකිරීම සඳහා වන ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් සමාගම සහ කොන්ත්‍රාත්කරු 2025 මාර්තු 10 වන දින බේරුම්කරණ ගිවිසුමකට අත්සන් කළහ. බේරුම්කරණ ගිවිසුමේ නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය 2025 අප්‍රේල් 02 දිනැති අංක 25/0466/825/028 දරණ කැබිනට් තීරණය හරහා ලබා ගත් අතර, මෙම කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කිරීමෙන් පසු, කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් වලින් ඉවත් වී තිබුණි. සමාගමේ ගිණුම්වලට අනුව, 2024 දෙසැම්බර් 31 වන විට, ඔහුට ලබා දුන් රු. 435,389,607.51 ක අත්තිකාරම් ගෙවීමක් කෙරීගෙන යන වැඩ යටතේ සටහන් කර තිබුණි. මේ වන විට, ටැංකිවල අත්තිවාරම් කටයුතු පමණක් අවසන් කර තිබුණි. විගණන දිනය වන විට, ටැංකි සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉතිරි කොටස් සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන නොතිබුණි.

(ආ) සමාගම යුරෝ 44,911 ක වියදමින් තිම්බල් සහිත මෝරින් හෝස් 02 ක් ආනයනය කර ඇති අතර එය 2022 සහ 2023 දී සමාගමට භාර දී ඇත. තවද, සමාගමේ තෙල් පහසුකම් අංශයේ එළිමහන් ගබඩාවක අනාරක්ෂිත ලෙස ගබඩා කිරීම හේතුවෙන් රුපියල් මිලියන 13ක් වටිනා මෝරින් හෝස් එකක් භාවිතයට ගත නොහැකි ලෙස හානි වී ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, මෙම මෝරින් හෝස් ගබඩා කළ යුතු කොන්දේසි තහවුරු කර ගැනීම සමාගම සලකා බලා නොමැති බවත්, ගබඩා කිරීමේදී සිදුවන හානි වැළැක්වීමට ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බවත් නිරීක්ෂණය වේ. තවද, මෙම අයිතම අක්වෙරළ මෙහෙයුම්වලට අදාළ, වත්කම්වල ඉහළ වටිනාකමක් ඇති විවෘත අවකාශයේ ගබඩා කර ඇති නමුත් මෙම ඒකකය ආවරණය වන පරිදි මාර්ගගත, තොග අධීක්ෂණ පද්ධතියක් සමාගම ස්ථාපනය කර නොමැති බවත් නිරීක්ෂණය වී ඇත. 2025 මැයි 20 වන විට රුපියල් මිලියන 13 ක හානිය අයකර ගැනීමට හෝ මෙම ක්‍රියාවට එරෙහිව විනය පියවර ගැනීමට සමාගම විසින් කිසිදු පියවරක් ගෙන නොමැත.

## 2.3. අනෙකුත් කරුණු

(අ) 2007 ජනවාරි 05 වන දින ශ්‍රී ලංකා රජය හා ලංකා ඉන්දියන් ඔයිල් සමාගම අතර ගිවිසගත් බේරුම්කරණ ගිවිසුමේ 03 වන වගන්තියට අනුව, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම් සඳහා චීන වරාය පර්යන්තයේ සිට ඉන්ධන බෙදාහැරීම රටේ ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් 5% උපරිමයකට සීමාකර ඇති අතර, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ද සපුගස්කන්ද පිරිපහදුවේ සිට ඉන්ධන බෙදා හැරීම 5% ක උපරිමයකට සීමාකර ඇත. කෙසේ වුවද, ඉහත කොන්දේසිවලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා ක්‍රමවත් ක්‍රියාවලියක් නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගමට ප්‍රතිදාන ගාස්තු මත ආදායම අහිමි වීමේ හැකියාවක් ඇත.

(ආ) අභ්‍යන්තර විමර්ශන වාර්තාවකට අනුව, බෙදාහැරීමේ ක්‍රියාවලියේ වංචාවක් හඳුනා ගන්නා ලදී. ඒ අනුව, විකුණුම් සහ බෙදාහැරීමේ ක්‍රියාවලියේදී වෝහාරික විගණනයක් පැවැත්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේය. මේ සඳහා, සමාගම බදු ඇතුළුව රුපියල් 8,600,000ක උපදේශන ගාස්තුවක් සඳහා ගිණුම්කරණ සමාග මක් තෝරාගෙන තිබුණි. උපදේශන ගිවිසුමට අනුව, පැවරුම 2023 අගෝස්තු 31 වන දිනට අවසන් කළ යුතුය. කෙසේ වෙතත්, 2024 මැයි 06 වන දින උපදේශන සමාගම විසින් කෙටුම්පත් අතුරු වාර්තාව ලබා දෙන ලද අතර 2025 මැයි 05 දින වන අපගේ

විගණනය කරන ලද දිනය වන විටත් අවසන් වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. පැවරුමේ එකඟ වූ සන්ධිස්ථානවලට පටහැනිව, මෙම කාර්යය සඳහා එකඟ වූ කොන්ත්‍රාත් මුදලින් මණ්ඩලයේ අනුමැතිය මත පදනම්ව, සමාගම 2024 ජූලි 29 වන දින රු.5,836,691ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. අවසාන වාර්තාව ලබා ගැනීමට සමාගම පියවර ගෙන නොතිබුණි. තවද, ඉදිරිපත් කරන ලද නිර්දේශවල වලංගුභාවය තක්සේරු කිරීමෙන් අතුරු වාර්තාවේ අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සලකා බැලීමට සමාගම අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 83 වන වගන්තියට අනුව, කළමනාකාර අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කළ හැකිය. එබැවින්, සාංගමික ව්‍යවස්ථාවලියේ 83 වන ඡේදය මඟින් කළමනාකරණ අධ්‍යක්ෂවරයෙකු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම සම්බන්ධයෙන් ඇති විය හැකි පාලන ගැටළුවක් ඉස්මතු කරයි. විශේෂයෙන්, ඡේදයේ සඳහන් වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට නිශ්චිත කාලයක් සඳහා කළමනාකාර අධ්‍යක්ෂවරයෙකු හෝ ඒකාබද්ධ කළමනාකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස පුද්ගලයෙකු පත් කළ හැකි බවත්, මෙම පත්වීම ඕනෑම ගිවිසුමක නියමයන්ට යටත් වන බවත්ය. ප්‍රධාන විධායක නිලධාරියා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු යන දෙකම වන කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ මෙම ද්විත්ව භූමිකාව, බැඳියාව පිළිබඳ ගැටුමක් (Conflict of Interest) ඇති කරයි. මන්ද, කළමනාකරණ අධ්‍යක්ෂවරයා විසින් ඔවුන්ගේම කාර්ය සාධනය, වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ හෝ ඔවුන්ගේ සේවා ගිවිසුමේ වෙනත් නියමයන්ට සෘජුවම බලපාන තීරණවලට ඔවුන්ටම බලපෑම් කළ හැකි වීම නිසාය. ඊට අමතරව, මෙමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීනත්වයට බාධා ඇති කළ හැකි අතර, කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ කාර්ය සාධනය පක්ෂග්‍රාහී නොවී ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සහ ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩලයට අභියෝග කරයි.

**ජී.එච්.ඩී. ධර්මපාල**
විගණකාධිපති (වැ.බ.)

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

## 2024.12.31 දිනට

| වත්කම් | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 10 | 40,477,687,179 | 15,904,378,816 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 103,765,746 | 9,323,758 |
| වෙනත් මූල්‍ය වත්කම් | 14.1 | 1,479,620,703 | 1,333,567,815 |
| | | 42,061,073,628 | 17,247,270,389 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 12 | 870,657,190 | 886,038,842 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 13 | 11,145,281,753 | 10,087,520,325 |
| වෙනත් මූල්‍ය වත්කම් | 14.2 | 1,730,157,178 | 1,612,783,310 |
| ලැබිය යුතු ආදායම් බදු | | - | 280,560,047 |
| රක්ෂණ සංචිත අරමුදලේ ආයෝජනය | | 1,148,174,651 | 1,000,000,000 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 15 | 4,329,323,552 | 1,113,340,473 |
| | | 19,223,594,324 | 14,980,242,996 |
| **මුළු වත්කම්** | | 61,284,667,952 | 32,227,513,385 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 16 | 7,500,000,000 | 7,500,000,000 |
| ප්‍රාග්ධන සංචිතය | 16.1 | 979,000,000 | 979,000,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 16,868,080,909 | - |
| ස්වයං රක්ෂණ සංචිතය | | 2,651,405,099 | 2,500,000,000 |
| රඳවාගත් ඉපැයීම් | | 18,850,120,827 | 15,501,672,905 |
| **මුළු හිමිකම්** | | 46,848,606,835 | 26,480,672,905 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් | 17 | 1,906,978,095 | 1,918,901,303 |
| විලම්භිත බදු වගකීම් | 8.1 | 9,055,640,712 | 1,566,066,771 |
| | | 10,962,618,807 | 3,484,968,074 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 18 | 2,492,698,618 | 2,261,872,406 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 980,743,691 | - |
| **මුළු ජංගම වගකීම්** | | 3,473,442,309 | 2,261,872,406 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 61,284,667,952 | 32,227,513,385 |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූල වන බව මම සහතික කරමි.

**ඕ පී කග්ගොඩආරච්චි**
මූල්‍ය අංශයේ ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

**ආචාර්ය. මයුර නෙත්තිකුමාරගේ**
කළමනාකාර අධ්‍යක්ෂ

**ඩී. ජේ. ඒ. එස්. ද එස් රාජකරුණා**
සභාපති

පිටු අංක. 90 සිට 114 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසකි.

2024 පෙබරවාරි 24
කොළඹ

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

## 2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර

| | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| ආදායම | 3 | 18,898,875,688 | 10,150,031,584 |
| සෘජු වියදම් | | (9,562,225,548) | (6,846,378,434) |
| **දළ ලාභය** | | 9,336,650,140 | 3,303,653,150 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 4 | 1,015,248,890 | 1,180,257,199 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 4.1 | - | (7,734,143) |
| පරිපාලන වියදම් | | (5,687,556,959) | (5,097,503,828) |
| **මෙහෙයුම් ලාභය** | | 4,664,342,071 | (621,327,622) |
| මූල්‍ය ආදායම | 5 | 333,715,184 | 306,834,505 |
| **බදු පෙර ලාභය** | 6 | 4,998,057,255 | (314,493,117) |
| ආදායම් බදු වියදම් | 7.1 | (1,616,828,409) | 351,104,528 |
| **වසර සඳහා ලාභය** | | 3,381,228,846 | 36,611,411 |
| **පසුකාලීන කාලපරිච්ඡේදවල ලාභ අලාභ වලට නැවත වර්ගීකරණය නොකළ යුතු අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභය / අලාභය | 17 | 169,463,108 | (579,415,871) |
| ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය | | 24,097,258,442 | |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් සඳහා බද්ද | 8.1 | (7,280,016,464) | 173,824,761 |
| වර්ෂය සඳහා බදු අඩු කල පසු වෙනත් විස්තීර්ණ ආදායම | | 16,986,705,086 | (405,591,110) |
| **වර්ෂය සඳහා බදු අඩු කල පසු මුළු විස්තීර්ණ ආදායම** | | 20,367,933,932 | (368,979,699) |
| **කොටසකට ඉපැයීම්** | 9.2 | 4.51 | 0.05 |

පිටු අංක. 90 සිට 114 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසකි.

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

## 2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිතය | ස්වයං රක්ෂණ සංචිතය | රඳවාගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | | | 18,749,877,607 | 27,228,877,607 |
| වසර සඳහා ලාභය | | | | | 36,611,411 | 36,611,411 |
| අධිභාර බද්ද සඳහා ගැලපීම | | | | | (19,225,003) | (19,225,003) |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | | | | | (405,591,110) | (405,591,110) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | | | (388,204,702) | (388,204,702) |
| ගෙවූ ලාභාංශ | | | | | (360,000,000) | (360,000,000) |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරු කිරීම | | | | 2,500,000,000 | (2,500,000,000) | - |
| **2023 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | - | 2,500,000,000 | 15,501,672,905 | 26,480,672,905 |
| වසර සඳහා ලාභය | | | | | 3,381,228,846 | 3,381,228,846 |
| බදු අඩු කළ වෙනත් විස්තීර්ණ ආදායම | | | 16,868,080,909 | | 118,624,176 | 16,986,705,085 |
| සම්පූර්ණ විස්තීර්ණ ආදායම් | - | - | 16,868,080,909 | - | 3,499,853,022 | 20,367,933,931 |
| රක්ෂණ සංචිත අරමුදලෙ-න් ලැබෙන පොලී ආදායම | | | | 105,572,470 | (105,572,470) | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරු කිරීම | | | | 45,832,629 | (45,832,629) | - |
| **2024 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 16,868,080,909 | 2,651,405,099 | 18,850,120,827 | 46,848,606,835 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය
## 2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර

| | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ /(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහයන් | | | |
| ආදායම් බදු වියදමට පෙර ලාභය | | 4,998,057,255 | (314,493,117) |
| **ගැලපුම්** | | | |
| මූල්‍ය ආදායම | 5 | (333,715,184) | (306,834,505) |
| සේවක ණය හානිකරණය සඳහා දීමනාව | | 24,846,278 | (4,917,710) |
| තොග හානිකරණය සඳහා දීමනාව | | 2,805,711 | 1,593,413 |
| අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා හානිකරණය සඳහා දීමනාව | | 508,288,309 | 1,122,128 |
| දේපළ පිරියත සහ උපකරණ විකිණීමේ දී අලාභය/ලාභය | 4 | (26,974,090) | - |
| නිශ්චිත ප්‍රතිපාදන සැලසුම් සඳහා වෙන්කිරීම් | | 338,268,907 | 300,507,148 |
| ක්ෂයවීම් | 10.2 | 715,132,673 | 830,785,668 |
| වත්කම් ප්‍රත්‍යාගණන අලාභ | 11.2 | 83,862,857 | - |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 3,920,990 | 27,575,201 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)** | | 6,314,493,706 | 535,338,225 |
| තොග වැඩිවීම / (අඩුවීම) | | 12,575,941 | (25,108,794) |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම / (අඩුවීම) | | (1,566,049,737) | 508,799,347 |
| අනෙකුත් මූල්‍ය වත්කම්වල වැඩිවීම / (අඩුවීම) | | (288,273,034) | 175,136,576 |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් වැඩිවීම / (අඩුවීම) | | 253,963,552 | (612,572,035) |
| **මෙහෙයුම්වලින් ජනිත වූ/ (භාවිතා කරන ලද) මුදල්** | | 4,726,710,428 | 581,593,319 |
| ගෙවූ ආදායම් බදු | | (145,967,194) | - |
| ගෙවූ අධිභාර බදු | | - | (19,225,003) |
| ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ | 17 | (180,729,006) | (244,894,568) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද / (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහනයන්** | | 4,400,014,228 | 317,473,748 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | 10.1 | (1,298,182,793) | (157,077,004) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම | 11.1 | (98,362,978) | - |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබීම් | | 26,974,090 | - |
| රක්ෂණ සංචිත අරමුදලේ නැවත ආයෝජනය කිරීම | | (148,174,651) | (1,000,000,000) |
| මූල්‍ය ආදායම | 5 | 333,715,184 | 306,834,505 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ / (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (1,184,031,148) | (850,242,499) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| ගෙවන ලද ලාභාංශ | | - | (360,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ / (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | - | (360,000,000) |
| **මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | 3,215,983,080 | (892,768,751) |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 15 | 1,113,340,473 | 2,006,109,224 |
| **වසර අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | 15 | 4,329,323,553 | 1,113,340,473 |

පිටු අංක. 90 සිට 114 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අඩංගු කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1. පොදු

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2003 ඔක්තෝබර් 08 වන දින සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීම ඇති සමාගමක් වන අතර, සමාගම ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, කොලොන්නාව නිමාව යන ස්ථානයෙහිය.

### 1.2. මූලික කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ, සමාගමේ මූලික කටයුතු වූයේ ඛනිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීමයි.

### 1.3. මව් සමාගම සහ අවසාන පාලන පාර්ශවය

අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සමාගමෙහි අවසාන මව් සමාගම වන්නේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවයි.

### 1.4. නිකුත්කිරීම සඳහා බලය පවරන දිනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාව අනුව 2025 පෙබරවාරි 24 දින බලය පවරනු ලැබීය.

## 2. පිළියෙල කිරීමේ පදනම

### 2.1. අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs/ LKASs) වලට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත්කර ඇත.

#### 2.1.1. අගය කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ පහත අයිතමයන් හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත.

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වන වගකීම් ආයුගණක ක්‍රම අනුව තක්සේරුකර වර්තමාන අගයට හඳුනාගෙන ඇත.

#### 2.1.2. අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් සිදුකර ඇති අතර, දැකිය හැකි අනාගතය සඳහා ව්‍යාපාරය තුළ අඛණ්ඩව කටයුතු කිරීමට සම්පත් සමාගමට ඇති බවට ඔවුන් තෘප්තිමත්ය. එසේම අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව සම්බන්ධයෙන් යම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩලය දැනුවත්ව නොමැති අතර ඔවුන් ඈවර කිරීමට හෝ සමාගමේ මෙහෙයුම් කටයුතු නවතාලීමට අදහස් නොකරයි. එම නිසා මූල්‍ය ප්‍රකාශන දිගටම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරනු ඇත.

### 2.2. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලබන අතර එය සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන මුදල් වර්ගය වේ.

### 2.3. සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් නිසැක වශයෙන්ම ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇති අතර, ඒවා පසුගිය වර්ෂයේ දී භාවිතා කළ ඒවා සමග අනුරූප වේ. පසුගිය වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය විට නැවත සකස් කර ඇත.

### 2.4. වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තා කරන ලද ප්‍රමාණයට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකරණය විසින් සිදු කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අවශ්‍ය වේ. මෙම උපකල්පන හා ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාවන් වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම්වලට අනාගත කාලසීමාවන් තුළ බලපාන සැලකියයුතු ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇතිකිරීමට හේතු වනු ඇත.

ඇස්තමේන්තු හා උපකල්පනයන් අඛණ්ඩ පදනමක්

මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සිදුකරන වෙනස් කිරීම් ඇස්තමේන්තුවට වෙනස්කිරීම් සිදුකළ කාලසීමාවේදී සහ එය බලපාන අනාගත කාලවලදී හඳුනාගනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා ලද වටිනාකම් කෙරෙහි වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ දී, ඇස්තමේන්තු කිරීම, අවිනිශ්චිතතාවය සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ වඩා වැදගත් ක්ෂේත්‍ර පහත පරිදි වේ.

**(අ) සේවක ප්‍රතිලාභ වගකීම**

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් - පාරිතෝෂිකවල පිරිවැය මෙන්ම වර්තමාන අගය ආයුගණක මිණුම් ක්‍රම භාවිතා කරමින් නිශ්චය කරනු ලැබේ. වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ අනෙකුත් අදාල දත්තයන් ඇතුළත් වේ. සේවක ප්‍රතිලාභවල දීර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් එකී ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. එසේම තවදුරටත් උපකල්පනයන්ගේ විස්තරත් සමාගම ඉහත මූලික උපකල්පනයන් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ඒවායේ සංවේදීතාවය පිළිබඳව සිදුකරන ලද විශ්ලේෂණයක් සහ සංවේදීතා විශ්ලේෂණයේ ප්‍රතිඵල සටහන් 17.2 සහ 17.4 හි දක්වා ඇත.

**(ආ) වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය**

වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බවට විෂය මූලික සාක්ෂි පවතින්නේ ද යන්න මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට සමාගම විසින් තක්සේරු කරනු ලබයි. ලැබිය යුතු දෑ දැනට පවත්නා තත්ත්වය සහ ණය අයකර ගැනීම පිළිබඳ අතීත අත්දැකීම් පදනම් කරගෙන හානිකරන අලාභය ගණනය කරයි. එවැනි හානිකරණ සැබෑ සහ අපේක්ෂිත හානි පිළිබිඹු කිරීම සඳහා වරින් වර ගැලපීම් කරනු ලැබේ. සටහන 13 සහ 19 හි අනාවරණය කර ඇති පරිදි සමාගම 2024 වසර තුළ වෙළඳ සහ ලැබිය යුතු මුදල් හා සම්බන්ධ වෙනත් කිසිදු හානිකරණ හඳුනාගෙන නොමැත.

**(ඇ) ආදායම් බදු සහ විලම්භිත බදු**

සමාගම ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා වෙන් කිරීම තීරණය කිරීමේ දී සැලකිය යුතු විනිශ්චයන් අවශ්‍ය වේ. අවසාන බදු තීරණය අවිනිශ්චිත වන බොහෝ ගනුදෙනු සහ ගණනය කිරීම් ඇත. අතිරේක බදු ගෙවීමට සිදුවේද යන ඇස්තමේන්තුව මත පදනම්ව අපේක්ෂිත බදු ගැටළු මත ආයතනය බදු වගකීම් හඳුනාගනී. මෙම කරුණුවල අවසාන ප්‍රතිඵලය මුල් අවස්ථාවේ දී වාර්තාකල ගණන්වලින් වෙනස් වන විට, එවැනි වෙනස්කම් ජංගම මෙන්ම එවැනි තීරණයක් ගන්නා කාල පරිච්ඡේදයේ විලම්භිත බදු වත්කම් සහ වගකීම්වලට බලපායි. වැඩිදුර තොරතුරු සටහන් 07 සහ 08 හි හෙළිදරව් කර ඇත.

## 2.5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 2.5.1. විදේශ විනිමය පරිවර්තනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන අතර එය සමාගමේ ක්‍රියාත්මක සහ වාර්තා කිරීමේ ව්‍යවහාර මුදල වේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් සිදුවෙන ගනුදෙනු, ගනුදෙනුව සිදුවන දිනයේ පැවති අනුපාතයට ක්‍රියාත්මක මුදලින් මූලිකව වාර්තා කරයි. විදේශ ව්‍යවහාර මුදල්වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේ පවතින අනුපාතයට ක්‍රියාත්මක මුදලට පරිවර්තනය කෙරේ. සියලු වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් ඓතිහාසික පිරිවැයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් මූලික ගනුදෙනු දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදල්වලින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් සාධාරණ අගය තීරණය කල දිනයේ පැවති විනිමය අනුපාතය භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ.

### 2.5.2 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිශ්චිත විට සහ ආදායම විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විට ආදායම හඳුනාගත හැකිය. ලබාගත් හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගයෙන් වෙළෙඳ වට්ටම්, ආපසු එවුම්, ප්‍රතිදාන සහ විකුණුම් බදු (එකතු කළ අගය මත බදු) අඩු කොට ආදායම ගණනය කෙරෙයි.

සමාගම විසින් පාරිභෝගිකයෙකුට එවැනි සේවාවන් පැවරීම සඳහා හුවමාරු කර ගැනීමට සමාගම අපේක්ෂා කරන සලකා බැලීමේ ප්‍රමාණයෙන් පාරිභෝගිකයාට පොරොන්දු වූ සේවාවක් පැවරීමෙන් කාර්ය සාධන වගකීමක් තෘප්තිමත් කරන විට සමාගම ආදායම හඳුනා ගනී.

ආදායම් ප්‍රමාණය විශ්වාසනීයව මැනිය හැකිවිට, අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළ විශේෂිත නිර්ණායක සපුරා ඇතිවිට, සමාගම විසින් ආදායම හඳුනාගනී. එය අනාගතයේදී ලැබිය හැකි ආදායමේ ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට සමාගම ආදායම හඳුනා ගනී, අදාල සියලු අවිනිශ්චිතතාවයන් විසඳන තුරු, ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකි සේ නොසැලකෙයි.

**(අ) සේවාවන් සැපයීම**

සේවාවන් සැපයූ හෝ ඉටුකළ ගිණුම් කාලපරිච්ඡේදය තුළ සේවාවන් සැපයීමෙන් ජනිතවන ආදායම හඳුනාගනී.

*පර්යන්ත ගාස්තුව*

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා IOC සමාගම සහ මහා භාණ්ඩාගාරය අතර 2003 වර්ෂයේදී අත්සන් කරන ලද, පසුව 2011, 2019 සහ 2023 වර්ෂවලදී සංශෝධනය කරන ලද පොදු පරිශීලක ගිවිසුමට අනුව අලෙවිකරණ සමාගම්වලින් අයකර ගන්නා ලද මෙහෙයුම් වියදම් වලින් පර්යන්ත ගාස්තුව සමන්විත වන අතර එය ඔවුන් සතු ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිකරුවන්ට හෝ පාරිභෝගිකයින්ට පවරන අවස්ථාවේදී හඳුනාගනී. පර්යන්ත ගාස්තුව මනිනු ලබන්නේ අලෙවිකරුවන් සහ පාරිභෝගිකයින් වෙත විකුණනු ලබන ඛනිජ තෙල් නිෂ්පාදන ලීටරයකටය. අලෙවිකරණ සමාගම් වෙත නිකුත් කරන ලද ඉන්වොයිසි මත පදනම්ව සමාගම පිරිවැටුම මාසික පදනමින් වාර්තා කරයි.

*මෙහෙයුම් ආන්තිකය*

මිල සූත්‍රවල කලින් තීරණය කළ අනුපාතය මත පදනම්ව මෙහෙයුම් ආන්තිකය හඳුනා ගැනේ. මෙහෙයුම් ආන්තිකය මනිනු ලබන්නේ අලෙවිකරුවන් සහ පාරිභෝගිකයින් වෙත විකුණනු ලබන ඛනිජ තෙල් නිෂ්පාදන ලීටරයකට ය. අලෙවිකරණ සමාගම් වෙත නිකුත් කරන ලද ඉන්වොයිසි මත පදනම්ව සමාගම පිරිවැටුම මාසික පදනමින් වාර්තා කරයි.

*ප්‍රවාහන ආදායම*

දුම්රිය වැගන්, නළ මාර්ග සහ බවුසර් ගනුදෙනුකරුවන් වෙනුවෙන් දරණ ලද ප්‍රවාහන පිරිවැය අයකර ගැනීමයි. ලීටර පරිමාව සහ ගමන් කරන ලද දුර ප්‍රමාණය මත පදනම්ව ආදායම හඳුනාගනු ලැබේ. අලෙවිකරණ සමාගම් වෙත නිකුත් කරන ලද ඉන්වොයිසි මත පදනම්ව සමාගම පිරිවැටුම මාසික පදනමින් වාර්තා කරයි.

2022 නොවැම්බර් 24 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී, ඓතිහාසික SLAB ගාස්තු අයකර ගැනීම වෙනුවට CPC සහ LIOC සමග අත්සන් කරන ලද නව ගිවිසුමේ වගන්ති අංක 06 අනුව තොග ගබඩාවල ඉන්ධන අලෙවිය මත අන්තර්-පර්යන්ත ඉන්ධන තොග ප්‍රවාහන ගාස්තු 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අයකර ගැනීමට අනුමැතිය ලබා දෙන ලදී.

**(ආ) මූල්‍ය ආදායම**

ඵලදායි පොළී ක්‍රමය භාවිතා කරමින්, උපචිත පොළිය ලෙස මූල්‍ය ආදායම හඳුනාගනු ලැබේ.

**(ඇ) වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනී.

දේපළ, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් හටගන්නා ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ සහ අලාභ, විකිණීමෙන් ලද මුදල් වලින් වත්කම්වල ධාරණ අගය සහ ආශ්‍රිත විකිණීමේ වියදම් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශනයට ගණනය කර ඇත.

අහඹු කටයුතුවල සිට ප්‍රධාන ආදායම් උත්පාදන කටයුතු දක්වා සහ වැදගත් නොවන සමාන ගනුදෙනු සමූහයකින් හටගන්නා ලාභ සහ අලාභයන්, ශුද්ධ පදනම මත එකට එකතුකර වාර්තාකොට ඉදිරිපත් කරනු ලබයි.

### 2.5.3. වියදම් හඳුනාගැනීම

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ රාජ්‍යයක දේපළ පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේදී දරණ ලද සියලුම වියදම් කාලසීමාව සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සඳහා අය කර ඇත.

### 2.5.4. බදුකරණය

කාලපරිච්ඡේදය සඳහා වන බදු වියදම වර්තන සහ විලම්භිත බදුවලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම ස්කන්ධයට අදාලව හඳුනාගන්නා අයිතමයන් සම්බන්ධයෙන් හැරෙන්නට බදු කාලපරිච්ඡේදය සඳහා වන ලාභයට හඳුනාගනී. මෙහිදී බදු, පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම හා සෘජුවම ස්කන්ධයට ද හඳුනා ගැනේ.

**වත්මන් බදු**

වත්මන් සහ පෙර කාලපරිච්ඡේද සඳහා වත්මන් ආදායම් බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ බදු බලධාරීන්ගෙන් අයකර ගැනීම හෝ ගෙවනු ලබන අපේක්ෂිත මුදලින් ය. එම මුදල ගණනය කිරීම සඳහා භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති ඒවා වාර්තා කරන දිනය වන විට පනවනු බල පැවැත්වෙන බදු නීතීන්ය.

ආදායම් බදු ගණනය මූල්‍ය ප්‍රකාශයන්හි සඳහන් අදාල බදු නීතීන්හි, විධිවිධාන අනුව ප්‍රකාශ සහ ගණනය කර ඇත.

හිමිකම් සඳහා සෘජුවම පිළිගත් අයිතමවලට අදාල වත්මන් ආදායම් බද්ද හිමිකම් ප්‍රාග්ධනය හා ගැළපීම් කරන අතර එය විස්තීර්ණ ගැලපීම් නොකෙරේ.

**විලම්භිත බදු**

වත්කම් සහ වගකීම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරන පරමාර්ථ සඳහා වන ධාරණ අගයන් අතර, වාර්තාකරන දිනට පවතින තාවකාලික වෙනස මත, වගකීම් ක්‍රමය භාවිතා කරමින්, විලම්භිත බදු වෙන් කිරීම සිදුකරයි.

ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී, වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නා විලම්භිත ආදායම් බදු වගකීම් ඇතිවිට සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩුවලට බලනොපාන, තාවකාලික වෙනස්කම් ඇතිවිට හැර සියලුම බදු අයවන තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වගකීම් හඳුනාගනු ලබයි.

අඩුකල හැකි තාවකාලික වෙනස්කම්වලට අදාල විලම්භිත බදු වත්කම ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නේ නම් සහ ගනුදෙනුව සිදුවන කාලයේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩුවලට බල නොපාන්නේ නම්, අඩුකලහැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ භාවිතා කිරීම සඳහා බදු අයවන ලාභ ඇතිවීම සිදුවිය හැකි වන විට, සියලුම අඩුකල හැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබයි.

විලම්භිත ආදායම් බදු වත්කම්වල ධාරණ අගය එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරන අතර භාවිතා කළ යුතු විලම්භිත බදු වත්කම මුළුමනින්ම හෝ කොටසක් ඉඩදීම සඳහා ප්‍රමාණවත් බදු අයවන ලාභයක් පවතින බවට තවදුරටත් සම්භාවිතාවක් නොමැති විට විලම්භිත බදු වත්කම අඩුකල යුතුය.

වත්කම උපලබ්ධි වනවිට හෝ වගකීම පියවනවිට වාර්තා කරන දිනට ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණවත්ව නීතිගතකර ඇති බදු අනුපාතයන් (සහ බදු නීති) පදනම් කරගත් වර්ෂය සඳහා යොදාගන්නා බදු අනුපාතයන්ට අනුව විලම්භිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ.

**අධිභාර බදු**

**මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

තවද, 2022 අංක 14 දරණ අධිභාර බදු පනතෙන් පැනනඟින බදු වගකීම් යටතේ අනාවරණය කර ඇති පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද විකල්ප ප්‍රතිකාර ප්‍රකාශය (SoAT) මගින් නිර්දේශිත පරිදි ගිණුම්ගත කර ඇත.

**විකුණුම් බදු (එකතු කළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද)**

බදු අධිකාරීන්ගෙන් අයකරගත නොහැකි, වත්කම් හෝ සේවාවන් මිලදී ගැනීමේ දී දරණ ලද, අදාල පරිදි විකුණුම් බදු ඇතුළත් අගයට වත්කමේ පිරිවැයෙහි හෝ වියදම් අයිතමයෙහි කොටසක් ලෙස සහ ලැබිය යුතු සහ ගෙවිය යුතු ලෙස හඳුනාගන්නා විට හැර, අනෙකුත් විකුණුම් බදු අඩුකිරීමෙන් පසු ආදායම්, වියදම් සහ වත්කම් හඳුනාගනු ලබයි. බදු අධිකාරීන් වෙනුවෙන් ලැබිය යුතු සහ ගෙවිය යුතු විකුණුම් බදු ප්‍රමාණය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ලැබිය යුතු සහ ගෙවිය යුතු දෑ වල කොටසක් ලෙස ඇතුළත් කරයි.

### 2.5.5. මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම සහ පසුකාලීන අගය කිරීම

#### 2.5.5.1. මූල්‍ය වත්කම්

සමාගමේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

**මූලික හඳුනා ගැනීම සහ අගය කිරීම**

මූල්‍ය වත්කම්, මූලික හඳුනාගැනීමේදී, පසුව ක්‍රමක්ෂගත පිරිවැයෙන්, වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකම (FVOCI) සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVPL) ලෙස මනිනු ලැබේ. මූල්‍ය වත්කමක් (එය සැලකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව ලැබිය යුතු වෙළඳ ශේෂයක් නම්) හෝ මූල්‍ය වගකීම මුලින් මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමකින් සහ FVPL හි නොමැති අයිතමයක් සඳහා, එය අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයයි. සැලකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව ලැබිය යුතු වෙළඳ ශේෂයක් මූලිකව මනිනු ලබන්නේ ගනුදෙනු කළ මිලටය.

**පසුකාලීන අගය කිරීම**

පසුකාලීන මිනුම් සඳහා, මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ග කර ඇත;

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැයට (ණය උපකරණ)
- සමුච්චිත ලාභ සහ අලාභ (ණය උපකරණ) ප්‍රතිචක්‍රීකරණය සමග වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වත්කම්
- හඳුනාගැනීමෙන් පසු සමුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිචක්‍රීකරණය නොකර වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද මූල්‍ය වත්කම් (කොටස් උපකරණ)
- ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම්

කෙසේ වෙතත්, සමාගමේ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැය (ණය උපකරණ) සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම් යන කාණ්ඩවලට සීමා වේ.

*ණය සහ ලැබිය යුතු මුදල්*

ණය සහ ලැබිය යුතු මුදල් යනු සක්‍රීය වෙළෙඳ ලැයිස්තුගත නොකල ස්ථාවර හෝ තිරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික අගය කිරීමෙන් පසු එවැනි මූල්‍ය වත්කම් පසුකාලීනව සඵල පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට හානිකරණය අඩුකර අගය කරයි.

අත්පත්කර ගැනීම මත යම් වට්ටමක් හෝ අධිමිලක් සහ සඵල පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුළ ඇතුළත් කරයි. හානිකරණයෙන් ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයෙහි හඳුනා ගනී.

#### මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැයට (ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම් සමාගම විසින් මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ මනිනු ලැබේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීමේ අරමුණින් මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇත.

සහ

- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනයන්හිදී මුදල් ප්‍රවාහයන් ඉහළ නංවන අතර, එය මූලික ගෙවීම් හා ඉතිරිව ඇති මුදල සඳහා පොලියෙන් පමණක් සමන්විත වේ.

ක්‍රමක්ෂය කළ පිරිවැය මත මූල්‍ය වත්කම් පසුව ඵලදායි පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිතයෙන් මනිනු ලබන අතර ඒවා හානිකරණයට යටත් වේ. වත්කම් හඳුනා නොගත්, වෙනස් කරන ලද හෝ හානිකරණය වූ විට ලාභ හෝ අලාභ හඳුනා ගැනේ.

ණය සහ ලැබිය යුතු මුදල්, මුදල් සහ කෙටි කාලීන තැන්පතු ඇතුළත් සමාගමේ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැයට ඇතුළත් වේ.

#### මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය

සමාගම මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා සිය ව්‍යාපාර ආකෘතිය වෙනස් කරන විට පමණක් එහි මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරනු ලබයි. සමාගම ක්‍රමක්ෂය කළ පිරිවැයෙන්, වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකම (FVOCI) හෝ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVPL) ලෙස මනින ලද මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන්නේ නම්, සමාගම නැවත වර්ගීකරණය කළ දින සිට අනාගතයට බලපාන ලෙස අදාළ වේ. සමාගම විසින් කලින් හඳුනාගත් ලාභ, අලාභ (හානිකරණ ලාභ හෝ අලාභ ඇතුළුව) හෝ පොලී නැවත ප්‍රකාශ නොකරයි.

සමාගම විසින් මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය කළ පිරිවැය මිනුම් කාණ්ඩයෙන් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම මිනුම් කාණ්ඩය හරහා නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ වටිනාකම නැවත වර්ගීකරණ දිනට මනිනු ලැබේ. මූල්‍ය වත්කම්වල කලින් ක්‍රමක්ෂ කළ පිරිවැය සහ සාධාරණ වටිනාකම අතර වෙනසකින් පැන නගින ඕනෑම ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ වශයෙන් හඳුනා ගැනේ.

සමාගම විසින් මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂය කළ පිරිවැය මිනුම් කාණ්ඩයෙන් සහ වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම මිනුම් කාණ්ඩයෙන් සහ වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම මිනුම් කාණ්ඩයට නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ වටිනාකම නැවත වර්ගීකරණ දිනට මනිනු ලැබේ, කිසියම් ලාභයක් හෝ අලාභයක් මූල්‍ය වත්කම්වල කලින් ක්‍රමක්ෂය කළ පිරිවැය සහ සාධාරණ වටිනාකම අතර වෙනසක් හේතුවෙන් පැන නගින ලාභ හෝ අලාභ අනෙකුත් විස්තීරණ ආදායම ලෙස හඳුනා ගැනේ. නැවත වර්ගීකරණයේ ප්‍රතිඵලයක් ලෙස ඵලදායී පොලී අනුපාතිකය සහ අපේක්ෂිත බැර අලාභ ගැලපීම් නොකරයි.

#### ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් ඉවත් කරනු ලබන්නේ;

- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම කල් ඉකුත්ව ගොස් ඇති විට,
- සමාගම විසින් මුදල් ප්‍රවාහයන් ලැබීමට සමාගමට ඇති අයිතිය පවරා ඇති විට, හෝ මාරු කිරීම් වැඩ පිළිවෙලක් යටතේ ලබාගත් මුදල් ප්‍රවාහයන් මුළුමනින්ම සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයක් වෙත ගෙවීමට බැඳීමක් ඇතිකරගෙන ඇතිවිටක සහ

(අ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම් සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති විට,

හෝ

(ආ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම් සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැති වුව ද වත්කමෙහි පාලනය පවරා ඇති විට.

සමාගම වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීම සඳහා එහි අයිතිය පැවරූ විට හෝ සම්මත කර ගැනීමේ

විධිවිධානයකට ඇතුළත් වූ විට, එය හිමිකාරිත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ රඳවාගෙන තිබේද යන්න නැවත තක්සේරු කරයි.

වත්කම්වල සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පැවරීම හෝ රඳවා තබා ගැනීම හෝ වත්කම් පාලනය පැවරීම සිදු නොකළ විට, සමාගම එහි අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පැවරූ වත්කම දිගටම හඳුනා ගනී. එම අවස්ථාවේ දී, සමාගම රඳවාගෙන ඇති අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබිඹු කරන පදනම මත මනිනු ලබන සම්බන්ධිත වගකීමක් සමාගම හඳුනා ගනී.

පවරන ලද වත්කම මත ඇපයක ස්වරූපයක් ගන්නා අඛණ්ඩ මැදිහත්වීම එය වත්කමෙහි මුල් ධාරණ අගය සහ සමාගමට ආපසු ගෙවීමට අවශ්‍යවන, උපරිම මුදල් ප්‍රමාණය යන අගයන්ගෙන් වඩා අඩු අගයට මිණුම් කරයි.

**මූල්‍ය වත්කම් හානිකරණය**

මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක අගය හානිකරණය වී තිබේ ද යන්න පිළිඳව විෂය මූලික සාක්ෂි තිබේ ද යන්න, සමාගම සෑම වාර්තාකරන දිනකටම තක්සේරු කරයි. වත්කමෙහි මූලික හඳුනාගැනීමට පසුව සිදුව ඇති සිදුවීම් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයක් වශයෙන් (සිදුව ඇති අලාභ සිද්ධියක්) ඇතිවීමත්, එකී අලාභ සිද්ධිය සිදුවීම මගින් මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් සමූහයේ, විශ්වාසවන්තව මිනුම් කළහැකි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත බලපෑමක් ඇතිකරනවිට, හානිකරණය පිළිබඳ විෂයානුකූල සාක්ෂි ඇත්නම් පමණක් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක හානිකරණය සිදුවී ඇතැයි සලකනු ලබයි. ණයගැතියන් හෝ ණයගැතියන් සමූහයක් සැලකියයුතු මූල්‍ය දුෂ්කරතාවයන් අත් විඳිමින් සිටිනවිට, පොළිය හෝ මුල් මුදල නොගෙවීම, ගෙවීම පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට හෝ වෙනත් මූල්‍ය අසංවිධානාත්මක තාවයන්ට පත්වනු ඇතිවිට, සහ පැහැර හැරීම සමග සහසම්බන්ධවන හිඟවල හෝ ආර්ථික තත්ත්වයන්ගේ වෙනසක් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනියහැකි අඩුවීමක් නිරීක්ෂණ දත්ත මගින් පෙන්නුම් කරන අවස්ථා ඇගයීම් හානිකරණය වීම පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් කළ හැක.

අනෙකුත් වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා, සමාගම අපේක්ෂිත බැර අලාභ ගණනය කිරීමේදී සරල ප්‍රවේශයක් යොදා ගනී. එබැවින්, සමාගම ණය අවදානමේ වෙනස්කම් නිරීක්ෂණය නොකරයි, නමුත් ඒ වෙනුවට එක් එක් වාර්තා කරන දිනයන්හි පූර්ණ ජීව කාල අපේක්ෂිත බැර අලාභ මත පදනම්ව අලාභ දීමනාවක් හඳුනා ගනී. සමාගම තම නිශ්චිත ගනුදෙනුකරුවන් සමඟ එක් එක් සිද්ධි වලට අනුකූලව සිය ඓතිහාසික ණය අලාභ අත්දැකීම් මත පදනම් වූ ප්‍රතිපාදන න්‍යාසයක් ස්ථාපිත කර ඇති අතර එය ආර්ථික පරිසරයට ඉදිරි දැක්ම සඳහා සකස් කර ඇත.

### 2.5.5.2. මූල්‍ය වගකීම්

වෙළෙඳ කටයුතුවලින් ගෙවිය යුතු දෑ, ආශ්‍රිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු දෑ, බැංකු අයිරා සහ පොළී දරණ ණය සහ ණය ගැනීම් සමාගමේ මූල්‍ය වගකීම්වලට ඇතුළත් වේ.

**මූලික හඳුනා ගැනීම සහ අගය කිරීම**

SLFRS 09 විෂයපථය තුළ වූ මූල්‍ය වගකීම්, ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට මූල්‍ය වගකීම්, ණය සහ ණයට ගැනීම් සහ සුදුසු පරිදි ඵලදායි ඉදිරි රැකුමක් සඳහා යොමුකරන ලද ව්‍යුත්පන්නයන් වර්ග කෙරේ.

සමාගම මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය වගකීම් වර්ග කිරීම තීරණය කරයි. සියලු මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයට හඳුනාගන්නා අතර, ණය සහ ණයට ගැනීම් ක්‍රමක්ෂය පදනමට තබාගනී. ඍජුව ආරෝපනය වන ගනුදෙනු පිරිවැය මීට ඇතුලත් වේ. මූලික සාධාරණ අගය සහ නාමික අගය අතර යම් වෙනසක් ඇත්නම්, එය මෙහෙයුම් කල්බදු ආදායම් සංරචකයක් වශයෙන් ඇතුලත් කරන අතර, අදාල කාලසීමාව පුරාවට සරල මාර්ග ක්‍රමයට හඳුනාගනු ලබයි.

**පසුකාලීනව අගය කිරීම**

පහත සඳහන් පරිදි මූල්‍ය වගකීම් අගය කිරීම ඒවායේ වර්ගීකරණය මත රදා පවතී:

*(අ) ණය සහ ණය ගැනීම්*

මූලික හඳුනාගැනීමෙන් පසුව, පොළී දරණ ණය සහ ණය ගැනීම් සඵල පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමයකි. පිරිවැයට පසු කාලීනව මනිනු ලැබේ. සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රියාවලිය තුළ මෙන්ම වගකීම් ඉවත්කිරීම් සිදු කරනවිට ආදායම් ප්‍රකාශය තුළ ලාභ අලාභ හඳුනාගැනේ. අත්පත් කරගැනීමේ දී ඇති වූ යම් වට්ටමක් සහ අධිමිලක් සහ සඵල පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය තුළ ඇතුලත් කරයි.

**ඉවත් කිරීම**

වගකීම යටතේ ඇති බැදියාව මුදාහැර ඇති විට හෝ අවලංගුකර ඇතිවිට හෝ කල් ඉකුත්ව ඇතිවිට

මූල්‍ය වගකීමක් ඉවත් කෙරේ. සැලකිය යුතු ලෙස වෙනත් නියමයන් මත එම ණයහිමියාගෙන් හෝ පවතින වගකීමක නියමයන් සැලකිය යුතු ලෙස නවීකරණය කිරීමෙන් හෝ දැනට පවතින මූල්‍ය වගකීමක් වෙනසක් මගින් ප්‍රතිසම්පාදනය කලවිට, එවැනි හුවමාරුවක් හෝ නවීකරණයක් මුල් වගකීම ඉවත් කිරීමක් ලෙස සහ නව වගකීමක් හදුනා ගැනීමක් ලෙස සලකනු ලබන අතර අදාල ධාරණ අගයන්ගේ වෙනස ආදායම් ප්‍රකාශයේ හදුනාගනු ලැබේ.

**මූල්‍ය උපකරණ හිලව් කිරීම**

හඳුනාගත් වටිනාකම් පියවීමට දැනට බලාත්මක කළ හැකි නෛතික අයිතියක් පවතින විට සහ වත්කම උපලබ්ධි කර ගැනීම සහ වගකීම පියවීම ශුද්ධ පදනමක් මත එකවර පියවීමට අදහස් කරන විට මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වාර්තා කරනු ලබයි.

### 2.5.5.3. සාධාරණ අගය මැනීම

අගය කරන දිනයට වෙළෙඳපොල සහභාගිවන්නන් අතර නිසි ලෙස කරන ගනුදෙනුවකදී වත්කමක් විකිණීම සඳහා ලැබෙන මිල හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිල සාධාරණ අගය වේ. වත්කමක් විකිණීම හෝ වගකීම පැවරීමට වන ගනුදෙනුව

- වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළෙඳපොළ

හෝ

- ප්‍රධාන වෙළෙඳපොලක් නැතිවිට දී වත්කම හෝ වගකීම සඳහා වන වඩාත්ම වාසිදායක වෙළෙඳපොලේදී

ප්‍රධාන හෝ වාසිදායක වෙළෙඳපොල සමාගමට ඇතුලත් විය හැකි වෙළෙඳපොලක් විය යුතුය.

වෙළෙඳපොල සහභාගීවන්නන් තමන්ට ආර්ථික වශයෙන් වඩාත්ම වාසිදායක ලෙසට හැසිරේය යන්න උපකල්පනය කරමින් වත්කම හෝ වගකීම මිල කිරීමේ දී වෙළෙඳපොලට සහභාගීවන්නන් කරනු ලබන උපකල්පන මත පදනම්ව සාධාරණ අගය මනිනු ලැබේ.

ඉහළම හා හොඳම භාවිතය යොදාග නිමින් හෝ ඉහළම සහ හොඳම භාවිතය යොදාගනු ඇතැයි සැලකෙන වෙනත් වෙළෙඳපොලට සහභාගීවන්නෙකුට විකිණීමෙන් වෙළෙඳපොල සහභාගීවන්නෙකුට ඇති ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ හැකියාව මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේ දී සැලකිල්ලට ගනු ලැබේ.

ඇගයුම් කිරීමේ දී අදාල නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතය උපරිම කරමින් සහ නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් භාවිතය අවම කරමින් අවස්ථාවට යෝග්‍ය ශිල්පක්‍රම සමාගම යොදාගනී.

මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගය මනිනු ලැබූ හෝ හෙලිදරව් කරනු ලැබූ සියලුම වත්කම් හා වගකීම් සාධාරණ අගය මැනීමට සමස්තයක් වශයෙන් වැදගත් පහළම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, සාධාරණ අගය ධූරාවලිය තුළ පහත සඳහන් පරිදි වර්ග කරනු ලබයි.

**මට්ටම 1** - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොලෙහි ලැයිස්තුගත (නොගැලපූ) මිල ගණන්

**මට්ටම 2** - සාධාරණ අගය මැනීමට වැදගත් සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි පහළම මට්ටමේ යෙදවුම් සඳහා වන ඇගයීම් ක්‍රම

**මට්ටම 3** - සාධාරණ අගය මැනීමට වැදගත් සාධාරණ අගය හෙලිදරව් කිරීම සඳහා නිරීක්ෂණය කල නොහැකි පහළම මට්ටමේ යෙදවුම් ඉහත විස්තරකර ඇති ආකාරයට ස්වභාවය, ගුණාංග, වත්කම් හා වගකීම්වල අවධානම් සහ සාධාරණ අගය ධූරාවලියේ මට්ටම පදනම් කරගෙන සමාගම වත්කම් හා වගකීම් පන්තීන් තීරණය කර ඇත.

### 2.5.6. තොග

කල් පැන ගිය සහ සංසරණය අඩු අයිතමයන් සඳහා ප්‍රමාණවත් පරිදි වෙන්කිරීමක් කළ පසු, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට තොග ආගණනය කෙරේ. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ තොග සහ විකිණිය හැකි මිලක් නියම කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අත්‍යවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය අඩුකළ පසු ශුද්ධ උපලබ්ධි අගය වේ. තොග වර්තමාන තත්ත්වයට සහ ස්ථානයට ගෙන ඒමේ දී දරණ ලද පිරිවැය, සූත්‍රය භාවිතා කිරීමෙන් ගිණුම්ගත කරනු ලැබේ.

| | | |
|---|---|---|
| පාරිභෝජන ද්‍රව්‍ය, මෝටර් රථ අමතර කොටස් හා අළුත්වැඩියාව සඳහා පොදු භාණ්ඩ | - | බර තබන ලද සාමාන්‍ය මත පදනම්ව මිල දී ගැනීමේ පිරිවැයට |
| නිමි තොග | - | සත්‍ය ගැනුම් පිරිවැයට |

### 2.5.7. දේපළ පිරියත සහ උපකරණ

**පිරිවැය ආකෘතිය**

එදිනෙදා නඩත්තු කිරීමේ පිරිවැය හැර, පිරිවැයේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණය අඩුකළ පසු අගයට ඉඩම් සහ ගොඩනැගිලි හැර අනෙකුත්

දේපොළ, පිරියත සහ උපකරණ අයිතම දක්වා ඇත. හඳුනාගැනීමේ නිර්මාපකය සපුරාලන්නේ නම් දේපොළ, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිසම්පාදනය කිරීමේ පිරිවැය, දැරූවිට එවැනි පිරිවැයට ඇතුළත් වේ.

**ප්‍රත්‍යාගණන ආකෘතිය**

ඉඩම් සහ ගොඩනැගිලි අගය කරන්නේ එහි සාධාරණ වටිනාකමින්, ප්‍රත්‍යාගණන දිනයෙන් පසු ගොඩනැගිලි වල සමුච්චිත ක්ෂයවීම් සහ ප්‍රත්‍යාගණනය මත වන අලාභ අඩු කිරීමෙනි. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් නොවන බව සහතික කිරීම සඳහා තක්සේරු කිරීම් කාලානුරූපීව සිදු කරනු ලැබේ.

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ප්‍රත්‍යාගණනය අතිරික්තයක් ඇත්නම්, එය හිමිකම් යටතේ වන ප්‍රත්‍යාගණනය සංචිතයට බැර කරනු ලැබේ. එහෙත්, එම වත්කම කලින් ආදායම් ප්‍රකාශනයේ ප්‍රත්‍යාගණනය අලාභයක් ලෙස වාර්තා කර ඇත්නම්, එම ප්‍රමාණය තෙක් වැඩිවීම ආදායම් ප්‍රකාශනයෙන් හඳුනා ගනී. ප්‍රත්‍යාගණන හිඟයක් හෙවත් අලාභයක් ඇත්නම් එය ආදායම් ප්‍රකාශනයෙන් හඳුනා ගන්නා අතර එම වත්කම මීට පෙරාතුව ප්‍රත්‍යාගණන කොට ප්‍රත්‍යාග ණන අතිරික්තයක් හඳුනාගෙන තිබුනේ නම්, එම හිඟය අදාළ වත්කමේ පවතින අතිරික්තය දක්වා ප්‍රත්‍යාග ණනය සංචිතය මගින් පියවා ගනී.

වත්කමක් බැහැර කිරීමේදී, අලෙවි කරන විශේෂිත වත්කමට අදාළ ඕනෑම ප්‍රත්‍යාගණන සංචිතයක් රඳවාගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

**නොනිම් ප්‍රාග්ධනය**

වසර අවසානයට තව දුරටත් අසම්පූර්ණ තත්ත්වයේ පවතින, භාරගත් කාර්යයන් මත ගෙවන ලද, සියලුම අගයන් නිම නොවූ ප්‍රාග්ධන වැඩවලින් පෙන්නුම් කරයි.

අවිනිශ්චිත ජීව කාලයක් පවතින බවට සැලකෙන නිසාවෙන් ඉඩම් ක්ෂය නොකරයි. සෑම වත්කමකම පිරිවැය, එකී වත්කම්, භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත්වූ දින සිට ඇරඹෙන පරිදි වන ඒවායේ ඵලදායී ජීවිත කාලය ඒවායේ සුන්බුන් අගයට දක්වා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කරයි. වත්කම් විකිණීමේ දී වත්කම ඉවත්කරන දින සිට ක්ෂයවීම් අවසාන කරයි.

වත්කම්වල සුන්බුන් අගය, ඵලදායී ජීව කාලය සහ ක්ෂය ක්‍රමය සමාලෝචනය කොට යෝග්‍ය වන්නේ නම්, අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම ගලපනු ලබයි.

වත්කමක ධාරණ අගය එහි අපේක්ෂිත අයකරගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, වත්කමක ධාරණ අගය වහාම එහි අයකරගතහැකි අගය දක්වා කපා හරිනු ලබයි. විකිණීමෙන් ලද මුදල් ධාරණ අගය සමග සැසඳීමෙන් බැහැර කිරීම මත ලාභ අලාභ තීරණය කරනු ලබන අතර ඒවා ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලබයි.

**2.5.8. අස්පෘශ්‍ය වත්කම්**

(අ) ERP පද්ධති සහ ERP සඳහා බලපත්‍ර ගාස්තු

ආයතන සම්පත් සැළසුම්කරන (ERP) පද්ධතිය සහ ආයතන සම්පත් සැළසුම්කරන (ERP) බලපත්‍ර ගාස්තු මිලට ගත් මෘදුකාංග යෙදුම් සඳහා බලපත්‍ර ලබාගැනීමේ දී දරණ ලද පිරිවැය බලපත්‍ර ගාස්තු මගින් පෙන්නුම් කරයි. බලපත්‍ර ගාස්තු පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකොට ගෙන යයි. බලපත්‍රවල පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය වන වසර 5 පුරා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරයි.

**2.5.9. මුදල් හා මුදල් සමාන දෑ**

අතැති මුදල් ඉල්ලුම් තැන්පතු සහ පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් නොසැලකිය යුතු තරමේ අවදානමක් සහිත, ඉහළ ද්‍රවශීලතාවයන් ඇති කෙටිකාලීන ආයෝජන වශයෙන් මුදල් හා මුදල් සමාන දෑ අර්ථකථනය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා, මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල් සහ පියවිය යුතු බැංකු අයිරාව අඩුකල පසු ඉතිරිවන බැංකු තැන්පතුවලිනි. මාස තුනක් හෝ ඊට අඩු කල්පිරීම් සහිත ආයෝජන ද මුදල් හා මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

**2.5.10. මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

අවිනිශ්චිත ජීව කාලයක් සහිත වත්කම් ක්‍රමක්ෂය වීමට භාජනය නොකරන අතර, හානිකරණයවීම සම්බන්ධව පරීක්ෂා කරනු ලබයි. ධාරණ අගය අයකරගැනීමට නොහැකි වනු ඇති බවට සිදුවීම් හෝ අවස්ථාවන්ගේ වෙනස්කම් පෙන්නුම් කරන විට දී, ක්‍රමක්ෂය සඳහා භාජනය වන වත්කම් හානිකරණය සඳහා සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය ඉක්මවන ප්‍රමාණයට හානිකර අලාභය හඳුනාගනු ලැබේ. ආපසු අයකරගත හැකි අගය වන්නේ වත්කමේ සාධාරණ අගයෙන් එය විකිණීමට යන පිරිවැය අඩුකළ පසු ලැබෙන අගය සහ භාවිත අගය යන දෙකෙන් වඩා වැඩි අගයයි. හානිකරණය තක්සේරු කිරීමේ අරමුණ සඳහා, වෙන් වෙන්ව හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් (මුදල් ජනනය කරන ඒකක) ඇති පහළම මට්ටම් වලට

වත්කම් කාණ්ඩ කරනු ලැබේ.

#### 2.5.11. වෙන්කිරීම්

සමාගමට, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන බැඳීමක් (නීතිමය හෝ සම්ප්‍රයුක්ත) පවතින විට, මෙම බැඳීම් නිරාකරණය කිරීමට ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් ඇති විට සහ බැඳීමේ ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවලට සටහන් පිළිබඳව විශ්වාසදායක ලෙස ඇස්තමේන්තුවක් කළහැකි විටක, වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. වෙන්කිරීම මුළුමනින්ම හෝ කොටස් ප්‍රතිපූර්ණ කිරීමට සමාගම අපේක්ෂා කරනවිට, එම ප්‍රතිපූර්ණය සැබැවින්ම නිශ්චිත නම් පමණක්, එය අඩුකල පසු ලැබෙන අගයට ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ. මුදලේ කාල වටිනාකම සැලකිය යුතු වන්නේ නම්, වෙන්කිරීම් තීරණය කරනු ලබන්නේ, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් මුදලේ කාල වටිනාකම පිළිබඳ ප්‍රවර්තන වෙළෙඳපොල තක්සේරුකිරීම් සහ යෝග්‍ය විටදී වගකීමට විශේෂිත වන අවදානම පෙන්නුම් කරන බදු පෙර අනුපාතයට වට්ටම් කිරීමෙහි වට්ටම් කිරීම භාවිතා කරන විට, කාල පරාසය හේතුවෙන් වෙන්කිරීමෙහි සිදුවන ඉහළ වියදම් ලෙස හඳුනා ගැනේ.

## 2.6. සේවක ප්‍රතිලාභ

### (අ) නිශ්චිත ප්‍රතිලාභ බැඳීම - පාරිතෝෂිකය

'ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය' භාවිතා කරමින් සෑම මූල්‍ය වර්ෂයකදීම, ආයුගණකයකුගේ උපදෙස් අනුව සමාගම විසින් නිශ්චිත සැලසුමක් ලෙස සලකනු ලබන පාරිතෝෂික බැඳීම්වල පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගය ගිණුම් කරනු ලබයි. ආයුගණක ලාභ සහ අලාභ ඒවා හටගන්නා කාලසීමාව තුලදී වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලබයි. වගකීම මූල්‍යනය කරනු නොලැබේ.

*ආයුගණන ලාභ සහ අලාභ හඳුනාගැනීම*

ආයුගණන ලාභ සහ අලාභ ඒවා හටගන්නා වර්ෂය තුළදී වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලබයි.

### (ආ) නිශ්චිත දායක සැළසුම්

සමාගම නිශ්චිත දායක සැලසුමක් ද ක්‍රියාත්මක කරයි. නිශ්චිත දායක සැලසුම සඳහා ගෙවිය යුතු දායකය, සේවකයන් විසින් සමාගමට සැපයූ සේවයට සමානුපාතික වන අතර, 'කාර්යමණ්ඩල වියදම්' යටතේ වාර්තා කරයි. නොගෙවූ දායක මුදල් වගකීමක් ලෙස වාර්තා කරයි. සමාගම පහත සඳහන් යෝජනාක්‍රම සඳහා දායක වේ.

*සේවක අර්ථසාධක අරමුදල*

සමාගම හා සේවකයා විසින් දළ වැටුපෙන් (අතිකාල රහිතව) 15% සහ 10% බැගින් සේවක අර්ථසාධක අරමුදලට දායක වේ.

*සේවක නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල*

අරමුදල් මණ්ඩලය විසින් පවත්වාගෙන යන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවකයාගේ මාසික දළ වැටුපෙන් අතිකාල රහිතව 3% කින් සමාගම දායක වේ.

### (ඇ) වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

CPSTL සේවකයින් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් විසින් කළමනාකරණය කෙරේ. සමාගම විසින් රක්ෂණ සමාගමට ගෙවූ රක්ෂණ වාරිකය වසර තුළ වියදමක් ලෙස හඳුනා ගනී.

## 2.7. ස්වයං රක්ෂණ සංචිතය

2023 දෙසැම්බර් 06 දිනැති 02/241 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව රඳවාගත් ඉපැයීම් වලින් රු. බිලියන 2.5 ක් යොදවා ස්වයං රක්ෂණ සංචිතය ස්ථාපිත කරන ලදි. අරමුදලේ ස්වභාවය සහ පරමාර්ථය වනුයේ පවතින කිසිදු රක්ෂණ ඔප්පුවකින් ආවරණය නොවූ CPSTL දේපල සඳහා අනාගතයේදී සිදුවන විශාල අලාභයක හෝ හානියක (අනතුරක් හෝ ස්වාභාවික විපතක් හේතුවෙන්) ශුද්ධ පොත් වටිනාකම හිලව් කිරීමයි.

තවද, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව, මෙම අරමුදල පිහිට වූ වර්ෂයේ සිට රඳවා ගත් ඉපැයීම් වල ඇති වත්කම් ප්‍රත්‍යාගණන ලාභයෙන් 0.1% ක් ස්වයං රක්ෂණ සංචිත අරමුදලට මාරු කළ යුතුය.

## 2.8. ආයෝජන - රක්ෂණ සංචිත අරමුදල

2023 දෙසැම්බර් 06 දිනැති 02/241 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, දැනට පවතින කිසිදු රක්ෂණ ඔප්පුවක් යටතේ ආවරණය නොවන විශාල අලාභ හෝ හානිවීම් වලදී CPSTL දේපල නැවත මිලදී ගැනීම හෝ නැවත ගොඩ නැගීම සඳහා බාහිරව ආයෝජනය කරන ලද අරමුදල් ගොඩනැගීමේ අරමුණින් රු. බිලියන 1ක් ආයෝජනය කර ඇත. තවද, අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවට අනුව, මෙම ආයෝජන සඳහා වන පොලිය ප්‍රති-ආයෝජනය කළ යුතුය.

## 2.9. කොටස් හිමියන්ගේ ගිවිසුම කල් ඉකුත් වීම සහ කොටස් විකුණුම් මිලදී ගැනීමේ ගිවිසුම - පොදු පරිශීලක පහසුකම්

කොටස් හිමියන්ගේ ගිවිසුම සහ කොටස් විකිණීමේ මිලදී ගැනීමේ ගිවිසුම - ලංකා ඛනිජතෙල් සංස්ථාව, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සහ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන සමාගම් අතර පොදු පරිශීලක පහසුකම්, පසුගිය 2008 දෙසැම්බර් 31

වැනිදායින් අවසන් විය. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාව අතර ද්විපාර්ශ්වික ගිවිසුම 2022 දී අත්සන් කරන ලද අතර ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර ගිවිසුම අලුත් කිරීම අවසන් කර නොමැත. ආදායම් සහ වියදම් ගිවිසුමේ සඳහන් කර ඇති, ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇති අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලද කොන්දේසි සහ පසුකාලීන වෙනස්කම් සලකා බැලීමෙන් පසු මෙම මූල්‍ය ගිවිසුම කල් දැමූ ආදායම් බදු වගකීම්, කල් දැමූ ආදායම් බදු හැර බදු කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් මූල්‍ය අංශයේ සඳහන් වෙයි.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
## 2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර

| | | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **3.** | **ආදායම** | | |
| **3.1** | ප්‍රධාන ආදායම | | |
| | පර්යන්ත ආදායම | 11,811,422,012 | 7,426,004,892 |
